ත්‍රිපිටක ධර්මය - 1 ශ්‍රේණිය, මූලික පිරිවෙන
ගුරු මාර්ගෝපදේශය
2019/S/1/පිරි/TG/15-1/1,700

ISBN 978-955-25-0510-2
P01
2010412
TG PIRI: TRIPITAKA - GR 1
Rs. 195.00

# ත්‍රිපිටක ධර්මය

## ගුරු මාර්ගෝපදේශය

(2019 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ.)

## මූලික පිරිවෙණ

1
ශ්‍රේණිය

මුද්‍රණය සහ බෙදාහැරීම - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

# ත්‍රිපිටක ධර්මය

## මූලික පිරිවෙණ

## ගුරු මාර්ගෝපදේශය

# පළමුවන ශ්‍රේණිය

(2019 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ)

පිරිවෙන් ශාඛාව
අධ්‍යාපන අමාත්‍යාංශය
ශ්‍රී ලංකාව

පිරිවෙන් අධ්‍යාපන ඒකකය
සිංහල භාෂා දෙපාර්තමේන්තුව / භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය : **www.nie.lk**
විද්‍යුත් ලිපිනය : **info@nie.lk**

වෙබ් අඩවිය : **pirivena.sch.lk**
විද්‍යුත් ලිපිනය : **pirivena@moe.gov.lk**

මුද්‍රණය සහ බෙදාහැරීම - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

**ත්‍රිපිටක ධර්මය**
මූලික පිරිවෙණ
ගුරු මාර්ගෝපදේශය
පළමුවන ශ්‍රේණිය

ප්‍රථම මුද්‍රණය - 2019

© ජාතික අධ්‍යාපන ආයතනය

© පිරිවෙන් අධ්‍යාපන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය

ISBN 978 - 955 - 25 - 0510 - 2

පිරිවෙන් අධ්‍යාපන ශාඛාව
අධ්‍යාපන අමාත්‍යාංශය
ශ්‍රී ලංකාව
වෙබ් අඩවිය : pirivena.sch.lk
විද්‍යුත් ලිපිනය : pirivena@moe.gov.lk

පිරිවෙන් අධ්‍යාපන ඒකකය
සිංහල භාෂා දෙපාර්තමේන්තුව / භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව
වෙබ් අඩවිය : www.nie.lk
විද්‍යුත් ලිපිනය : info@nie.lk

මුද්‍රණය : රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

# ගරු අධ්‍යාපන අමාත්‍යතුමාගේ පණිවිඩය

**පිරිවෙන් තුළ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සවිබල ගන්වමු.**

අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් ශාඛාවේ මූලිකත්වයෙන් සහ ජාතික අධ්‍යාපන ආයතනයේ තාක්ෂණික සහයෝගයෙන් මූලික පිරිවෙන් 1-5 ශ්‍රේණි සඳහා ප්‍රථම වතාවට ගුරු මාර්ගෝපදේශ සකස් කිරීම සම්බන්ධව අධ්‍යාපන විෂය භාර අමාත්‍යවරයා වශයෙන් සතුටට පත් වෙමි.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියෙහි සඵලදායී බව උදෙසා පෙළපොත් සහ විෂය නිර්දේශ මෙන් ම ගුරු මාර්ගෝපදේශවලින් සැලසෙනුයේ ඉතා වැදගත් පිටුබලයකි. මෑතකාලීන ව මෙරට අධ්‍යාපන පද්ධතියෙහි ගුණාත්මක සංවර්ධනයක් ඇති කිරීම වෙනුවෙන් සංවර්ධන තීන්දු තීරණ රැසක් ක්‍රියාවට නංවා ඇති අතර, පිරිවෙන් අධ්‍යාපන ක්ෂේත්‍රය සංවර්ධනයට ද එහි දී විශේෂ අවධානය යොමු කර ඇති බව සතුටින් දන්වනු කැමැත්තෙමි.

ඒ අනුව ශ්‍රී ලංකාවේ පිරිවෙන් අධ්‍යාපනය සංවර්ධනය කිරීම වෙනුවෙන් ගෙන ඇති මෑතකාලීන ක්‍රියාමාර්ග අතරට එක් වන තවත් සුවිශේෂ පියවරක් ලෙස මෙම ගුරු මාර්ගෝපදේශ සකස් කිරීමේ වැඩපිළිවෙළ හැඳින්විය හැකි අතර, මූලික පිරිවෙන් අධ්‍යාපන විෂය නිර්දේශයට ඇතුළත් ව ඇති සියලු විෂයයන් ආවරණය කරමින් සකස් කර ඇති මෙම මාර්ගෝපදේශ පිරිවෙන් සිසුන්ගේ ඉගෙනුම් කාර්යසාධනය ඉහළ නංවාලීම වෙනුවෙන් සැබෑ මෙහෙවරක් වනු ඇති බව මගේ විශ්වාසයයි.

මෙම සද්කාර්යය වෙනුවෙන් දායක වූ අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් අධ්‍යක්ෂතුමා, නිලධාරීන් ප්‍රමුඛ සමස්ත කාර්ය මණ්ඩලයට ද ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්තුමිය ප්‍රමුඛ නිලධාරීන් ඇතුළු කාර්ය මණ්ඩලයට ද කෘතවේදී ස්තුතිය පිරිනමමි.

**අකිල විරාජ් කාරියවසම්**
අධ්‍යාපන අමාත්‍ය

## අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ පණිවිඩය

ශ්‍රී ලංකාවේ සම්භාව්‍ය අධ්‍යාපන සම්ප්‍රදාය සුරකිමින් ත්‍රිවිධ ශාසනයේ අභිවෘද්ධිය වෙනුවෙන් ථෙරවාදී භික්ෂු සමාජයේ මනා පැවැත්මට උරදිය හැකි ධර්මධර හා විනයධර භික්ෂු පිරිසක් හා ලාංකේය අනන්‍යතාව ආරක්ෂා කර ගනිමින් අනාගත අභියෝගයන්ට මුහුණ දිය හැකි ආධ්‍යාත්මික සංවර්ධනයකින් හෙබි පුරවැසියන් පිරිසක් බිහි කර ගැනීම පිරිවෙන් අධ්‍යාපනයෙන් අපේක්ෂිත ය. අනාගත ලෝක ප්‍රජාවේ යහපැවැත්ම සඳහා වූ ආදර්ශවත් පුරවැසියන් පිරිසක් බිහි කිරීමේ වගකීමෙන් මිදීමට අපට නොහැකි ය.

කාලීනව වෙනස් වන ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ තාක්ෂණික ක්‍රම ශිල්පයන් හා විවිධ කාර්යක්ෂම හා ඵලදායී ක්‍රමවේදයන් අනුගමනය කරමින් පිරිවෙන් ශිෂ්‍ය ප්‍රජාව බලාත්මක කළ යුතු ය. මානව හා භෞතික සම්පත් මනාව උපයෝජන කර ගැනීමටත් විෂය මාලාව හා පන්ති කාමර කළමනාකරණය ඇතුළු කළමනාකරණ ක්‍රියාවලිය වගකීමෙන් හා වගවීමෙන් යුක්ත ව හසුරුවාලීම ගුරු භූමිකාවට ආදර්ශයකි.

කාලීන අවශ්‍යතාවන්ට ගැළපෙන පරිදි විශ්වීය පුරවැසියෙකු නිර්මාණය කිරීමේ අභියෝයට ශක්තිමත් ව මුහුණ දීමට මෙම ගුරු මාර්ගෝපදේශ, ඔබට මහගු පිටිවහලක් වනු ඇත.

ශිෂ්‍ය ප්‍රජාවේ විවිධත්වය හඳුනා ගනිමින් වඩාත් උචිත ක්‍රම ශිල්ප යොදා ගනිමින් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ජාතික අධ්‍යාපනික අරමුණු, පරමාර්ථ හා සුවිශේෂ පිරිවෙන් අභිමතාර්ථ සාධනයට සියලු ම පිරිවෙන් ගුරු ප්‍රජාව කටයුතු කරනු ඇතැයි අපේක්ෂා කරමි.

**එම්. එන්. රණසිංහ**
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

# අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය

අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් ශාඛාව මගින් සම්පාදනය කර තිබූ විෂය නිර්දේශයේ අන්තර්ගතය සංශෝධනය කිරීමෙන් පසු අදාළ නිපුණතා සාක්ෂාත් වන පරිදි පාඩම් සැලසුම් කිරීම සඳහා ජාතික අධ්‍යාපන ආයතනයේ අභිනවයෙන් පිහිටුවන ලද පිරිවෙන් අධ්‍යාපන ඒකකය මගින් මෙම ගුරු මාර්ගෝපදේශය සම්පාදනය කර ඇත.

පාසල් පද්ධතියේ ක්‍රියාත්මක වන පරිදි ගුරු මාර්ගෝපදේශ, පිරිවෙන් ගුරුවරුන්ට ද ලබා දී ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය උසස් මට්ටමකට ගෙන ඒම සඳහා සැලසුම් කිරීම අධ්‍යාපන අමාත්‍යාංශය ගත් යහපත් තීරණයකි. ඒ වෙනුවෙන් අපගේ ස්තුතිය හිමි වන අතර ගුරු මාර්ගෝපදේශ සම්පාදනය කිරීම ජාතික අධ්‍යාපන ආයතනයට පැවරීමෙන් එම තීරණය යථාර්ථයක් බවට පත් විය.

සාම්ප්‍රදායික ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට පමණක් සීමා නොවී නව ඉගෙනුම් ඉගැන්වීම් ප්‍රවේශ පිළිබඳ ව යොමු වීමට මෙම ගුරු මාර්ගෝපදේශයේ අන්තර්ගත උපදෙස් පිරිවෙන් ගුරුවරුන්ට උපකාර වනු ඇත. ඒ අනුව නව ප්‍රවේශ හා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද පිළිබඳ ව ගවේෂණය කර තම පාඩම් සැලසුම් කර ගැනීමෙන් ඉහළ ගුණාත්මක ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියක නිරත වීමට හැකියාව ලැබේ.

මෙහි අන්තර්ගතය ප්‍රධාන වශයෙන් කොටස් දෙකකින් සමන්විත වේ. එනම් විෂය නිර්දේශය සහ එහි නිපුණතා හා නිපුණතා මට්ටම් සාක්ෂාත් කර ගැනීමට උපකාර වන ක්‍රියාකාරකම් සංග්‍රහය යි. එක් එක් නිපුණතාවට අදාළ නිපුණතා මට්ටම් ආවරණය වන ආකාරයට ඉගෙනුම් ඵල සාක්ෂාත් වන පරිදි වෙන් කර ඇති කාලය ද සැලකිල්ලට ගෙන ක්‍රියාකාරකම් සමූහය නිර්මාණය කර ඇත. තත් ක්‍රියාකාරකම් පදනම් කරගෙන නව ක්‍රියාකාරකම් නිර්මාණය කර ගැනීමට ද මෙමගින් අවකාශ ලැබෙනු ඇත.

ඉතා කෙටි කාලයකින් මූලික පිරිවෙන් විෂය මාලාවෙහි සියලු විෂයයන් සඳහා ගුරු මාර්ගෝපදේශ සකස් කිරීමට ශාස්ත්‍රීය නායකත්වය දුන් ජාතික අධ්‍යාපන ආයතනයේ පිරිවෙන් අධ්‍යාපන ඒකකයටත් ජාතික අධ්‍යාපන ආයතනයේ විෂය විශේෂඥයන්ට මෙන් ම බාහිර සම්පත් දායකයන්ටත් මාගේ ස්තුතිය පිරිනැමේ.

**ආචාර්ය ටී. ඒ. ආර්. ජේ. ගුණසේකර**
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය

# පෙරවදන

පිරිවෙන් ශ්‍රී ලාංකීය අධ්‍යාපනයේ කේන්ද්‍රස්ථානයකි. මිහිඳු මහ රහතන් වහන්සේ ශ්‍රී ලංකා ධරණීතලය තුළ ස්ථාපිත කළ උතුම් සම්බුද්ධ ශාසනය යුග යුග පසුකර නොයෙක් බාධා හමුවේ ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාව වෙත අවිච්ඡින්නව දායාද කරමින් ධර්මඥානයෙන් පිරිපුන් යතිවර පරපුරක් හා දැ හිතකාමී ජන සමාජයක් පිරිවෙන මගින් නිර්මාණය කිරීමට භික්ෂූන් වහන්සේලා සමත් වූහ.

අතීතයේ පටන් ම කාලීන අවශ්‍යතා සපුරාලමින් හා සාම්ප්‍රදායික අනන්‍යතාව ආරක්ෂාකර ගනිමින් ගිහි පැවිදි සමාජයේ අභිවෘද්ධිය වෙනුවෙන් පිරිවෙන මගින් සිදු වූ මෙහෙය අනුපමේය ය. සම්භාව්‍ය අධ්‍යාපනය ආරක්ෂාකර ගනිමින් පාරම්පරික ශාසනික ක්‍රමවේද හා නූතන අධ්‍යාපන රටා මනාව සම්මිශ්‍රණය කර වර්තමානයේ පිරිවෙන් අධ්‍යාපනය ලබන ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාගේ සහ ගිහි සිසුන්ගේ අවශ්‍යතා සැලකිල්ලට ගෙන අද වන විට නිපුණතා පාදකව නව විෂයමාලාවක් ඔස්සේ අවශ්‍ය දැනුම ලබාදීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් අධ්‍යාපන ශාඛාව දරන ප්‍රයත්නය අතිශයින් අගය කරමු. එයට ශක්තියක් වෙමින් සියලු ම විෂය සඳහා නව විෂය නිර්දේශ මුද්‍රණය කරවීම හා මූලික පිරිවෙන සඳහා පෙළපොත් 54ක් වාර්ෂික ව මුද්‍රණය කර ලබා දීම මගින් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව ද අවශ්‍ය පහසුකම් සලසා ඇත.

නිපුණතා පාදකව නව විෂය මාලාව සඳහා ගුරු මාර්ගෝපදේශ සැකසීම පිරිවෙන් අධ්‍යාපනය වෙනුවෙන් පළමු වරට සිදුවන උසස් ක්‍රියාදාමයකි. ජාතික අධ්‍යාපන ආයතනය හා පිරිවෙන් අධ්‍යාපන ශාඛාව එක්ව සම්පාදනය කළ මෙම ගුරු මාර්ගෝපදේශ, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව මගින් මුද්‍රණය කර ඔබ අතට පත් කිරීමට ලැබීම සතුටට කරුණකි. මෙම කාර්යය සඳහා දායකත්වය සැපයූ උපදේශක, සංස්කාරක, ලේඛක මණ්ඩල සාමාජික සියලු දෙනාට ද අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට ද මගේ ස්තුතිය පිරිනමමි. පිරිවෙන් අධ්‍යාපනයේ ඉදිරි දියුණුව ද පතමි.

**ඩබ්ලිව්. එම්. ජයන්ත වික්‍රමනායක**
අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
ඉසුරුපාය
බත්තරමුල්ල
2019.04.10

# නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය

නූතන ලාංකේය පිරිවෙන් ක්ෂේත්‍රයෙහි මෙම ගුරු මාර්ගෝපදේශ බිහිවීම ඓතිහාසික අවස්ථාවක් බව මම පළමු ව සඳහන් කරමි. ජාතික අධ්‍යාපන ආයතනයත්, අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් අංශයත් සුසංයෝග වී මෙම ගුරු මාර්ගෝපදේශ සම්පාදනය වීම ඊට හේතුවයි.

ශ්‍රී ලංකාවේ සාමාන්‍ය පාසල් අධ්‍යාපනය සඳහා විෂය නිර්දේශ, ගුරු මාර්ගෝපදේශ, ගුරු පුහුණු අධ්‍යාපන කළමනාකරුවන් පුහුණු කිරීම සහ අධ්‍යාපන පර්යේෂණ සිදු කිරීමේ ව්‍යවස්ථාපිත බලය ඇති එකම ආයතනය 1985 අංක 28 දරන පනතින් ස්ථාපිත වූ ජාතික අධ්‍යාපන ආයතනයයි. එහෙත් මේ වන විට වසර 2325ක ඉතිහාසයක් ඇති මහා විහාරයීය අධ්‍යාපන සම්ප්‍රදායේ කේන්ද්‍රස්ථානය වූ ‘පිරිවෙණ’ට ව්‍යවහාර වර්ෂ 2017 තෙක් ජාතික අධ්‍යාපන ආයතනයේ සෘජු දායකත්වයක් නොතිබුණි.

පිරිවෙන් අංශයක්/ දෙපාර්තමේන්තුවක් නොමැති ජාතික අධ්‍යාපන ආයතනයක් තිබිය හැකි දැයි නිතර අපව පෙළන ලද කරුණකි. මෙයට විසඳුමක් ලබා ගැනීම සඳහා අපට දායක වීමට හැකි වූයේ වර්තමාන අතිගරු ජනාධිපතිතුමන්, ගරු අධ්‍යාපන ඇමැතිතුමන් 2018 වර්ෂයේ කටයුතු කළ අධ්‍යාපන ලේකම්තුමන්, එවකට පිරිවෙන් අධ්‍යක්ෂ ස්වාමීන්ද්‍රයාණන්, ජාතික අධ්‍යාපන ආයතනයේ වර්තමාන අධ්‍යක්ෂ ජනරාල්තුමිය සහ ජාතික අධ්‍යාපන ආයතනයේ ආයතන සභාවේ පූර්ණ අනුග්‍රහය හා ආශීර්වාදය ලැබීමෙනි.

ඒ අනුව අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2017 ජනවාරි මස 31 දින රැස් වූ ජාතික බෞද්ධ බුද්ධි බල මණ්ඩලයේ තීරණය පරිදි සහ ජාතික අධ්‍යාපන ආයතන සභාවේ 2017.03.16 දිනැති 412.5.12 IM No. 5157 තීරණය පරිදි ජාතික අධ්‍යාපන ආයතනයේ භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයේ සිංහල භාෂා දෙපාර්තමේන්තුවට අයත් ව පිරිවෙන් ඒකකය ස්ථාපිත විය.

එහි ප්‍රතිඵලයක් ලෙස පිරිවෙන් ගුරු මාර්ගෝපදේශ, පිරිවෙන් ගුරු පුහුණුව සිදු කිරීමේ කාර්යයන්ට දායක වීමට ජාතික අධ්‍යාපන ආයතනයට සෘජුව හැකි විය. ජාතික අධ්‍යාපන ආයතනය සතු ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද පිළිබඳ පළපුරුදුතාව, පර්යේෂණ, අත්දැකීම්, තාක්ෂණික ප්‍රාගුණ්‍යය සුසංයෝග කරගනිමින් පිරිවෙන් පන්ති කාමරයෙහි අවදිමත් බවක් ඇති කිරීමට ලද මෙම අවස්ථාව මහාර්ඝ භාග්‍යයකි. අප්‍රමාණ සතුටකි.

පිරිවෙනෙහි ගුරු භවතුන් මෙම ගුරු මාර්ගෝපදේශ පරිශීලනයෙන් පිරිවෙන් පන්ති කාමරය ශිෂ්‍ය මිත්‍රභාවයෙන් ප්‍රබෝධාත්මකව ඉහළ සාධනයකට පිරිවෙන් අධ්‍යාපනය නංවාලීමට කටයුතු කරන ලෙස ගෞරවයෙන් ආයාචනා කරමි. මෙම ගුරු මාර්ගෝපදේශ සම්පාදනයට දායක වූ ජාතික අධ්‍යාපන ආයතනයේ සිංහල භාෂා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ, පිරිවෙන් ඒකක ප්‍රධාන සහ සියලු විද්වතුනට ගෞරවය පිරිනමමි.

**ආචාර්ය පූජ්‍ය මාඹුල්ගොඩ සුමනරතන හිමි**
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය

## පිරිවෙන් අධ්‍යාපන අධ්‍යක්ෂගේ පණිවිඩය

මහින්දාගමනයෙන් පසු ලක්දිව ශාසන ප්‍රතිෂ්ඨාපන කාර්යයේ දී, මහා අරිට්ඨ තෙරුන් විසින් මහා මහින්ද මහරහතන් වහන්සේ මුලසුන තබා ථූපාරාම විහාරයේ ධර්ම මණ්ඩපයේ දී, මත්තාභය තෙරුන් ප්‍රමුඛ පන්සියයක් දෙනා වහන්සේට විනය ඉගැන්වීමේ රාජ්‍ය මහෝත්සවයෙන් ලක්දිව පාරිවේණික අධ්‍යාපනය ආරම්භ කෙරිණ. එවක් පටන් විවිධ අවධීන්හි උන්නතියට හා අවනතියට ලක්වෙමින් ලක්වැසි ගිහි පැවිදි සුවහස් සංඛ්‍යාත ප්‍රජාවට පිරිවෙන් අධ්‍යාපනයෙන් වූ සේවාව මහාර්ඝ ය. පිරිවෙණ මගින් සාරධර්ම අධ්‍යාපනය කේන්ද්‍ර කරගත් සමයාන්තර ඥාණයත් සම්භාව්‍ය හා නූතන භාෂාවනුත් ශිල්ප කලා ඥාණයත් ජ්‍යොතිර්විද්‍යා, වාස්තුවිද්‍යා ඥාණයත් ආදි ඥාන සම්භාරයත් කාලීන අධ්‍යාපනය අනුව පුද්ගල පෞරුෂයට අවශ්‍ය සියලු සාධකයනුත් සම්පාදනය කෙරේ.

21 වන සියවසේ අධ්‍යාපන ක්ෂේත්‍රය නිපුණතා පාදක ක්‍රමයට නැඹුරු විය. පිරිවෙන් අධ්‍යාපනයට නිපුණතා පාදක අධ්‍යාපන ක්‍රමය ආගන්තුක නොවුන ද, පිළිගත් ක්‍රම ශිල්ප ඔස්සේ පිරිවෙනට අවශ්‍ය විෂය නිර්දේශ හා පෙළපොත් සම්පාදනය කෙරිණ. එමගින් ශිෂ්‍ය නිපුණතා මට්ටම අනුක්‍රමයෙන් වර්ධනය වන ශිෂ්‍ය මිතුරු පාඨමාලාවක් පිරිවෙන්වලට ඉදිරිපත් කෙරිණි.

ගුරුභවතුන්ට අවශ්‍ය පාඩම් සැලසුම් කිරීම, මිනුම් ඇගයුම් ක්‍රම හා තක්සේරුකරණය සඳහා අවශ්‍ය ගුරු මාර්ගෝපදේශ සම්පාදනය කරදීම පිරිවෙන් අධ්‍යාපන ඉතිහාසයේ පළමු වරට සිදු කරන්නට ලැබීම පිළිබඳ ව අනතිමානී ආනන්දයක් ලබමි. පන්ති කාමරය තුළ වඩාත් ඵලදායී ගුරුවරයකු වීමට ගුරු මාර්ගෝපදේශයේ එන උපදෙස් ගුණාත්මක යෙදවුම් හා ක්‍රියාකාරකම් යොදා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. පාරිවේණික ගිහි පැවිදි සිසුන්ට අවශ්‍ය මනා ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කර ගැනීමට ඔබට මේ ගුරු මාර්ගෝපදේශය මහෝපකාරී වනු ඇතැයි සිතමි.

මේ මහඟු කාර්යය යථාර්ථයක් බවට පත් කිරීමේ දී සහාය වූ ජාතික අධ්‍යාපන ආයතනයේ කාර්ය මණ්ඩලයටත් පිරිවෙන් අධ්‍යාපන ශාඛාවේ කාර්ය මණ්ඩලයටත් උපදේශකත්වය සම්බන්ධීකරණය විෂය නියාමනය හා විවිධ අයුරින් සම්පත්දායකත්වය සැපයූ සියලු පාර්ශ්වයන්ටත් මාගේ කෘතඥතාව පිරිනමමි.

**විජිත වෙලගෙදර**
අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන්)
අධ්‍යාපන අමාත්‍යාංශය

# විෂයමාලා කමිටුව හා ගුරු මාර්ගෝපදේශ සම්පාදක මණ්ඩලය

**උපදේශකත්වය හා අනුමැතිය :**

ජාතික අධ්‍යාපන ආයතනය සහ පිරිවෙන් අධ්‍යාපන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය

**මෙහෙයවීම :**

**ආචාර්ය ටී.ඒ.ආර්.ජේ. ගුණසේකර**
අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අධ්‍යාපන ආයතනය.

**විජිත වෙලගෙදර**
අධ්‍යක්ෂ, පිරිවෙන් ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය.

**අධීක්ෂණය :**

**ආචාර්ය, පූජ්‍ය මාඹුල්ගොඩ සුමනරතන හිමි**
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්,
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය, ජාතික අධ්‍යාපන ආයතනය.

**සම්බන්ධීකරණය :**

**පූජ්‍ය කුකුරම්පොල ඤාණවිමල හිමි**
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,
ඒකක ප්‍රධාන, පිරිවෙන් අධ්‍යාපන ඒකකය, ජාතික අධ්‍යාපන ආයතනය.

**පූජ්‍ය කෙහෙල්වල විපස්සි හිමි**
සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ,
පිරිවෙන් ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය.

**විෂය නියාමනය :**

**පූජ්‍ය උඩුගම සුදස්සී හිමි**
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, දෙපාර්තමේන්තු ප්‍රධාන,
ආගම් හා සාරධර්ම අධ්‍යාපන දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය.

**පූජ්‍ය රත්මලවිට චන්දානන්ද හිමි**
සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (ත්‍රිපිටක ධර්මය),
පිරිවෙන් ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය.

**විෂය විශේෂඥ උපදේශනය :**

**පූජ්‍ය වැලිවිට සෝරත හිමි**
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,
ප්‍රායෝගික බෞද්ධ අධ්‍යයන අංශ ප්‍රධාන,
ශ්‍රී ලංකා භික්ෂු විද්‍යාලය, පුත්තලම පාර, අනුරාධපුරය.

**ලේඛක මණ්ඩලය :**

**පූජ්‍ය උඩුගම සුදස්සි හිමි**
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,
දෙපාර්තමේන්තු ප්‍රධාන,
ආගම් හා සාරධර්ම අධ්‍යාපන දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය.

**එච්.එම්. සෙනෙවිරත්න**
ශ්‍රී ලංකා ගුරු සේවය I
බුද්ධජයන්ති මධ්‍ය මහා විද්‍යාලය, බලංගොඩ.

**ජී.ආර්.එම්.ඒ. ගම්ලත්**
කථිකාචාර්ය
ආගම් හා සාරධර්ම අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතන, මහරගම.

**පූජ්‍ය ගල්කිස්සේ ධම්මිස්සර හිමි**
ගුරු උපදේශක (කොළඹ)
කො/වංගීස මූලික පිරිවෙණ, කලපලුවාව, මුල්ලේරියාව.

**පූජ්‍ය පළමුගෙදර සුමනවංශ හිමි**
ගුරු උපදේශක (ගම්පහ)
ගම්/ජාත්‍යන්තර භික්ෂු අභ්‍යාස ආයතන මහ පිරිවෙන, සාම විහාරය, ගම්පහ.

**එම්.ඩබ්.ඩී. හර්ෂණී**
සහාය කථිකාචාර්ය
පාලි හා බෞද්ධ අධ්‍යයන අංශය
ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ගංගොඩවිල, නුගේගොඩ.

**එල්.එන්.ඒ. වීරසිංහ**
ගුරු උපදේශක
කලාප අධ්‍යාපන කාර්යාලය, පිළියන්දල.

**භාෂා සංස්කරණය :**

**වීරසිරි සොයිසා**
විශ්‍රාමික පරිවේණාචාර්ය
නොː 157/සී/34, රාජසිංහ මාවත, ඉහළ ඉඹුල්ගොඩ.

**පරිගණකගත කිරීම සහ පිටු නිර්මාණය :**

**ක්‍රිෂ්නි සමුද්දිකා නවරත්නගේ**
පරිගණක අංශය
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

**විවිධ සහය :**

**පී. ජී. බුද්ධිකා කරුණාරත්න**
කළමනාකරණ සේවා නිළධාරී
අධ්‍යාපන අමාත්‍යාංශය.

## ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස්

පර්යාප්ති, ප්‍රතිපත්ති, ප්‍රතිවේධ යන ත්‍රිවිධ ශාසනයේ උන්නතිය වෙනුවෙන් ප්‍රතිබල සම්පන්න භික්ෂු පරපුරක් නිර්මාණය කිරීම ජාතික පිරිවෙන් අධ්‍යාපනයේ ප්‍රමුඛ පරමාර්ථයයි. ශාක්‍යමුනීන්ද්‍ර ගෞතම බුදුරජාණන් වහන්සේ මෙලොවට දායාද කළ නෛර්‍යාණික ශ්‍රී සද්ධර්මය ආධ්‍යාත්මය සුවපත් කරලීම උදෙසා පවත්වාගෙන යාමේ මූලිකත්වය ගත් භික්ෂූන් වහන්සේගේ අධ්‍යාපනය උදෙසා වර්තමාන පිරිවෙන් අධ්‍යාපනය ප්‍රබල දායකත්වයක් සපයයි.

පිරිවෙන් අධ්‍යාපනය වඩාත් ඵලදායී හා ගුණාත්මක අර්ථ පූර්ණ භාවයට පත් කරලීම උදෙසා වර්තමාන අධ්‍යාපන ප්‍රවාහය තුළ ක්‍රියාත්මක නිපුණතා පාදක අධ්‍යාපන ක්‍රමය හඳුන්වා දී ඇත. ඒ ඔස්සේ විෂය මාලා ප්‍රතිසංස්කරණය සිදු කර පරිවේණාචාර්යවරුන්ට අවශ්‍ය පහසුකම් සලසා දීමට ක්‍රියාකර ඇත. ඒ අනුව විෂය නිර්දේශය පෙළපොත සම්පාදනයෙන් අනතුරුව ගුරු මාර්ගෝපදේශය සකස් වන්නේ ඵලදායී බව තවත් වැඩිකර ගැනීමේ අරමුණ පෙරදැරි කොට ගෙනයි.

ජාතික පිරිවෙන් අධ්‍යාපනයේ ප්‍රධානතම විෂය ධාරාව වන්නේ ත්‍රිපිටක ධර්මයයි. ත්‍රිපිටකය අධ්‍යාපනයෙන් තොරව භික්ෂු අධ්‍යාපනය සාර්ථකත්වය කරා පියමැනිය නොහැක. සූත්‍ර, විනය, අභිධර්මය පිළිබඳ ප්‍රාමාණික දැනුමක් වර්තමාන භික්ෂූන් වහන්සේ ලබා ගැනීම යුගයේ අවශ්‍යතාවක් ද වෙයි. සම්බුද්ධ ශාසනය විෂයෙහි එල්ලවන නොයෙක් අභියෝග ජය ගැනීමට ඇති එක ම විසඳුම වන්නේ භික්ෂූන් වහන්සේ ප්‍රතිබල සම්පන්න වීමයි.

ත්‍රිපිටක ධර්මය විෂය භාර ගුරු භවතා දැඩි වගකීමෙන් යුතු ව ක්‍රියා කරන්නේ නම් යථෝක්ත අරමුණු සාක්ෂාත් කර ගැනීම ඉතා පහසු ය. සාම්ප්‍රදායික අධ්‍යාපන ක්‍රම මෙන් ම නූතන අධ්‍යාපන ක්‍රමයන් ද සම්මිශ්‍රණය කර ගනිමින් අපේක්ෂිත ඉලක්ක කරා ශිෂ්‍ය ප්‍රජාව මෙහෙයවීම ඔවුන්ගේ වගකීමක් බව ද අවධාරණය කරමි.

ලොව පහළ වූ ශ්‍රේෂ්ඨතම ශාස්තෘවරයාණන් වහන්සේ ලොව්තුරා බුදුරජාණන් වහන්සේ ය. උන්වහන්සේගේ ඉගැන්වීම් ක්‍රම සරල ය. ප්‍රායෝගික ය. අවස්ථාවෝචිත ය. තමන් වහන්සේ හමුවට පැමිණෙන තැනැත්තාගේ මානසික ස්වභාවය හඳුනාගෙන ඊට අවශ්‍ය මාර්ගෝපදේශ සලස්වා දීමට බුදුරජාණන් වහන්සේ ක්‍රියාකළ අන්දම සූත්‍ර දේශනාවන් පරිශීලනය කරන විට මෙන් ම සම්බුද්ධ චරිතය හදාරන විට අපට මැනවින් පසක් වේ.

නූතන ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනය තුළින් ද ගුරුවරයා ශිෂ්‍යයාට මාර්ගෝපදේශකයකු ලෙස ඉගෙනුම් අවස්ථා හා පරිසර නිර්මාණය කරදීමට දක්ෂයකු විය යුතු බව අවධාරණය කර ඇත. ත්‍රිපිටක ධර්මය විෂය, විෂය දැනුමින් එහා ගිය පුද්ගල ආධ්‍යාත්මය සංවර්ධනය ඉලක්ක කර ගත් දාර්ශනික ප්‍රවාහයකි. විෂය ක්ෂේත්‍ර වශයෙන් ගත් කළ පුද්ගලයාගේ සීල සමාධි ප්‍රඥා යන ත්‍රිශික්ෂා වර්ධනය උදෙසා අවශ්‍ය මාර්ගෝපදේශ ත්‍රිපිටකය තුළින් මනාව විග්‍රහ වී ඇත.

පිරිවෙන් ත්‍රිපිටක ධර්මය විෂය මාලාව සකස් කිරීමේ දී එම සියලු ක්ෂේත්‍ර පරිශීලනය කිරීමට අවශ්‍ය මූලික දැනුම අන්තර්ගත කිරීමට අප උත්සාහ දරා ඇත.

බුද්ධ චරිතය, චරිත කතා, විනය, සූත්‍ර, අභිධර්මය, ධම්ම පදය, භාවනා, මූලික ධර්ම කරුණු, බෞද්ධ සමාජ හා සංස්කෘතිය, ශාසනික චර්යා හා වත් පිළිවෙත් ආදි ක්ෂේත්‍ර හරහා නවක භික්ෂුවකට සිය භික්ෂු ජීවිතය සාර්ථක කර ගැනීම උදෙසා වන මග පෙන්වීම් ලබා දීමට හැකි වී ඇත.

මෙම ගුරු මාර්ගෝපදේශය පරිශීලනයේ දී මෙහි ඇතුළත් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද භාවිතය ඔබේ ඉගැන්වීම් ක්‍රමයට පහසුවක් වනු ඇත. මෙහි යෝජනා කර ඇති පාඩම් සැලසුම් එලෙසින් ම භාවිත කිරීම අනිවාර්ය නොවන අතර එය මග පෙන්වීමක් බව සලකන්න. ඔබේ ප්‍රදේශයේ, පිරිවෙන් සංස්කෘතියේ මෙන් ම ශිෂ්‍ය සංඛ්‍යාවට අනුව එය ගැළපෙන ලෙස භාවිත කළ හැකි ය. එහෙත් මෙම ගුරු මාර්ගෝපදේශය යෝජනා කර ඇති නිපුණතා හා නිපුණතා මට්ටම් වෙනස් නොකළ යුතු බව අවධාරණය කරමි. පන්තියට අදාළ පෙළපොත ද භාවිත කරමින් ඉගෙනුම් ඵල සාක්ෂාත් වන පරිදි ඉගෙනුම් ක්‍රියාවලිය සංවිධානය කොට පාඩම් අවසානයේ දී එම නියමිත ඉගෙනුම් ඵල ඔස්සේ නිපුණතා මට්ටමට ළඟාවීම අපේක්ෂා කෙරේ. එසේ නිපුණතා මට්ටම් කීපයක් මගින් නිපුණතාවට ශිෂ්‍යයා මෙහෙයවිය යුතු ය.

ඔබගේ නව නිර්මාණ හා අදහස් ද එක්කොට ගනිමින් ප්‍රාදේශීය වශයෙන් හෝ ඔබ පිරිවෙනට ආවේණික සංස්කෘතියට අනුව පාඩම් සැලසුම් සකස්කොට ගන්න. එහි දී වර්තමාන අධ්‍යාපන පද්ධතිය තුළ භාවිත වන නවීන තාක්ෂණික මෙවලම් ද ඔබ හැකි තරම් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට භාවිත කරන්න. එහි දී ත්‍රිපිටකධර්ම විෂයයට එම උපකරණ ගැළපේ දැයි සිතන්න. උපකරණ භාවිතයේ දී බෞද්ධ සංස්කෘතියට හෝ ආගමික වටපිටාවට හෝ ශිෂ්‍ය විනය ට හානි නොවන ලෙස භාවිතයට කටයුතු කරන්න.

පාඩම ආරම්භයේ දී ආකර්ෂණීය මෙන් ම ප්‍රබෝධාත්මක පිවිසීම් භාවිත කිරීම වැඩි ප්‍රතිඵල ලැබීමට රුකුලක් වනු ඇත. පාඩම් සංවර්ධනයේ දී භාවිත කළ හැකි ගුණාත්මක යෙදවුම් හැකි උපරිමයෙන් භාවිත කරන්න. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ඔබ පන්ති කාමරයේ සිටින ශිෂ්‍ය සංඛ්‍යාව අනුව කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත කරමින් පාඩම් සංවර්ධනය කිරීම වැඩි ප්‍රතිඵලදායක බව අවධාරණය කරමි.

ත්‍රිපිටක ධර්මය විෂය සාර්ථකව ශිෂ්‍යයා යොමු කිරීම අප සතු යුතුකමකි. ඒ සඳහා ශිෂ්‍යයා මැනවින් තේරුම් ගෙන ඊට ගැළපෙන ඉගෙනුම් ක්‍රමවේද භාවිත කිරීම අඛණ්ඩව කළ යුතු ය. අදාළ නිපුණතා මට්ටමට ළඟාවීමට අවශ්‍ය තක්සේරු හා ඇගයීම් නිර්ණායක සකස් කොට ඇගයීමට ලක් කරමින් අපහසුතා දක්වන සිසුන් වෙතොත් නැවත නැවත ඇගයීමට ලක් කරමින් නිපුණතා මට්ටමට ළඟා වන්න. ශිෂ්‍යයාට දෙන ලද අභ්‍යාසවල නිරවද්‍යතාව පරීක්ෂා කර සටහන් තබන්න. සෑම පාඩමක් අවසානයේ දී ම හැකි තරම් අභ්‍යාසවල ශිෂ්‍යයින් යොමු කිරීමට කටයුතු කරන්න. ශිෂ්‍යයාට ප්‍රායෝගික අවස්ථා වැඩිමනක් ලබා දී මෙය නිපුණතාවට ළඟාවීමට හැකි බව සිතන්න.

ගුරු මාර්ගෝපදේශය පරිශීලනයේ දී ගුරු භවතුන් මෙකී කරුණු පිළිබඳ දැඩි අවධානය යොමු කොට ශාසනික චර්යාවෙන් ද ආකල්ප සම්පත්තියෙන් ද දැනුමෙන් ද පරිපූර්ණ ශිෂ්‍ය පිරිසක් උදෙසා තම මගපෙන්වීම ලබාදීම අගය කොට සලකමි.

**පූජ්‍ය උඩුගම සුදස්සී හිමි**
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
දෙපාර්තමේන්තු ප්‍රධානී
ආගම් හා සාරධර්ම අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය

# පටුන


01. ගුරු අධ්‍යාපන අමාත්‍යතුමාගේ පණිවිඩය iii

02. අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්තුමාගේ පණිවිඩය iv

03. අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය v

04. පෙරවදන vi

05. නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය vii

06. පිරිවෙන් අධ්‍යාපන අධ්‍යක්ෂතුමාගේ පණිවිඩය viii

07. විෂයමාලා කමිටුව හා ගුරු මාර්ගෝපදේශ සම්පාදක මණ්ඩලය ix-x

08. ගුරු මාර්ගෝපදේශය පරිශීලනය කිරීම සඳහා උපදෙස් xi-xii

09. ජාතික අරමුණු xv

10. මූලික නිපුණතා xvi-xvii

11. ත්‍රිපිටක ධර්මය විෂයයේ අරමුණු xviii

12. වාර නියමය xix

13. විෂය නිර්දේශය හා ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස් xx-xxv

14. ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය xxvi

1. බුදුබව පතන බෝසතාණෝ 1-2

2. පෙරුම්දම් පුරා බුදුවන්නට ඇරයුම් ලබති 3-4

3. අපමහ බෝසතුන්ගේ අවසන් උපත සිදු වූ වගයි 5-6

4. බෝසතුන්ගේ කුමරවිය හා රජසිරි 7-9

5. ජීවිතයේ සැබෑතතු හෙළිකල පෙර නිමිති 10-12

6. බෝසතාණෝ නිවන් සුව ළඟා කරන පැවිදි බිමට පිවිසෙති. 13-15

7. අප වෙනුවෙන් බෝසතාණන් සය අවුරුද්දක් විඳි දුක් 16-17

8. උතුම් වූ බුදුබව පසක් කළ සේක. 18-19

9. රාහුල පොඩි හාමුදුරුවෝ 20-22

10. මහා ප්‍රජාපතී ගෝතමී තෙරණිය 23-25

11. අනාථ පිණ්ඩික සිටුතුමා 26-27

12. විශාඛා මහෝපාසිකාව 28-30

13. හොඳට නරකට දෙකට ඇසුරය 31-32

| | |
|---|---|
| 14. දෙමව්පියන්ට සැලකීමත් මහඟුකමකි | 33-35 |
| 15. අප වඩා සිටුවන වැඩිහිටියෝ | 36-38 |
| 16. නමස්කාරය හා සරණාගමනය | 39-41 |
| 17. තෙරුවන් වැඳීම | 42-43 |
| 18. පන්සිල් | 44-45 |
| 19. අෂ්ටාංග සීලය හා දස සීලය | 46-47 |
| 20. ආජීව අට්ඨමක සීලය | 48-49 |
| 21. වන්දනා ගාථා | 50-51 |
| 22. සිව්පස පරිභෝගය | 52-53 |
| 23. කල්‍යාණ මිත්‍ර සම්පත්තිය හා පාපමිත්‍ර විපත්තිය | 54-56 |
| 24. පැවිදි සුවය සොයා යමු | 57-58 |
| 25. උතුම් පින් කෙතට බැඳෙන නියර | 59-61 |
| 26. වලාකුළෙන් මිදෙන හෙරණ සඳ - බාලසික්ඛා | 62-63 |
| 27. සැලසුම් කරගෙන දවස ගෙවමු (දින චරියාව) | 64-65 |
| 28. බුදුගුණ මෙනෙහි කොට ශ්‍රද්ධාව උපදවා ගනිමු | 66-68 |
| 29. මෙත් වඩා සිත් වඩමු | 69-71 |
| ත්‍රිපිටක ධර්මය තක්සේරු කිරීමේ පත්‍රිකාව | 72-73 |

## ජාතික අරමුණු

i. මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පයක් මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාව, ජාතික ඍජු ගුණය, ජාතික සමඟිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම මගින් ජාතිය ගොඩනැඟීම සහ ශ්‍රී ලාංකේය අනන්‍යතාව තහවුරු කිරීම

ii. වෙනස් වන ලෝකයක අභියෝගවලට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාද හඳුනාගැනීම සහ සංරක්ෂණය කිරීම

iii. මානව අයිතිවාසිකම්වලට ගරුකිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ ව දැනුම්වත් වීම සහ හෘදයංගම බැඳීමකින් යුතු ව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග ප්‍රවර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මත සහ ප්‍රජාතාන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණය කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම

iv. පුද්ගලයින්ගේ මානසික හා ශාරීරික සුව සම්පත සහ මානව ඇගයීම්වලට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම

v. සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාපණ හැකියාව, ආරම්භක ශක්තිය, විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුළු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීම

vi. පුද්ගලයාගේ සහ ජාතියේ ජීව ගුණය වැඩිදියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායී කාර්ය සඳහා අධ්‍යාපනය තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම

vii. ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩ ගැසීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයින් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවලට සාර්ථක ව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම

viii. ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවණීය ස්ථානයක් හිමි කර ගැනීමට දායක වන යුක්තිය, සමානත්වය සහ අන්‍යොන්‍ය ගරුත්වය මත පදනම් වූ දැනුම, ආකල්ප හා කුසලතා පෝෂණය කිරීම

# මූලික නිපුණතා

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු මුදුන්පත් කර ගැනීමට දායක වනු ඇත.

## i. සන්නිවේදන නිපුණතා

සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය යන අනුකාණ්ඩ හතරක් මත සන්නිවේදන නිපුණතා පදනම් වේ.

**සාක්ෂරතාව** : සාවධාන ව ඇහුම්කන් දීම, පැහැදිලි ව කතා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරැදි ව සහ නිරවුල් ව ලිවීම, ඵලදායී අයුරින් අදහස් හුවමාරු කර ගැනීම

**සංඛ්‍යා පිළිබඳ දැනුම** : භාණ්ඩ, අවකාශය හා කාලය, ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය

**රූපක භාවිතය** : රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති සහ වර්ණ ගළපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම

**තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය** : පරිගණක දැනුම සහ ඉගෙනීමේ දී ද, සේවා පරිශ්‍රවල දී ද, පෞද්ගලික ජීවිතයේ දී ද, තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගි කර ගැනීම

## ii. පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා

- නිර්මාණශීලී බව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තිය, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයා ගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා
- ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම වැනි අගය
- චිත්තවේගී බුද්ධිය

## iii. පරිසරයට අදාළ නිපුණතා

මෙම නිපුණතා සාමාජික, ජෛව සහ භෞතික පරිසරවලට අදාළ වේ.

**සමාජ පරිසරය** : ජාතික උරුම පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සාමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුසලතාව, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පුද්ගලික චර්යා, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදාය, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්

**ජෛව පරිසරය** : සජීවී ලෝකය, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස්වැල්, වනාන්තර, මුහුදු, ජලය, වාතය සහ ජීවය, ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදී බව හා කුසලතා

**භෞතික පරිසරය** : අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට ඒවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍යය, සුව පහසුව, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මළපහ කිරීම් යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදීතාව හා කුසලතාව ඉගෙනීම, වැඩ කිරීම සහ ජීවත් වීම සඳහා මෙවලම් සහ තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා

**iv. වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා**

- ආර්ථික සංවර්ධනයට දායක වීම
- තම වෘත්තීය ළැදියා සහ අභියෝග්‍යතා හඳුනා ගැනීම
- හැකියාවලට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම සහ වාසිදායක හා තිරසාර ජීවනෝපායක නිරත වීම යන හැකියා උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා

**v. ආගම සහ ආචාර ධර්මවලට අදාළ නිපුණතා**

පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවලට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අදාළ අගය උකහා ගැනීම හා ස්වීයකරණය

**vi. ක්‍රීඩාව සහ විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා**

සෞන්දර්යය, සාහිත්‍යය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටා තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්

**vii. ඉගෙනීමට ඉගෙනුම පිළිබඳ නිපුණතා**

ශීඝ්‍රයෙන් වෙනස් වන, සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස් වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදී ව හා සාර්ථක ව ප්‍රතිචාර දැක්වීමත්, ස්වාධීන ව ඉගෙන ගැනීමත්, සඳහා පුද්ගලයින්ට ශක්තිය ලබා දීම

## ත්‍රිපිටක ධර්මය විෂයයේ අරමුණු

1. ත්‍රිවිධ රත්නයේ ගුණ හැඳින, ශ්‍රද්ධාවත් ව හා යථාර්ථවාදීව කටයුතු කරන, නිවැරැදි ප්‍රායෝගික වතාවත්වල යෙදෙන භික්ෂු හා ගිහි පරපුරක් බිහි කිරීම.

2. ජීවන ගමනේ දී මුහුණපාන අභියෝග ජයගැනීමට හා නිවැරැදි යහපත් ජීවන රටාවක් ගොඩනගා ගැනීමට බුදු දහමේ මූලික ඉගැන්වීම් උපයෝගීකොටගෙන සිව්වණක් පිරිසේ යහපත් ආදර්ශ ද එක්කොට ගත් දැහැමි පරපුරකට මඟ පෙන්වීම.

3. නිවැරැදි හා යහපත්, ආදර්ශවත්, යථාර්ථවාදී භික්ෂු ජීවිතයක් ගොඩනගා ගැනීමට භික්ෂු විනය හා ශික්ෂාපද ප්‍රගුණ කිරීමට මඟ පෙන්වීම.

4. බෞද්ධ ත්‍රිපිටකාගත සූත්‍ර අධ්‍යයනය කොට භික්ෂු ජීවිතය සාර්ථක කරගැනීමටත් ගිහි ජනතාවට මඟ පෙන්වීමටත් ඒ තුළින් සුපෞරුෂයක් ගොඩනගා ගැනීමටත් මඟ පෙන්වීම.

5. ධම්මපද ගාථා අධ්‍යයනය කොට ආදර්ශ සපයාගනිමින් භික්ෂු ජීවිතය සාර්ථක කර ගැනීමටත්, ගිහි ජීවිත සාර්ථක කර ගැනීමට ධර්ම දේශනා කිරීමටත් මඟ පෙන්වීම.

6. ශ්‍රී ලාංකේය හා බෞද්ධ සංස්කෘතික උරුමය හැඳින, ශාසනික උරුමය රැකගැනීමත්, ඒවා පවත්වා ගැනීමටත් අවශ්‍ය ආදර්ශ සපයන භික්ෂු හා ගිහි සිසු පිරිසක් බිහිකිරීම.

7. මානසික ඒකාග්‍රතාවෙන් යුතු සුසමාහිත සමබර පෞරුෂයක් ගොඩනගා ගැනීමට භාවනාව ප්‍රගුණ කිරීමට යොමු කරවීම.

8. සමාජ, ආර්ථික, දේශපාලනික හා සංස්කෘතික සංවර්ධනය උදෙසා බෞද්ධ ඉගැන්වීම් උපයෝගීකොට ගෙන ප්‍රායෝගික භික්ෂු ජීවිතයක් ගොඩනගා ගැනීමටත්, ගිහි ජනතාවට මඟ පෙන්වීමටත් අවශ්‍ය ශක්තිය ලබාදීම.

# වාර නියමය - 1 ශ්‍රේණිය

| නිපුණතා මට්ටම / පාඩම | | පරිච්ඡේද |
|---|---|---|
| 1 වාරය | 1.1 - 1,2,3 පාඩම්<br>2.1 - 9,10 පාඩම්<br>2.3 - 13 පාඩම<br>5.1 - 16 පාඩම<br>3.2 - 22 පාඩම<br>4.1 - 24 පාඩම<br>6.1 - 28 පාඩම | 60 |
| 2 වාරය | 1.1 - 4 පාඩම<br>1.2 - 5,6 පාඩම්<br>2.2 - 11 පාඩම<br>3.2 - 14 පාඩම<br>5.1 - 17 පාඩම<br>5.2 - 18 පාඩම<br>3.1 - 25 පාඩම | 60 |
| 3 වාරය | 1.2 - 7,8 පාඩම්<br>2.2 - 12 පාඩම<br>2.3 - 15 පාඩම<br>5.2 -19,20 පාඩම්<br>5.1 - 21 පාඩම<br>2.3 - 23 පාඩම<br>3.2 - 26,27 පාඩම්<br>6.1 - 29 පාඩම | 60 |

සැ. යු. පෙළ පොතේ පාඩම් පිළිවෙළට අනුව නිපුණතා දක්වා ඇත.

# විෂය නිර්දේශය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම්ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 1.0 සාර්ථක භික්ෂු ජීවිතයක් උදෙසා තෙරුවන ගුණ හැඳින චරිතායනය කරයි. | 1.1 බෝසත් චරිතයෙහි සුවිශේෂී සිදුවීම් අධ්‍යයනය කොට, ආදර්ශයෙන් කටයුතු කරයි. | දස පාරමිතා පිරීම, මහ බෝසත් සිරිත, මහබෝසත් උපත, මහ බෝසත් ළමා විය හා රජසිරි | ● බෝසත් චරිතයෙහි සුවිශේෂී සිදුවීම් අවබෝධ කර ගනියි.<br>● බුදුබව පතන බෝසතාණෝ පෙරුම් දම් පිරිය යුතු බව පිළිගනියි.<br>● බෝසත් සිරිතෙහි සුවිශේෂී සිදුවීම් පෙළගස්වයි.<br>● ආදර්ශයෙන් කටයුතු කරයි.<br>● යහපත් කටයුතුවල යෙදෙයි. | 21 |
| | 1.2 බුද්ධ චරිතයෙහි එන දුෂ්කර ක්‍රියාකිරීම සහ බුද්ධත්වයෙහි සුවිශේෂී බව හැඳින, ආදර්ශයෙන් කටයුතු කරයි. | සතර පෙර නිමිති, පැවිදිවීම, දුෂ්කර ක්‍රියාව, බුදුවීම. | ● දුෂ්කර ක්‍රියාවෙහි සිදුවීම් දැන ගනියි.<br>● ජීවිතයේ සැබෑ තතු සතර පෙරනිමිතිවලින් හෙළිවන බව පිළිගනියි.<br>● දුෂ්කර ක්‍රියාවෙහි වැදගත් සිදුවීම් වගු ගත කරයි.<br>● උත්සාහයෙන් කටයුතු කරයි.<br>● නිවැරදි මාවත තෝරා ගනියි. | 23 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම්ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 2.0 භික්ෂු ජීවන රටාව හැඩගසා ගැනීමට, බෞද්ධ ජාතක කතා හා සිව්වණක් පිරිසේ චරිතාදර්ශ උපයෝගි කර ගනියි. | 2.1බෞද්ධ ශ්‍රාවක ශ්‍රාවිකා චරිත අධ්‍යයනය කොට, ආදර්ශයෙන් කටයුතු කරයි. | රාහුල පොඩි හාමුදුරුවෝ, මහා ප්‍රජාපතී ගෝතමී තෙරණිය. | • බෞද්ධ ශ්‍රාවක ශ්‍රාවිකා චරිත හඳුනා ගනියි.<br>• ශ්‍රාවක ශ්‍රාවිකා චරිත ආදර්ශයෙන් පිරී ඇති බව පිළිගනියි.<br>• ශ්‍රාවක ශ්‍රාවිකා චරිතවලට උදාහරණ සපයමින් ආදර්ශ වගුගත කරයි.<br>• පරෝපකාරයෙහි යෙදෙයි.<br>• බුද්ධිමත්ව කටයුතු කරයි. | 11 |
| | 2.2 බෞද්ධ උපාසක උපාසිකා චරිතවලින් මතුවන ගුණාංග චරිතායනය කරයි. | අනාථපිණ්ඩික සිටුතුමා, විශාකා උපාසිකාව. | • බෞද්ධ උපාසක උපාසිකා චරිත නම් කරයි.<br>• බෞද්ධ උපාසක උපාසිකාවන් සිව්වණක් පිරිසට අයත් බව පිළිගනියි.<br>• බෞද්ධ උපාසක උපාසිකා චරිතවලට උදාහරණ සපයයි.<br>• සහයෝගයෙන් කටයුතු කරයි.<br>• පරාර්ථ චර්යාවෙහි යෙදෙයි. | 12 |
| | 2.3 බෞද්ධ ජාතක කතා අධ්‍යයනය කොට, උතුම් චරිතාංග ආදර්ශ ඇසුරෙන් කටයුතු කරයි. | සාම ජාතකය, සත්තිගුම්බ ජාතකය, තිත්තිර ජාතකය. සච්චංකිර ජාතකය | • ජාතක කතාවල වැදගත්කම පැහැදිලි කර ගනියි.<br>• ජාතක කතා වර්තමානයට ආදර්ශ සපයන බව පිළිගනියි.<br>• ජාතක කතාවලින් පැහැදිලි වන ආදර්ශ වගුගත කරයි.<br>• යහපත් ඇසුරට පත්වෙති.<br>• දෙමාපියන්ට සලකයි. | 17 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම්ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 3.0 බෞද්ධ විනය හා ශික්ෂණය පිළිබඳ දැනුම වර්ධනය කර, භික්ෂු ජීවිතය හැඩ ගස්වා ගනියි. | 3.1 භික්ෂු ජීවිතයට අදාළ මූලික ශික්ෂා පද ප්‍රගුණ කරයි. | හෙරණසිඛ | • භික්ෂු ජීවිතයට අදාළ මූලික ශික්ෂා පද පැහැදිලි කර ගනියි.<br>• ශික්ෂා පද ප්‍රගුණ කළයුතු බව පිළිගනියි.<br>• භික්ෂු ජීවිතයට අදාළ මූලික ශික්ෂා පද ලැයිස්තු ගත කරයි.<br>• අල්පේච්ඡ ජීවිතයකට හුරුවෙයි.<br>• බහුභාණ්ඩික බවින් මිදෙයි. | 10 |
| | 3.2 මූලික ශික්ෂා පද ආරක්ෂා කරගැනීමට අදාළ බෞද්ධ ඉගැන්වීම් අනුගමනය කරයි. | සිව්පසය ප්‍රත්‍යවේක්ෂාව, බාල සික්ඛා, දිනචරියාව. | • භික්ෂු ජීවිතයට අදාළ මූලික ශික්ෂාපද පැහැදිලි කර ගනියි.<br>• භික්ෂු ජීවිතය හා ශික්ෂා පද අතර ඇති බැඳීම පිළිගනියි.<br>• ශික්ෂා පද ආරක්ෂාකිරීමට අවශ්‍ය කරුණු ගොනු කරයි.<br>• ගුරුවරු, වැඩිහිටියනට ගරු කරයි.<br>• සැලසුම් සහගතව කටයුතු කරයි. | 25 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම්ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 4.0 බෞද්ධ සූත්‍ර අනුසාරයෙන් දැනුම වර්ධනය කර ගනියි. | 4.1 බෞද්ධ සූත්‍රවල ඇතුළත් දහම් කරුණු අවබෝධයෙන්, තම ජීවිතය සාර්ථක කරගනියි. | දසධම්ම සූත්‍රය. | • බෞද්ධ සූත්‍රවල ඇතුළත් දහම් කරුණු විස්තර කර ගනියි.<br>• දසධම්ම සූත්‍රය භික්ෂු ජීවිතය හැඩගස්වා ගැනීමට ඉවහල්වන බව පිළිගනියි.<br>• දසධම්ම සූත්‍රයේ ඇතුළත් දහම් කරුණු ලැයිස්තුගත කරයි.<br>• යහපත් භික්ෂු ආකල්පයන් ප්‍රගුණ කරයි.<br>• දියුණුවේ මග සලස්වා ගනියි. | 07 |
| 5.0 බෞද්ධ ශික්ෂාපද හා වන්දනාමාන කිරීමේ ගාථා අධ්‍යයනය කර, අරුත් බර ධම්ම පද ගාථා චරිතායනයෙන්, සාර්ථක ප්‍රතිබල සම්පන්න භික්ෂු ජීවිතයකට මග සලසා ගනියි. | 5.1 වන්දනාමාන කිරීමේ ගාථා හැඳින, චරිතායනයෙන් කටයුතු කරයි. | නමස්කාරය හා සරණාගමනය, තෙරුවන වැඳීම, වන්දනා ගාථා. | • වන්දනාමාන කිරීමේ පිළිවෙත විස්තර කරයි.<br>• ගාථා නිවැරදිව සජ්ඣායනයෙන් ශ්‍රද්ධාව උපදින බව පිළිගනියි.<br>• වන්දනාමාන කිරීමේ පිළිවෙත හා පිළිවෙළ ලැයිස්තුගත කරයි.<br>• ශ්‍රද්ධාවෙන් කටයුතු කරයි.<br>• නිවැරදි පිළිවෙතින් දෛනිකව කටයුතු කරයි. | 24 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම්ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 5.2 නිවැරදිව සීලසමාදානයෙහි යෙදෙමින්, සිල්වත් ජීවිතයක් ගත කරයි. | පන්සිල්, ආජීව අෂ්ටමක සිල්, අටසිල්, දස සිල් | • සීලයේ වැදගත්කම පැහැදිලි කර ගනියි.<br>• සීලය චාරිත්‍ර හා වාරිත්‍ර වශයෙන් දෙයාකාර බව පිළිගනියි.<br>• සීලයේ ප්‍රභේද වගුගත කරයි.<br>• පිළිවෙතින් කටයුතු කරයි.<br>• ශික්ෂාකාමී ජීවිතයක් ගත කරයි. | 13 |
| 6.0 බෞද්ධ භාවනාවේ මූලිකාංග ප්‍රගුණ කරමින්, යථාවබෝධය පිණිස භාවනාවේ යෙදෙයි. | 6.1 බුද්ධානුස්සති භාවනාව හා මෙත්තානුස්සති භාවනාව ප්‍රගුණ කරයි. | බුද්ධානුස්සති භාවනාව, මෙත්තානුස්සති භාවනාව. | • භාවනාවේ වැදගත්කම පැහැදිලි කර ගනියි.<br>• සාර්ථක ජීවිතයකට භාවනාව ප්‍රගුණ කළයුතු බව පිළිගනියි.<br>• බුද්ධානුස්සති හා මෙත්තානුස්සති භාවනාවේ ප්‍රයෝජන වගුගත කරයි.<br>• දිනපතා භාවනාවේ යෙදෙයි.<br>• සතිමත්ව කටයුතු කරයි. | 13 |

# ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්

# 1 පාඩම
# බුදුබව පතන බෝසතාණෝ

**නිපුණතාව:- 1.0**

- සාර්ථක භික්ෂු ජීවිතයක් උදෙසා තෙරුවන ගුණ හැඳින චරිතායනය කරයි.

**නිපුණතා මට්ටම:- 1.1**

- බෝසත් චරිතයෙහි සුවිශේෂ සිදුවීම් අධ්‍යයනය කොට ආදර්ශයෙන් කටයුතු කරයි.

**කාලපරිච්ඡේද:-** 05 යි

**ඉගෙනුම් පල:-**

- බුදුරජාණන් වහන්සේගේ ලොව පහළවීම ඉතාම දුර්ලභ අවස්ථාවක් බව පැහැදිලි කරයි.
- බුදු බව ලැබීම සඳහා නියත විවරණ ලැබිය යුතු බව පිළිගනිමින් අදහස් ප්‍රකාශ කරයි.
- ගෞතම බුදුරජාණන් වහන්සේගේ බෝධිසත්ව චරිතයෙහි විවරණ ලැබීම පිළිබඳ කරුණු රැස් කර ගොනුවක් සකසයි.
- බෝසත් චරිතයක් ගත කරයි.
- සාර්ථක පැවිදි ජීවිතයක් ගත කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්:-**

**I** පෙර සූදානම,

- පෙළ පොතෙහි පළමුවැනි පාඩම හොඳින් අධ්‍යයනය කර පැමිණෙන ලෙස සිසුන් දැනුම්වත් කරන්න.

**II** ප්‍රවේශය

- ඇමුණුම 1හි සඳහන් "බුදු කෙනෙකුන් මේ ලොව නූපන් වර" යන ලෝවැඩ සඟරාවේ කවිය ලියන ලද පුවරුව ප්‍රදර්ශනය කරමින් කවිය ගායනා කරන්න. සිසුන් සමඟ ද ගායනා කරන්න.
- මෙම කවියෙන් කියවෙන්නේ කුමක් පිළිබඳව ද ? යන්න සාකච්ඡා කරමින් , ප්‍රශ්න නඟමින්, පිළිතුරු ලබාගනිමින් බුදුරජාණන් වහන්සේ පහළවීමේ පුවත පැහැදිලි කර බුදුබව පතන බෝසතාණෝ යන මාතෘකාව ඉස්මතුකර ගන්න.

**පාඩම් සංවර්ධනය:-**

- මෙලොව ඉතා දුර්ලභ කාරණා හතරක් තිබෙන බව පැහැදිලි කරන්න.
- "දුල්ලභඤ්ච මනුස්සත්තං" යන ගාථාව ලියා තේරුම සහිතව කටපාඩම් කරවන්න.
- බුදු වීම සඳහා නියත විවරණ ලැබිය යුතු බව.

- වර්තමානයේ මෙම දුර්ලභ කාරණා හතරම ඉෂ්ට වී ඇති බව පැහැදිලි කරන්න.
- වර්තමානයේ මහණ වීම කියා නිම කළ නොහැකි වාසනාවක් බව පහදා දෙන්න.
- මතු බුදුබව ප්‍රාර්ථනා කරන අයෙකු බුදුවරයෙකුගෙන් ඒකාන්තයෙන් විවරණ ලබාගත යුතු බව.
- බෝසත් උතුමෙකුගේ පළමු විවරණය ඉටු වීමට අංග අටක් සම්පූර්ණ විය යුතු බව.
- පළමු විවරණ ලැබීම පිළිබඳ පැහැදිලි කරන්න.
- බෝසතාණන් වහන්සේ මීට අසංඛ්‍ය කල්ප ලක්ෂ හතරකට පෙර දඹදිව අමරවතී නුවර ධනවත් සිටු පවුලක එකම පුත්‍රයා වී උපන් පුවත විස්තර කරන්න.
- සුමේධ තාපසතුමා දීපංකර බුදුපියාණන් වහන්සේ හමු වූ අවස්ථාව විස්තර කරන්න.
- නියත විවරණ ලැබීමේ පුවත අවධාරණය කරන්න.
  (ඉහත තොරතුරු කණ්ඩායම් ගවේෂණ පත්‍රිකා මගින් ශිෂ්‍ය ක්‍රියාකාරකම් ලෙසින් සිදු කිරීම වඩාත් ඵලදායී වේ.)
- තක්සේරුකරන නිර්ණායක ගුරුවරයා විසින් මැනවින් අවබෝධකොට එම නිර්ණායකවලට අදාළව ශිෂ්‍යයින් තක්සේරු කරන්න.
- සාධන මට්ටමට ළඟා නොවූ සිසුන් සඳහා ප්‍රතිපෝෂණ ක්‍රියාවලියෙහි නිරත කරන්න.

## මූලික වදන් හා සංකල්පඃ-

- ඍද්ධි බල - සිත දියුණු කරගත් අය සිදුකරන ප්‍රාතිහාර්යය ඍද්ධිබලයෙන් සිදු කරයි.
- විවරණදීම - බුද්ධත්වය සඳහා පෙර බුදුරජාණන් වහන්සේලාගෙන් ලබාගන්නා ආශිර්වාදය

## ගුණාත්මක යෙදවුම්ඃ-

- ඇමුණුම 01

| | |
|---|---|
| බුදුකෙනෙකුන් මේ ලොව නූපන් | වර |
| අඳුරෙක් ම ය සදහම් නැති මෙ | සසර |
| ඉඳුරා නොදැනෙයි පව් පින් | තොරතුර |
| සිදු නො කළැකි ඉන් සග මොක් | සිරිසර |

කවිය ලියන ලද පුවරුව (ප්‍රවේශය සඳහා)

- පෙළපොතේ පළමු වන පාඩම
- ගුරුමාර්ගෝපදේශය, ඩිමයිකොළ, ප්ලැටිග්නම්

## ඇගයීම් හා තක්සේරුකරණය සඳහා නිර්ණායකඃ-

- ගාථා නිවැරදිව සජ්ඣායනය කිරීම හා කටපාඩම් කිරීම.
- ගාථාවල අර්ථය සරලව පැහැදිළි කිරීම.
- සුමේධ තාපසතුමාගේ කතා පුවත සරලව මතකයෙන් කීම.
- බෝසත් උතුමෙකුගේ පළමු විවරණයට අවශ්‍ය අංග අට මතකයෙන් කීම.

## වැඩිදුර පරිශීලනයටඃ-

- පන්සිය පනස් ජාතක පොත
- බුද්ධ චරිතය - පූජ්‍ය බලංගොඩ ආනන්ද මෛත්‍රිය මහනාහිමි

# 2 පාඩම
# පෙරුම්දම් පුරා බුදුවන්නට ඇරයුම් ලබති

**නිපුණතාව:- 1.0**

- සාර්ථක භික්ෂු ජීවිතයක් උදෙසා තෙරුවන ගුණ හැඳින චරිතායනය කරයි.

**නිපුණතා මට්ටම:- 1.1**

- බෝසත් චරිතයෙහි සුවිශේෂී සිදුවීම් අධ්‍යයනය කොට ආදර්ශයෙන් කටයුතු කරයි.

**කාලපරිච්ඡේද:-** 04 යි

**ඉගෙනුම් පල:-**

1. සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයක් තිස්සේ පාරමිතා පිරීමෙන් බුද්ධත්වය සඳහා පෙරුම්දම් පිරීම පැහැදිලි කර ගනියි.
2. අප මහ බෝසතාණෝ බුදුවරු විසිහතර නමකගෙන් විවරණ ලැබූ බව පිළිගෙන කතා කරයි.
3. "බුද්ධ කෝලාහලය" යන්න නිර්වචනය කිරීමට අවශ්‍ය කරුණු රැස් කරයි.
4. අනාගතය ගැන සැලසුම් කරයි.
5. වීර්යයෙන් කටයුතු කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්:-**

**I** පෙර සූදානම,

- පෙළ පොතෙහි දෙවැනි පාඩම හොඳින් අධ්‍යයනය කර පැමිණෙන ලෙස සිසුන් දැනුම්වත් කරන්න.

**II** ප්‍රවේශය

කාලො යං තෙ මහාවීර      උප්පජ්ජ මාතු කුච්ඡියං
සදෙවකං තාරයනෙතා      බුජ්ඣස්සු අමතං පදං

යන ගාථාව ලියන ලද පුවරුව ප්‍රදර්ශනය කරමින් ගාථාව ශබ්ද නගා නිවැරදිව සජ්ඣායනය කරන්න.

පහත ප්‍රශ්න අසමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.

- මෙම ගාථාවෙන් කියවෙන අදහස කුමක්ද ? ආදී ලෙස ප්‍රශ්න නගමින් දේවාරාධනාව පිළිබඳ සාකච්ඡාව මෙහෙයවමින් "පෙරුම් දම් පුරා බුදුවන්නට ඇරයුම් ලබති" යන පාඩම ආරම්භ කරන්න.

**පාඩම් සංවර්ධනය:-**

- ගෞතම බෝසතාණන් වහන්සේ දීපංකර බුදුරජාණන් වහන්සේගේ සිට කාශ්‍යප බුදුරජාණන් වහන්සේ දක්වා බුදුවරුන් විසිහතර නමකගෙන් විවරණ ලැබූ බව පැහැදිලි කරන්න. එය සූවිසි විවරණ ලෙස හැඳින්වෙන බව දැනුම්වත් කරන්න.
- දස පාරමිතා පිරූ ආකාරය පිළිබඳ සාකච්ඡා කරන්න.

- අවසන් වරට දාන පාරමිතාව සම්පූර්ණ කර මියගොස් තුසිත දෙව්ලොව සන්තුසිත දිව්‍යරාජයා වී උපන් බව පැහැදිලි කරන්න.
- "කාලො යං තෙ මහාවීර ...." යන ගාථාව කටපාඩම් කිරීමට යොමු කරන්න.
- ගාථාවේ දුරවබෝධ පද අභ්‍යාස පොතේ සටහන් කර ගැනීමට උපදෙස් දෙන්න.
- බුදු කෙනෙක් ලොව පහළවන විට ලෝකයේ බුද්ධ කෝලාහලයක් ඇතිවන බව.
- බුද්ධ කෝලාහලය යන්න පැහැදිලි කරන්න.
- සෑම බෝධිසත්වවරයෙකුටම බුදුවීම සඳහා දේවාරාධනාව සිදුකරන බව
- ගාථාවෙන් දේවාරාධනාව සිදුකළ ආකාරය පැහැදිලි කරන්න.
- බුදුවන ආත්ම භවයට පෙර බෝසත්වරයා මිනිස්ලොව ඉපදීමට කරුණු පහක් පිළිබඳ සොයා බැලූ බව පැහැදිලි කරන්න.
- එම කරුණු කාලය, දීපය, දේශය, කුලය, මව ලෙස දක්වමින් ඒවා පංච විලෝකන නමින් හැඳින්වෙන බව පැහැදිලි කරන්න.
- බෝසත්තුමා මිනිස් ලොව උපදින කාලය, ස්ථානය හා මව්කුස තීරණය කරගත් බව පැහැදිලි කරන්න.
- තක්සේරුකරණ නිර්ණායක ගුරුවරයා විසින් මැනවින් අවබෝධ කරගෙන එම නිර්ණායකවලට අදාළව ශිෂ්‍යයන් තක්සේරුකරණය කරන්න.
- අපේක්ෂිත සාධන මට්ටම්වලට ළඟා නොවූ සිසුන් වේ නම් ඒ සඳහා සුදුසු ප්‍රතිපෝෂණ ක්‍රියාවලියක නිරත කරවන්න.

## මූලික වදන් හා සංකල්පඃ-

- තුසිත දෙව්ලොව - චාතුම්මහාරාජිකය, තාවතිංසය, යාමය-තුසිතය, නිම්මාණරතිය, පරනිම්මිත වසවත්තිය, යාමය, තුසිතය යන දෙව්ලෝ හයෙන් එකකි.

  පංච විලෝකන - කාලං දීපඤ්ච දෙසඤ්ච
  කුලං මාතරමෙව ච
  එතෙ පඤ්ච විලෝකෙත්වා
  උප්පජ්ජන්ති තථාගතා

- සූ විස්ස - විසි හතර

## ගුණාත්මක යෙදවුම්ඃ-

- ඇමුණුම 1 හි "කාලො යං තෙ මහාවීර ...." යන ගාථාව ලියූ පුවරුව
- ගුරුමාර්ගෝපදේශය
- පෙළපොතේ දෙවන පාඩම

## ඇගයීම් හා තක්සේරුකරණය සඳහා නිර්ණායකඃ-

- "කාලො යං තෙ මහාවීර ...." යන ගාථාව කට පාඩම් කිරීම.
- දස පාරමිතා මතකයෙන් ප්‍රකාශ කිරීම.
- සූ විසි බුදුවරු මතකයෙන් නම් කිරීම.
- බුද්ධ කෝලාහලය යන්න නිර්වචනය කිරීම.

## වැඩිදුර පරිශීලනයටඃ-

ඇමුණුම් 01. ප්‍රවේශය සඳහා

- බුද්ධ චරිතය - වල්පොල රාහුල හිමි

# 3 පාඩම
# අපමහ බෝසතුන්ගේ අවසන් උපත සිදු වූ වගයි

**නිපුණතාව:- 1.0**

- සාර්ථක භික්ෂු ජීවිතයක් උදෙසා තෙරුවන ගුණ හැඳින චරිතායනය කරයි.

**නිපුණතා මට්ටම:- 1.1**

- බෝසත් චරිතයෙහි සුවිශේෂී සිදුවීම් අධ්‍යයනය කොට ආදර්ශයෙන් කටයුතු කරයි.

**කාලපරිච්ඡේද:-** 06 යි

**ඉගෙනුම් පල:-**

1. මහ බෝසතුන්ගේ මව්කුස පිළිසිඳ ගැනීම ඇසළ පුර පොහෝ දිනක සිදු වූ බව දැන ගනියි.
2. මහාමායා දේවිය දුටු සිහිනය පිළිබඳ සිදුවීම උගනියි.
3. සිදුහත් බෝසත් උපත යන මැයෙන් වාක්‍ය රචනයක් ගොඩනගයි.
4. කුසලයෙහි යෙදෙයි.
5. දැහැමි ජීවිතයක් ගත කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්:-**

**I** පෙර සූදානම,

- තුන්වන පාඩම හොඳින් අධ්‍යයනය කර පැමිණෙන ලෙස සිසුන් දැනුම්වත් කරන්න.

**II** ප්‍රවේශය

- මහාමායා දේවිය ඇසළ පෝදා දුටු සිහිනය දැක්වෙන චිත්‍රය (ඇමුණුම 1 ) සිසුන්ට ප්‍රදර්ශනය කරන්න.
- එහි දැක්වෙන අවස්ථාව පිළිබඳ සිසුන්ගෙන් විමසන්න.
- සිසුන්ගෙන් ප්‍රශ්න නඟමින්, පිළිතුරු ලබාගනිමින්, චිත්‍රය පැහැදිලි කරමින්, මව්කුස පිළිසිඳ ගැනීම යන අදහස මතුකර ගන්න.

**පාඩම් සංවර්ධනය:-**

- උතුරු ඉන්දියාවට අයත් මධ්‍ය ප්‍රදේශයේ පිහිටි ශාක්‍ය ජනපදය පිළිබඳව සිසුන්ට කරුණු පැහැදිලි කිරීම.
- ඇසළ සැණකෙළිය පිළිබඳ සාකච්ඡාවක් මෙහෙයවන්න.
- පොහොය දිනට සතියකට පෙර සැණකෙළි ආරම්භ වී ඇසළ පෝදා අවසන් වෙයි.
- මහාමායා දේවිය දුටු අපූරු සිහිනය පිළිබඳ තවදුරටත් කරුණු පැහැදිලි කරන්න.
- මහ බෝසතාණන් වහන්සේ තුසිත දෙව්ලොවින් චුත වී මව්කුස පිළිසිඳගත් අවස්ථාවේ දස දහසක් සක්වල කම්පා වීම පැහැදිලි කරන්න.
- එම අවස්ථාවේ සක්වල අසිරිමත් සිදුවීම් රැසක් සිදු වූ බව පැහැදිලි කරන්න.
- සුදොවුන් රජතුමා දේවිය දුටු සිහිනය උගත් බමුණන් හැට දෙනෙකු ලවා රජ මාලිගය තුළදී කරුණු විමසූ අයුරු පැහැදිලි කරන්න.

- සිහිනයේ අරුත උතුම් පින්වත් කුමරෙකු මව්කුස පිළිසිඳ ගැනීම බව සාකච්ඡා කරන්න.
- කුසට දසමස් සපිරෙන මහාමායා දේවිය මව්පියන් දැකීමට දෙව්දහ නුවරට ගිය පුවත විස්තර කරන්න.
- දෙව්දහ සහ කිඹුල්වත යන නගර දෙක අතර ලුම්බිණි සල් උයනේ සිදුහත් උපත සිදුවූ අවස්ථාව පිළිබඳ සාකච්ඡාවක් මෙහෙයවන්න.
- සිදුහත් කුමරු උපන් මොහොතේ අභීත සිංහනාද සිදුකළ බව
- සිදුහත් කුමරු ලොවට පහළ වූ මොහොතේ යසෝධරා දේවිය, ඡන්න ඇමති, කාළුදායී ඇමති, අජානීය හස්තිරාජයා, කන්ථක අශ්වයා, මහ බෝරුක, සතර මහ නිධාන පහළවීමේ පුවත විස්තර කරන්න. (සහජාත වස්තු)
- ඒ මොහොතේ ලොව පුරා පෙර නිමිති දෙතිසක් පහළ වූ බව.
- දෙපාර්ශ්වයේ ඥාතීන් මහත් සොම්නසින් බෝසත් කුමරු පෙරහැරින් කිඹුල්වතට කැඳවාගෙන ගිය අයුරු ද පැහැදිලි කරන්න.
  (ඉහත කරුණු කණ්ඩායම් ක්‍රියාකාරකම් මඟින් සිදුකළ හැකිය.)
- තක්සේරුකරණ නිර්ණායක ගුරුවරයා විසින් මැනවින් අවබෝධ කරගෙන එම නිර්ණායකවලට අදාළව ශිෂ්‍යයන් තක්සේරුකරණය කරන්න.
- අපේක්ෂිත සාධන මට්ටම්වලට ළඟා නොවූ සිසුන් වේ නම් ඒ සඳහා සුදුසු ප්‍රතිපෝෂණ ක්‍රියාවලියක නිරත කරවන්න.

**මූලික වදන් හා සංකල්පඃ-**

- ඇසළ සැණකෙළිය, පැරණි දඹදිව උත්සව පෙරහැර ආදිය පැවැත්වීමයි.
- සතරවරම් දෙවිවරු ධෘතරාෂ්ඨ , විරූඪ , විරූපාක්ෂ , වෛශ්‍රවණ නම් වේ.
- අමාවතුර ලියූ ගුරුළුගෝමී විසින් බෝධිසත්වයන් පිළිසිඳගත් අයුරු විස්තර කර ඇත. "මහාමායා දේවි .... දිව විමන් පරයන සිරියහන් ගැබට වැද , සිරියහන් මතුයෙහි හෙ වැ නිදන්නට වන්නී මෙබඳු ස්වප්නයක් දුටු .... සතරවරම් මහරජුහු ඇය යහනින්ම නගා ගෙන හිමවත් පියෙසට ඇරැ , සැට යොදුන් රුක්ගල්තෙලෙහි පිහිටි සත් යොදුන් මහසල්රුක් යටැ බහා තබා එකත් පස් ව සිටියෝ ....."
- උතුරුසල නැකත - නැකත් පන්තියෙහි නැකත් 27 න් 21 වන නැකතයි. ඇඳකට සමාන තරු රටා ඇත. ගුරු ග්‍රහයාට අයිතිය.

**ගුණාත්මක යෙදවුම්ඃ-**

- ඇමුණුම 1- මහාමායා දේවිය දුටු සිහිනය ප්‍රමාණාත්මක පරිමාණයකට අඳින ලද සිතුවම
- පෙළපොතේ තුන්වන පාඩම
- ගුරුමාර්ගෝපදේශය

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා නිර්ණායකඃ-**

පහත සඳහන් නිර්ණායක යොදාගන්න.

- මහ බෝසත් කුමරුගේ මව්කුස පිළිසිඳගත් සිදුවීම විස්තර කිරීම.
- "අග්ගෝ හමස්මි ලෝකස්ස ..." යන ගාථාව කට පාඩමින් ප්‍රකාශ කිරීම.
- ඉන්දියාවේ පැවති ඇසළ සැණකෙළිය විස්තර කිරීම.
- සිදුහත් බෝසත් උපත යන මැයෙන් වාක්‍ය රචනයක් ගොඩ නැගීම.

**වැඩිදුර පරිශීලනයටඃ-**

ඇමුණුම් 01. ප්‍රවේශය සඳහා

- අමාවතුර - ඥානාලෝක සංස්කරණය (පි.9)

# 4 පාඩම
# බෝසතුන්ගේ කුමරවිය හා රජසිරි

**නිපුණතාව:- 1.0**

- සාර්ථක භික්ෂු ජීවිතයක් උදෙසා තෙරුවන ගුණ හැඳින චරිතායනය කරයි.

**නිපුණතා මට්ටම:- 1.1**

- බෝසත් චරිතයෙහි සුවිශේෂී සිදුවීම් අධ්‍යයනය කොට ආදර්ශයෙන් කටයුතු කරයි.

**කාලපරිච්ඡේද:-** 06 යි

**ඉගෙනුම් පල:-**

1. සිදුහත් කුමරුගේ ළමා අවධියේ වැදගත් සිදුවීම් දැන ගනියි.
2. සිදුහත් කුමරු මැනවින් ශිල්ප ශාස්ත්‍ර හැදෑරූ බව පිළිගනිමින් කතා කරයි.
3. සිදුහත් කුමරු උපතේ සිට රජසිරි විඳීම දක්වා වැදගත් සිදුවීම් ලයිස්තු ගත කරයි.
4. මැනවින් ශිල්ප ශාස්ත්‍ර හදාරයි.
5. අභියෝග ජයගනියි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්:-**

**I** පෙර සූදානම,

- බෝසතුන්ගේ කුමාර විය හා රජසිරි විඳි වකවානුව පිළිබඳ තොරතුරු සොයාගෙන ඒවා දැනුම්වත් කරන්න.

**II** ප්‍රවේශය

- ඇමුණුම 1හි දක්වා ඇති අසිත තාපසතුමාණන්ට සිදුහත් කුමරු පෙන්වන අවස්ථාව නිරූපණය වන චිත්‍රය ඉදිරිපත් කරන්න.
- එම සිතුවමෙහි ඇති අවස්ථා පිළිබඳ සිසුන්ගෙන් කරුණු විමසමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
- සාකච්ඡාව අවසානයේ මතු බුදුවන බෝසත් කුමරුගේ ඉපදීම සිදුවන බව ඉස්මතු කර ගන්න.

**පාඩම් සංවර්ධනය:-**

- සුද්ධෝදන රජුගේ පියා වූ සිංහහනු රජුට පුරෝහිත වූ අසිත හෙවත් කාලදේවල බමුණා පිළිබඳ සාකච්ඡා කිරීම.

- අසිත තාපසතුමාට සිදුහත් කුමරු පෙන්වීම හා පිය රජතුමාගේ පළමු වැඳීම පිළිබඳ සිදුවීම විස්තර කරන්න.
- අසිත තාපසතුමා කුමරු ඒකාන්තයෙන් ම බුදුවනු දැක සිනාසීමට හා හැඬීමට හේතු වූ කරුණු සාකච්ඡා කරන්න.
- නාලක කුමරුගේ පැවිදි වීම.
- සිදුහත් කුමරුට නම් තැබීමේ උත්සවය රාම , ධජ , ලක්ඛණ , මන්ති කොණ්ඩඤ්ඤ , භෝජ , සුයාම , සුදත්ත යන බමුණු පඬිවරුන් එකසිය අට දෙනෙකුගේ සහභාගිත්වයෙන් සිදු වූ කතා පුවත සාකච්ඡාවට බඳුන් කරන්න.
- අෂ්ට සමාපත්ති - ප්‍රථම ධ්‍යානය, ද්විතීය ධ්‍යානය, තෘතීය ධ්‍යානය, ආකාසානඤ්චායතනය, විඤ්ඤාණඤ්චායතනය, ආකිඤ්චඤ්ඤායතනය, නේවසඤ්ඤානාසඤ්ඤායතනය බව.
- සිද්ධාර්ථ යන නම තැබීමට හේතු පැහැදිලි කරන්න.
- මහාමායා දේවියගේ කළුරිය කිරීමත්, වප් මඟුලත් පිළිබඳ කරුණු සෙවීමේ ක්‍රියාකාරකම්වල ශිෂ්‍යයින් යොමු කරන්න.
- සිදුහත් කුමරුගේ තරුණවිය හා බැඳුණු වැදගත් සිදුවීම් ලැයිස්තුගත කරවන්න.
- සිදුහත් කුමරුගේ ස්වයංවර විවාහය පැහැදිලි කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
- තක්සේරුකරණ නිර්ණායක ගුරුවරයා විසින් මැනවින් අවබෝධ කරගෙන එම නිර්ණායකවලට අදාළව ශිෂ්‍යයන් තක්සේරුකරණය කරන්න.
- අපේක්ෂිත සාධන මට්ටම්වලට ළඟා නොවූ සිසුන් වේ නම් ඒ සඳහා සුදුසු ප්‍රතිපෝෂණ ක්‍රියාවලියක නිරත කරවන්න.

**මූලික වදන් හා සංකල්පඃ-**

- අසිත තාපසතුමා කාලදේවල නමින් ද හැඳින්වෙන බව
- අසිත තාපසතුමා අෂ්ට සමාපත්තිලාභී දිව්‍යැස් ලැබූ ඍද්ධිමතෙකු බව
- සොළොස - දහසය
- ස්වයංවර විවාහය - දෙමාපිය කැමැත්ත මත තමාට කැමති සහකාරියක තෝරාගැනීම බව
- අනගාරික - රති බැඳීම්වලින් තොරව වාසය කිරීම.

**ගුණාත්මක යෙදවුම්ඃ-**

- අසිත තාපසතුමාට සිදුහත් කුමරු පෙන්වන ලද අවස්ථාව නිරූපිත චිත්‍රය (සියලු සිසුන්ට පෙනෙන ලෙස සකස්කර තිබිය යුතුය)
- ගුරු මාර්ගෝපදේශය
- පෙළපොතේ හතර වන පාඩම

## ඇගයීම් හා තක්සේරුකරණය සඳහා නිර්ණායක:-

පහත සඳහන් නිර්ණායක යොදාගන්න.

- සිදුහත් කුමරුගේ ළමා අවධියේ වැදගත් සිදුවීම් ලැයිස්තු ගත කිරීම.
- සිදුහත් කුමරු ශිල්ප ශාස්ත්‍ර හැදෑරූ අවස්ථාවේ ශිෂ්‍යයෙකුට ගත හැකි ආදර්ශ පැහැදිලි කිරීම.
- සිදුහත් කුමරුගේ තරුණවිය ගත කළ වකවානුවේ වැදගත් තොරතුරු ලැයිස්තු ගත කිරීම.

## වැඩිදුර පරිශීලනයට:-

- ඇමුණුම අංක 1 - ප්‍රවේශය සඳහා
- බුද්ධ චරිතය - වල්පොල රාහුල හිමි
- සම්බුදු සිරිත - කේ.ඩී.වික්‍රමසිංහ
- අමාවතුර - ඥානාලෝක සංස්කරණය
- බුදුන් දැකීම - සෙනෙවිරත්න මහ ලේකම්

# 5 පාඩම
## ජීවිතයේ සැබෑතතු හෙළිකළ පෙර නිමිති

**නිපුණතාව:- 1.0**

- සාර්ථක භික්ෂු ජීවිතයක් උදෙසා තෙරුවන ගුණ හැඳින චරිතායනය කරයි.

**නිපුණතා මට්ටම:- 1.2**

- බුද්ධ චරිතයෙහි එන දුෂ්කර ක්‍රියාකිරීම හා බුද්ධත්වයේ සුවිශේෂී බව හැඳින ආදර්ශයෙන් කටයුතු කරයි.

**කාලපරිච්ඡේද:-** 06 යි

**ඉගෙනුම් පල:-**

1. නිබ්බුත පද ඉගෙන ගනියි.
2. සතර පෙර නිමිති ගිහිගෙය හැරයාමට හේතු වූ බව පිළිගනිමින් කරුණු දක්වයි.
3. මහාභිනිෂ්ක්‍රමණය හා බැඳුණු සිදුවීම් ගොනු කරයි.
4. අකම්පිතව කටයුතු කරයි.
5. අරමුණු ගත ජීවිතයක් ගත කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්:-**

**I** පෙර සූදානම,

- ජීවිතයේ සැබෑ තතු හෙළිකළ පෙර නිමිති පාඩම කියවා පැමිණෙන ලෙස ශිෂ්‍යයින් දැනුම්වත් කරන්න.

**II** ප්‍රවේශය

- ඇමුණුම 1 හි සඳහන්
  "නිබ්බුතා නූන සා මාතා" යන නිබ්බුත පද ඇතුළත් පුවරුව සිසුන්ට හොඳින් පෙනෙන සේ ප්‍රදර්ශනය කොට නිවැරදිව ගායනා කොට සිසුන් සමග ද ගායනය කරන්න.
- මෙහි නිබ්බුත පදවල අදහස සිසුන් සමග සාකච්ඡා කරමින් නිවන පිළිබඳ අදහස ඉස්මතු කරගන්න.

**පාඩම් සංවර්ධනය:-**

- සිදුහත් කුමරු ඡන්න ඇමති සමඟ උයන් සිරි විඳිනු පිණිස යන ගමනේ දී මහලු රුවක් දැක ඒ පිළිබඳ ඡන්න සමඟ පැවති සාකච්ඡාවත් ඉදිරි දින කිහිපයකදී ගිලනෙක්, මළ කඳක් හා පැවිදි රුවක් දැක කළ සාකච්ඡාවත් පිළිබඳ සිසුන්ට කරුණු පහදා දෙන්න.

- සතර පෙර නිමිති පිළිබඳ සිසුන්ගෙන් අදහස් විමසන්න.
- සතර පෙර නිමිතිවලින් පළමු නිමිති තුන කලකිරීම් බවත් අනෙක් නිමිත්ත නිවනට මග බවත්
- පැවිදි රුව දැකීමෙන් නිවීමේ මගක් ඇතිබව වැටහුණු බව සාකච්ඡා කරන්න.
- උයන් සිරි විඳීමත් යශෝදරාවට පුතෙකු ලැබීමත් යන සිදුවීම් සාකච්ඡාවට ලක්කරමින් කරුණු අවබෝධයට මග පාදන්න.
- සුදොවුන් රජතුමා තම මුණුබුරු කුමරුට රාහුල යැයි නම් තැබීමට හේතු සාකච්ඡාවට බඳුන් කරන්න.
- නිබ්බුත පද ඇසීමේ කතා පුවත නැවත සාකච්ඡාවට ලක්කරන්න.
- නිබ්බුත පදෙන් පදයට අරුත් පැහැදිලි කරන්න.
- රාග ගින්න, ද්වේෂ ගින්න, මෝහ ගින්න නිවීම ඉන් අර්ථවත් වන බව පහදන්න.
- කිසා ගෝතමීයට තුටු පඬුරු ලෙස ලක්ෂයක් අගනා මුතුහර ත්‍යාග කොට යැවීමේ පුවත තහවුරු කරන්න.
- මහාභිනිෂ්ක්‍රමණය සිදු වූ පුවත කණ්ඩායම් ක්‍රියාකාරකමක් ලෙස සිසුන්ට ලබා දී උයන් කෙළිය නිමවා පැමිණීමේ සිට ගිහිගෙයින් නික්මීම දක්වා තොරතුරු සාකච්ඡාවට බඳුන් කරන්න.
- එය ඇසළ පොහෝ දිනක සිදු වූ බව තහවුරු කරන්න.
- තක්සේරුකරණ නිර්ණායක ගුරුවරයා විසින් මැනවින් අවබෝධ කරගෙන එම නිර්ණායකවලට අදාළව ශිෂ්‍යයන් තක්සේරුකරණය කරන්න.
- අපේක්ෂිත සාධන මට්ටම්වලට ළඟා නොවූ සිසුන් වේ නම් ඒ සඳහා සුදුසු ප්‍රතිපෝෂණ ක්‍රියාවලියක නිරත කරවන්න.

**මූලික වදන් හා සංකල්පඃ-**

- සාරාසංඛ්‍යය කල්ප ලක්ෂයක් මුළුල්ලේ කරුණාව හා ප්‍රඥාව වැඩීමෙන් ප්‍රබුද්ධ වූ බුද්ධියක් පැවති අතර සුදුසු පරිසරයේදී පරිණත භාවයට පත්වූ බව.
- ව්‍යාධිය - ලෙඩ වීම
- සතර බිය - ජාති, ජරා, ව්‍යාධි, මරණ
- රාහුල යන වචනයෙන් බැම්මක් ඇති වීම අවශ්‍යතාව බව
- එකුන් තිස්විය - වයස අවුරුදු 29
- සයනාගාරය - නිදන කාමරය

**ගුණාත්මක යෙදවුම්ඃ-**

- ඇමුණුම 1 හි සඳහන් නිබ්බුත පද ලියන ලද පුවරුව
- ගුරුමාර්ගෝපදේශය
- පෙළපොතේ පස්වන පාඩම

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා නිර්ණායකඃ-**

- නිබ්බුත පද කට පාඩමෙන් කීම.
- සතර පෙර නිමිතිවල විග්‍රහය පැහැදිලි කිරීම.
- අභිනිෂ්ක්‍රමණය හා බැඳුණු සිදුවීම් සාරාංශව පැවසීම.
- මහාභිනිෂ්ක්‍රමණය හා බැඳුණු සිදුවීම් චිත්‍රයට නැඟීම.

**වැඩිදුර පරිශීලනයටඃ-**

- ඇමුණුම අංක 1 - ප්‍රවේශය සඳහා
- සම්බුදු සිරිත - ආචාර්ය කේ.ඩී.පී.වික්‍රමසිංහ
- අමාවතුර - ඥානාලෝක සංස්කරණය (17 පිටුව)
- ශාක්‍ය සිංහාවධානය හෙවත් බුද්ධ චරිතය - පූජ්‍ය බලන්ගොඩ ආනන්ද මෛත්‍රිය හිමි
- බුදුන් දැකීම - සෙනෙවිරත්න මහ ලේකම්
- මජ්ඣිම නිකාය - අරිය පරියේසන සූත්‍රය
- බුද්ධ චරිතය - දහම් පාසල් අවසාන විභාගය

# 6 පාඩම
# බෝසතාණෝ නිවන් සුව ළඟා කරන පැවිදි බිමට පිවිසෙති

**නිපුණතාව:- 1.0**

- සාර්ථක භික්ෂු ජීවිතයක් උදෙසා තෙරුවන ගුණ හැඳින චරිතායනය කරයි.

**නිපුණතා මට්ටම:- 1.2**

- බුද්ධ චරිතයෙහි එන දුෂ්කර ක්‍රියාකිරීම හා බුද්ධත්වයේ සුවිශේසි බව හැඳින ආදර්ශයෙන් කටයුතු කරයි.

**කාලපරිච්ඡේද:-** 07 යි

**ඉගෙනුම් පල:-**

1. සිදුහත් කුමරු අනෝමා ගංතෙරදී පැවිදි බිමට ඇතුළත් වූ පුවත දැන ගනියි.
2. සිදුහත් තවුසා හා බිම්බිසාර රජතුමා හමු වූ පුවත පිළිගෙන කරුණු ප්‍රකාශ කරයි.
3. සිදුහත් තවුසා ආචාර්යවරුන්ගෙන් ලබාගත් අෂ්ට සමාපත්ති ලැයිස්තුගත කරයි.
4. දහම් පොත පත ඇසුරු කරයි.
5. අවබෝධ ශක්තිය වර්ධනය කරගනියි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්:-**

**I** පෙර සූදානම,

- 6 වැනි පාඩම හොඳින් අධ්‍යයනය කොට පැමිණෙන ලෙස සිසුන් දැනුම්වත් කරන්න.

**II** ප්‍රවේශය

- ඇම්. සාර්ලිස් චිත්‍ර ශිල්පියා විසින් අඳින ලද පැවිදි බිමට ඇතුළත් වන අවස්ථාව ඇතුළත් චිත්‍රය ප්‍රදර්ශනය කරන්න.
- මෙම සිතුවමෙහි ඇතුළත් අවස්ථා පිළිබඳ සිසුන්ගෙන් විමසන්න.
- සාකච්ඡාවක් මෙහෙය වන්න.
- සිදුහත් බෝසතාණන් වහන්සේගේ පැවිදිවීම ඉස්මතු කරගන්න.

**පාඩම් සංවර්ධනය:-**

- ඇසළ පුන් පොහොය දින මධ්‍යම රාත්‍රියේ සිට රෑ පහන්වන අවස්ථාව දක්වා ශාක්‍ය කෝලිය, මල්ල යන රාජ්‍ය තුනක් පසුකොට තිස් යොදුන් මග ගෙවා අනෝමා ගං තෙරට සැපත් පුවත පිළිබඳ සාකච්ඡාවක් මෙහෙයවන්න.
- ඡන්නගේ නික්ම යාමත්, සිදුහත් කුමරු පැවිදි බිමට ඇතුළත්වීමත් පිළිබඳ තොරතුරු සාකච්ඡා කරන්න.

- සටීකාර මහා බ්‍රහ්මයා අට පිරිකර පූජා කිරීමත්, කන්ථක අසු මිය යාමත් පිළිබඳ තොරතුරු ප්‍රශ්නෝත්තර ක්‍රමයට සිසුන්ගෙන් විමසන්න.
- රජගහ නුවරට සැපත්වීම පිළිබඳ පුවත සිසුන් කණ්ඩායම් කොට පිළිතුරු ලිවීමට අවස්ථාව ලබාදෙන්න.
- කණ්ඩායම් ක්‍රියාකාරකම් සඳහා බිම්බිසාර රජු හමුවීම, දෙදෙනා අතර සිදු වූ සාකච්ඡාව, රාජ්‍ය පවරාදීමට කටයුතු කිරීම සාකච්ඡා කරන්න.
- තම රාජ්‍යයට බුදුරජාණන් වහන්සේ වැඩමවා ගැනීමට කටයුතු කිරීමට ආරාධනා කිරීමේ පුවත ද ඇතුළත් කරන්න.
- ආචාර්යවරුන් සොයායෑම් පිළිබඳ කථා පුවත සිසුන් කණ්ඩායම් කොට ක්‍රියාකාරකම් සඳහා යොමුකොට පිළිතුරු ලබා ගන්න.
- ක්‍රියාකාරකම් මාතෘකා ලෙස
- සොයාගිය ආචාර්යවරුන්
- ඒ ඒ ආචාර්යවරුන්ගෙන් ලබාගත් දැනුම
- අෂ්ට සමාපත්ති නම් කිරීම.
- ඒවා විස්තර කිරීම ආදී කරුණු ඇතුළත් කරන්න.
- තක්සේරුකරණ නිර්ණායක ගුරුවරයා විසින් මැනවින් අවබෝධ කරගෙන එම නිර්ණායකවලට අදාළව ශිෂ්‍යයන් තක්සේරුකරණය කරන්න.
- අපේක්ෂිත සාධන මට්ටම්වලට ළඟා නොවූ සිසුන් වේ නම් ඒ සඳහා සුදුසු ප්‍රතිපෝෂණ ක්‍රියාවලියක නිරත කරවන්න.

**මූලික වදන් හා සංකල්පඃ-**

- ගිහිගෙය හැරයාම - අභිනිෂ්ක්‍රමණය, මහාභිනිෂ්ක්‍රමණය එකම අදහස ඇති වචන බව.
- සටීකාර - මහා බ්‍රහ්මයෙකි.
- සිළුමිණි සෑය - තව්තිසා දෙව්ලොව ඉදිකර ඇති සෑයකි.
- අදෘශ්‍ය මිත්‍රයෙකු - නොදුටු මිතුරෙකු.
- කිං කුසල ගවේසී - කුසලය කුමක්ද ? එය සෙවිය යුතු බව.
- කිං සච්ච ගවේසී - සත්‍ය කුමක්ද ? එය සෙවිය යුතු බව.
- ආලාරකාලාම තවුසා රූපාවචර ධ්‍යාන හතර හා ආකිඤ්චඤ්ඤායතනය දක්වා වූ අරූපාවචර ධ්‍යාන තුනක් ද ලබා සිටි අයෙකි.
- උද්දකරාමපුත්ත තවුසා නේවසඤ්ඤානාසඤ්ඤායතනය අරූපාවචර ධ්‍යාන සතරක්ව ලබා සිටි අයෙකි.

**ගුණාත්මක යෙදවුම්:-**

ඇමුණුම 01

- ඇම්.සාර්ලිස් සිතුවම් ශිල්පියා විසින් සිතුවම් කරන ලද සිදුහත් තවුසා පැවිදි බිමට ඇතුළත්වන සිතුවම සහිත පුවරුව
- ගුරුමාර්ගෝපදේශය
- පෙළපොතේ හයවන පාඩම

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා නිර්ණායක:-**

- සිදුහත් රජු පැවිදි බිමට ඇතුළත් වූ පුවත මතකයෙන් විස්තර කිරීම.
- සිදුහත් තවුසා හා බිම්බිසාර රජු හමු වූ අවස්ථාව සිතුවමට නැගීම.
- අෂ්ට සමාපත්ති ලැයිස්තුගත කිරීම.
- "සිදුහත් බෝසතාණෝ පැවිදි බිමට පිවිසෙති" යන මැයෙන් රචනයක් ගොඩනැගීම.

**වැඩිදුර පරිශීලනයට:-**

- ඇමුණුම අංක 1 - ප්‍රවේශය සඳහා
- බුදුන් දැකීම - සෙනෙවිරත්න මහ ලේකම්
- සම්බුදු සිරිත - ආචාර්ය කේ.ඩී.පී.වික්‍රමසිංහ

# 7 පාඩම
# අප වෙනුවෙන් බෝසතාණන් සය අවුරුද්දක් විඳිදුක්

**නිපුණතාව:- 1.0**

- සාර්ථක භික්ෂු ජීවිතයක් උදෙසා තෙරුවන ගුණ හැඳින චරිතායනය කරයි.

**නිපුණතා මට්ටම:- 1.2**

- බුද්ධ චරිතයෙහි එන දුෂ්කර ක්‍රියාකිරීම හා බුද්ධත්වයේ සුවිශේෂී බව හැඳින ආදර්ශයෙන් කටයුතු කරයි.

**කාලපරිච්ඡේද:-** 04 යි

**ඉගෙනුම් පල:-**

1. පස්වග තවුසන් පිළිබඳ විස්තර දැන ගනියි.
2. සිදුහත් බෝසත්තුමා සය අවුරුද්දක් දුෂ්කර ක්‍රියාවේ යෙදුණු බව පිළිගනිමින් ඒ පිළිබඳ කරුණු ගෙන හැර දක්වයි.
3. සිදුහත් බෝසත්තුමාගේ දුෂ්කර ක්‍රියාව ආරම්භයේ සිට අවසානය දක්වා පිළිවෙළින් විස්තර කරයි. (සාරාංශ කරයි)
4. අභියෝග ජයගනිමින් ඉගෙනුමෙහි යෙදේ.
5. යහපත් අරමුණු ඉටුකර ගනී.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්:-**

I පෙර සූදානම,

- සිදුහත් බෝසතාණන් වහන්සේගේ දුෂ්කර ක්‍රියාව පිළිබඳ තොරතුරු රැස්කරගෙන එන ලෙස සිසුන් දැනුම්වත් කරන්න.

II ප්‍රවේශය

- සිදුහත් බෝසතාණන් වහන්සේගේ දුෂ්කර ක්‍රියාව දැක්වෙන සිතුවමක් සිසුන්ට ප්‍රදර්ශනය කරමින් ඒ පිළිබඳ විස්තර සාකච්ඡා කරමින් දුෂ්කර ක්‍රියාව පිළිබඳ අදහස මතුකර ගැනීම.

**පාඩම් සංවර්ධනය:-**

- කොණ්ඩඤ්ඤ, වප්ප, භද්දිය, මහානාම, අස්සජි යන පස්වග තවුසන් කුමරුට නම් තබන දිනයේ පැමිණි බමුණන් බව පැහැදිලි කරන්න.
- සිදුහත් තවුසා උරුවේල් දනව්වේ සේනානි ගම ඇසුරු කරමින් තවුස් ජීවිතය ගතකළ බව විස්තර කරන්න.
- දඹදිව සත්‍ය ගවේෂීන් අනුගමනය කළ සම්මත පිළිවෙත අත්තකිලමථානුයෝගය හා කාමසුඛල්ලිකානුයෝගය බව පැහැදිලි කරන්න.

- සිදුහත් බෝසතාණන් වහන්සේගේ දුෂ්කර ක්‍රියාව සිදු වූ ආකාරය කණ්ඩායම් ක්‍රියාකාරකම් ලෙස ගවේෂණ පත්‍රිකා ලබාදෙමින් ක්‍රියාකාරකමෙහි නිරත කරන්න.
- කණ්ඩායම් විසින් ක්‍රියාකාරකම් අනාවරණ ඉදිරිපත් කිරීමෙන් පසු, දුෂ්කර ක්‍රියාවෙන් ඵලක් නොවූ බවත් අවැඩ සහගත වූ මාර්ගයේ ගමන් කිරීම බුද්ධිමත්කම නොවන බවත් තහවුරු කරමින් ඵල රහිත දෙයින් නිවැරදි දෙයට ගමන් කිරීම පිළිබඳ සාකච්ඡා කරන්න.
- සිදුහත් බෝසතාණෝ දැඩිලෙස ශරීරයට දුක්දෙන විට සිහිසුන් ව මළුවේ ඇද වැටුණු අවස්ථාවේ වූ සිදුවීම.
- සිදුහත් තවුසා "මළේ" යැයි සුදොවුන් රජතුමාට දැක්වූ පණිවිඩය විස්තර කරන්න.
- සුදොවුන් රජු පුතු ගැන තිබූ විශ්වාසය අවධාරණය කරන්න.
- පස්වග තවුසන් සිදුහත් බෝසතාණන් හැරගිය පුවත විස්තර කරන්න.
- සිදුහත් බෝසතාණෝ මැදුම් පිළිවෙත අනුගමනය කරමින් කටයුතු කළ ආකාරය පැහැදිලි කරන්න.
- ආනාපානසති භාවනාව නිර්වාණයට මඟවිය යුතු බව තීරණය කළ ආකාරය පැහැදිලි කරන්න.
- තක්සේරුකරණ නිර්ණායක ගුරුවරයා විසින් මැනවින් අවබෝධ කරගෙන එම නිර්ණායකවලට අදාළව ශිෂ්‍යයන් තක්සේරුකරණය කරන්න.
- අපේක්ෂිත සාධන මට්ටම්වලට ළඟා නොවූ සිසුන් වේ නම් ඒ සඳහා සුදුසු ප්‍රතිපෝෂණ ක්‍රියාවලියක නිරත කරවන්න.

**මූලික වදන් හා සංකල්පඃ-**

- අත්තකිලමථානුයෝගය - අසීමිත දැඩි ආත්ම පීඩාවෙහි යෙදීමයි.
- "පවත්ත ඵල භෝජීව" - අතේ දුරට වැටෙන කොළ, ගෙඩි ආදිය ආහාරයට ගැනීමයි.
- අප්‍රාණක ධ්‍යානය - මුඛයෙන් නාසයෙන් ආශ්වාස ප්‍රාශ්වාස කිරීම නවතා දැමීම, ශරීරය තුළ හුස්ම නතරකර ගැනීම.

**ගුණාත්මක යෙදවුම්ඃ-**

- ඇමුණුම 1 ප්‍රවේශය සඳහා දුෂ්කර ක්‍රියාව සිතුවම දැක්වෙන පුවරුව
- පෙළපොතේ හත්වන පාඩම
- ගුරුමාර්ගෝපදේශ සංග්‍රහය

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා නිර්ණායකඃ-**

- පස්වග තවුසන් නම් කිරීම.
- සය අවුරුදු දුෂ්කර ක්‍රියාව වැදගත් සිදුවීම් මතකයෙන් පෙළගැස්වීම.
- සිදුහත් බෝසත්තුමාගේ දුෂ්කර ක්‍රියාවෙන් ශිෂ්‍ය දිවියට ගතහැකි ආදර්ශ ලැයිස්තු ගත කිරීම.
- සය අවුරුදු දුෂ්කර ක්‍රියාව යන මැයෙන් කවි පන්තියක් නිර්මාණය කිරීම.

**වැඩිදුර පරිශීලනයටඃ-**

ඇමුණුම අංක 1 - ප්‍රවේශය සඳහා

- ශාක්‍ය සිංහාවදානය හෙවත් බුද්ධ චරිතය - පූජ්‍ය බලන්ගොඩ ආනන්ද මෛත්‍රිය හිමි

# 8 පාඩම
## උතුම් වූ බුදුබව පසක් කළ සේක.

**නිපුණතාව:- 1.0**

- සාර්ථක භික්ෂු ජීවිතයක් උදෙසා තෙරුවන ගුණ හැඳින චරිතායනය කරයි.

**නිපුණතා මට්ටම:- 1.2**

- බුද්ධ චරිතයෙහි එන දුෂ්කර ක්‍රියාකිරීම හා බුද්ධත්වයේ සුවිශේෂී බව හැඳින ආදර්ශයෙන් කටයුතු කරයි.

**කාලපරිච්ඡේද:-** 07 යි

**ඉගෙනුම් පල:-**

1. බුද්ධත්වයට පෙර දුටු සිහින පහ දැන ගනියි.
2. මැදුම් පිළිවෙත අනුව යමින් බුද්ධත්වය ලැබූ බව පිළිගනිමින් තම අදහස් ප්‍රකාශ කරයි.
3. ත්‍රිවිද්‍යා නම් කර අදහස පැහැදිලි කරයි.
4. නිවැරදි දේ තෝරා ගනියි.
5. ධාර්මික ජීවිතයක් ගත කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්:-**

**I** පෙර සූදානම,

- පෙළපොතෙහි අටවෙනි පාඩම කියවා පැමිණෙන ලෙස සිසුන් පෙර දින දැනුම්වත් කරන්න.

**II** ප්‍රවේශය

- අනේකජාති සංසාරං..... යන ගාථාව ලියන ලද පුවරුව සිසුන්ට ප්‍රදර්ශනය කර එය සජ්ඣායනය කර සිසුන් සමග ද සජ්ඣායනය කිරීම.

**පාඩම් සංවර්ධනය:-**

- අසිරිමත් වෙසක් පෙහෝ දිනට පෙර දින රාත්‍රියේ බුදුරජාණන් වහන්සේ දුටු සිහින පහ පැහැදිලි කරන්න.
- සුජාතා සිටු දුව පිරිනැමූ කිරිපිඬු දානය පිළිබඳ සාකච්ඡාවක් මෙහෙයවන්න.
- සුපතිට්ඨිත නම් තොටුපොළෙන් ස්නානය කිරීමත් පිරිනැමුණ කිරිබත පිඬු හතළිස් නවයක් කොට වැළඳූ පුවතත් සාකච්ඡා කරන්න.
- වෙසක් පොහෝ දින සවස් යාමයේ ඇසතු බෝරුක මුලට වැඩම කිරීම දක්වා සිදුවූ වැදගත් සිදුවීම් එකින් එක පැහැදිලි කරන්න.
- දස මාර පරාජය සිදුකළ ආකාරය කණ්ඩායම් වලට පැවරුම් ලබාදී කරුණු වාර්තා කිරීමට සිසුන් යොමු කරන්න.
- කණ්ඩායම් අනාවරණ ඉදිරිපත් කිරීම්වලදී පිළිතුරු සනාථ කරමින් මාර පරාජයට හේතු සාධක ඉදිරිපත් කරන්න.

- මාර පරාජයෙන් පසු ආනාපානසති භාවනාවේ යෙදී ධ්‍යාන උපදවාගත් අයුරු පැහැදිලි කරන්න.
- ත්‍රිවිද්‍යා අවබෝධකරගත් ආකාරය පැහැදිලි කොට අලුයම් වේලාවේ පටිච්ච සමුප්පාදයට සිත යොමු කළ බව විස්තර කරන්න.
- අරුණලු නැගෙනවාත් සමගම සර්වඥතා ඥානයෙන් සම්බුදු පදවිය ලැබූ පුවත සාකච්ඡාවට බඳුන් කරන්න.
- උදාන ප්‍රකාශය කට පාඩම් කරවන්න.
- තක්සේරුකරණ නිර්ණායක ගුරුවරයා විසින් මැනවින් අවබෝධ කරගෙන එම නිර්ණායකවලට අදාළව ශිෂ්‍යයන් තක්සේරුකරණය කරන්න.
- අපේක්ෂිත සාධන මට්ටම්වලට ළඟා නොවූ සිසුන් වේ නම් ඒ සඳහා සුදුසු ප්‍රතිපෝෂණ ක්‍රියාවලියක නිරත කරවන්න.

**මූලික වදන් හා සංකල්ප:-**

- මැදුම් පිළිවෙත - මධ්‍යම ප්‍රතිපදාව, අරිඅට මග, ආර්ය අෂ්ටාංගික මාර්ගය සමාන අරුත් දෙන බව
- චිත්ත විසුද්ධිය - සිතෙහි පිරිසිදු බව
- ඇසතු වෘක්ෂය - අස්සත්ථ වෘක්ෂය
- චතුරංග සමන්නාගත වීර්යය "මාගේ සිරුරේ මස්, ලේ වියළී ගොස් සම්, නහර, ඇට පමණක් ඉතිරි වුවත්, බුදුවී මිස මේ අස්නෙන් නොනැගිටිමි." යන අරුත් දෙන බව.
- දිබ්බචක්ඛු දිව ඇස බව
- ආසවක්ඛ ඥාණය කෙළෙස් නැසූ බව දන්නා නුවණ බව

**ගුණාත්මක යෙදවුම්:-**

ඇමුණුම 01

- අනේක ජාති සංසාරං .. සන්ධා විස්සං අනිබ්බිසං යන ගාථාව ලියූ පුවරුව
- පෙළ පොත
- ගුරු අත්පොත

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා නිර්ණායක:-**

- බුද්ධත්වයට පෙර දුටු සිහින පහ මතකයෙන් කීම.
- මැදුම් පිළිවෙත ලැයිස්තු ගත කිරීම.
- ත්‍රිවිද්‍යා නම් කිරීම.
- "උතුම් වූ බුදු බව පසක් කළ සේක". යන මැයෙන් කතාවක් ඉදිරිපත් කරන්න.

**වැඩිදුර පරිශීලනයට:-**

- ඇමුණුම අංක 1 - ප්‍රවේශය සඳහා
- බුද්ධචරිතය - දහම් පාසල් අවසාන ශ්‍රේණිය
- සම්බුදු සිරිත - ආචාර්ය කේ.ඩී.වික්‍රමසිංහ
- බුදුන් දැකීම - සෙනෙවිරත්න මහ ලේකම්

# 9 පාඩම
## රාහුල පොඩි හාමුදුරුවෝ

**නිපුණතාව:- 2.0**

- භික්ෂු ජීවන රටාව හැඩගසා ගැනීමට, බෞද්ධ ජාතක කතා හා සිව්වණක් පිරිසේ චරිතාදර්ශ උපයෝගි කර ගනියි.

**නිපුණතා මට්ටම:- 2.1**

- බෞද්ධ ශ්‍රාවක ශ්‍රාවිකා චරිත අධ්‍යයනය කොට, ආදර්ශයෙන් කටයුතු කරයි.

**කාලපරිච්ඡේද:-** 05 යි

**ඉගෙනුම් පල:-**

1. රාහුල හිමිගේ චරිතයේ පිළිබිඹු වන විශිෂ්ට චරිත ලක්ෂණ හඳුනා ගනියි.
2. රාහුල හිමිගේ චරිත ලක්ෂණ යහපත් දරුවකු තුළ පැවතිය යුතු යැයි පිළිගනිමින් කටයුතු කරයි.
3. යහපත් දරුවකු වන්නට අනුගමනය කළහැකි යහපත් සිරිත් අගයමින් කතා කරයි.
4. කීකරුකමින් කටයුතු කරයි.
5. අනතිමානී ජීවිතයක් ගත කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්:-**

**I** පෙර සූදානම,

- පෙළ පොතෙහි නවවෙනි පාඩම හොඳින් කියවා යහපත් දරුවකු තුළ පැවතිය යුතු ලක්ෂණ පහක් ලියාගෙන පැමිණෙන ලෙස පෙර දිනයේ ශිෂ්‍යයන්ව දැනුම්වත් කරන්න.

**II** ප්‍රවේශය

- ඇමුණුම 01 හි දැක්වෙන "රාහුල කුමරු දායාද ඉල්ලමින් බුදුරජාණන් වහන්සේ අතේ එල්ලී විහාරයට යන රූප රාමුව හා ඇමුණුම 02 හි දැක්වෙන "රාහුල පොඩි හාමුදුරුවෝ වැලි දෝතක් උඩ දමා ප්‍රාර්ථනා කරන " රූප රාමු පන්තියට ඉදිරිපත් කරන්න.
- ඉන්පසු එම රූප රාමු පිළිබඳ ව සිසුන්ගෙන් විමසමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
- පළමු රූප රාමුවෙන් නිරූපණය වන්නේ කවුරුන් ද ? යන වග හඳුනා ගැනීමට ශිෂ්‍යයා වෙත අවධානය යොමු කරමින් රාහුල තෙරුණුවන්ගේ චරිතය හඳුන්වා දෙන්න.
- අනතුරුව දෙවන රූප රාමුව ඉදිරිපත් කරමින් රාහුල පොඩි හාමුදුරුවන් තුළ පැවති චරිතාදර්ශ ඉස්මතු කරගැනීමට සිසුන් මෙහෙය වන්න.

**පාඩම් සංවර්ධනය:-**

- රාහුල කුමාරයා සිදුහත් කුමරුගේ සහ යසෝදරා දේවියගේ පුත්‍රයා බව විස්තර කරන්න.
- රාහුල කුමරුගේ උපතින් පසු සිදුහත් කුමරුගේ අභිනිෂ්ක්‍රමණය සිදු වූ බව පැහැදිලි කරන්න.
- යශෝධරා දේවිය සඳලුතලයේ සිට රාහුල කුමාරයාට නරසීහ ගාථාවලින් බුදුරජාණන් වහන්සේ හඳුන්වා දෙමින් දායාද ඉල්ලීමට පිටත් කළ බව සාකච්ඡා කරන්න. (මෙහිදී නරසීහ ගාථා වලින් කිහිපයක් ලයාන්විතව ගායනා කර පෙන්වීම සුදුසු ය.)
- බුද්ධ ශාසනයේ ළමයෙකු මහණ කළ පළමු වතාව රාහුල පොඩි හාමුදුරුවන්ගේ පැවිද්ද බවත් පැහැදිලි කරන්න.
- රාහුල පොඩි හාමුදුරුවන්ගේ උපාධ්‍යායන් වහන්සේ ලෙස සැරියුත් මහරහතන් වහන්සේත්, ආචාර්යවරයන් ලෙස මහා කාශ්‍යප මහ රහතන් වහන්සේත් කටයුතු කළ බව පැහැදිලි කරන්න.
- බුදුරජාණන් වහන්සේ රාහුල ස්වාමීන් වහන්සේට ධර්ම දේශනා කිරීම සඳහා උන්වහන්සේ වැඩසිටි කුටියට වැඩම කළ බව විස්තර කරන්න.
- අම්බලට්ඨික රාහුලෝවාද සූත්‍රයේ දී බොරුකීමේ ආදීනව දැක්වීම සඳහා ජල බඳුන හා ඇතකු උපමා කොට ගෙන රාහුල ස්වාමීන් වහන්සේට දහම් දෙසූ බව විස්තර කරන්න.
- තරුණ වියේදී මහාරාහුලෝවාද සූත්‍රය තරුණ මදය නැති කිරීම සඳහා දේශනා කළ බව පැහැදිලි කරන්න.
- චූල්ලරාහුලෝවාද සූත්‍රය ඇසීමෙන් රහත් භාවයට පත් වූ බව පෙන්වා දෙන්න.
- ශික්ෂාකාමී භික්ෂූන් අතර අග තනතුර රාහුල හාමුදුරුවන්ට හිමි වූ බව විස්තර කරමින් රාහුල හිමියන්ගේ චරිතයෙන් පිළිබිඹු වන සුවිශේෂී ගුණාංග සිසුන්ට පැහැදිලි කරන්න.
- රාහුල පොඩි හාමුදුරුවන්ගේ චරිතයෙන් සිසුන්ට ලබා ගත හැකි ආදර්ශ මතු කරමින් ඔවුන් සමග සාකච්ඡාවක යෙදෙන්න.
- තක්සේරුකරණ නිර්ණායක ගුරුවරයා විසින් කියවා මැනවින් අවබෝධ කරගෙන එම නිර්ණායකවලට අදාළව ශිෂ්‍යයන් තක්සේරුකරණය කරන්න.
- අපේක්ෂිත සාධන මට්ටම්වලට ළඟා නොවූ සිසුන් වේ නම් ඒ සඳහා සුදුසු ප්‍රතිපෝෂණ ක්‍රියාවලියක නිරත කරවන්න.

**මූලික වදන් හා සංකල්ප:-**

- මධ්‍යම ප්‍රතිපදාව - මැදුම් පිළිවෙත, ආර්ය අෂ්ටාංගික මාර්ගය, අරි අට මග
- ආචාර්යවරයන් වහන්සේ - පැවිදි කරන ගුරුවරයාගේ වගකීම් දරන භික්ෂුව
- උපාධ්‍යයන් වහන්සේ - පැවිදි උපසම්පදාවේදී ගුරු කොට ගන්නා භික්ෂුව

**ගුණාත්මක යෙදවුම්:-**

- රාහුල කුමරු දායාද ඉල්ලමින් බුදුරජාණන් වහන්සේගේ අතේ එල්ලී විහාරයට යාම හා රාහුල හිමියන් වැලි දෝතක් උඩ දමා ප්‍රාර්ථනා කරන රූප රාමු.
- ගුරුමාර්ගෝපදේශය
- පෙළ පොතේ නවවන පාඩම

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා නිර්ණායක:-**

- රාහුල පොඩි හාමුදුරුවන්ගේ චරිතයෙන් ඉගෙන ගත් යහපුරුදු පන්තියට ඉදිරිපත් කිරීම.
- "යහපත් දරුවකු තුළ පැවතිය යුතු ලක්ෂණ " මාතෘකාව යටතේ උපදෙස් පත්‍රිකාවක් සකස් කිරීම.
- දෛනික වශයෙන් සිදු කරන යහපුරුදු ඇතුළත් කිරීමට පොත් පිංචක් නිර්මාණය කිරීම.

**වැඩිදුර පරිශීලනයට:-**

- අම්බලට්ඨික රාහුලෝවාද සූත්‍රය - මජ්ඣිම නිකාය
- මහාරාහුලෝවාද සූත්‍රය- මජ්ඣිම නිකාය
- චූල්ලරාහුලෝවාද සූත්‍රය- මජ්ඣිම නිකාය

# 10 පාඩම
## මහා ප්‍රජාපතී ගෝතමී තෙරණිය

**නිපුණතාව:- 2.0**

- භික්ෂු ජීවන රටාව හැඩගසා ගැනීමට, බෞද්ධ ජාතක කතා හා සිව්වනක් පිරිසේ චරිතාදර්ශ උපයෝග කර ගනියි.

**නිපුණතා මට්ටම 2.1**

- බෞද්ධ ශ්‍රාවක ශ්‍රාවිකා චරිත අධ්‍යයනය කොට, ආදර්ශයෙන් කටයුතු කරයි.

**කාලපරිච්ඡේද :-** 06 යි

**ඉගෙනුම් පල:-**

- මහා ප්‍රජාපති ගෝතමී තෙරණිගේ චරිතය හා භික්ෂුණී ශාසනයේ ආරම්භය හැඳින ගනියි.
- මහා ප්‍රජාපති ගෝතමී තෙරණිය තුළ පැවති උදාර ගුණාංග මගින් තම චරිතය සංවර්ධනය කරගත හැකි බව පිළිගනිමින් කටයුතු කරයි.
- මහා ප්‍රජාපතී ගෝතමී තෙරණියගේ චරිතයෙන් ගත හැකි ආදර්ශවත් ලක්ෂණ මැයෙන් ලිපියක් ලියයි.
- අධිෂ්ඨානයෙන් කටයුතු කරයි.
- පරමාදර්ශී ජීවිතයක් ගත කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්:-**

I පෙර සූදානම,

- පෙළ පොතෙහි දහවන පාඩම හොඳින් කියවා පැමිණෙන ලෙස පෙර දිනයේ ශිෂ්‍යයන්ව දැනුම්වත් කරන්න.

II ප්‍රවේශය

- ඇමුණුම 01 හි සඳහන් "අෂ්ටගරු ධර්ම" ලියන ලද පුවරුව ප්‍රදර්ශනය කරමින් ඒවා එකින් එක ශිෂ්‍යයන් සමග ශබ්ද නගා කියවන්න. ඉන් පසු පහත සඳහන් ප්‍රශ්න අසමින් සාකච්ඡාව මෙහෙය වන්න.
- මෙම පුවරුවේ දැක්වෙන අෂ්ටගරු ධර්ම යනු මොනවා ද ? කවුරුන් විෂයයෙහි, කුමන සිදුවීමක් අරභයා මෙය දේශනා කරන ලද්දේ ද? යනුවෙන් විමසමින් භික්ෂුණී ශාසනයේ ආරම්භය උදෙසා මහා ප්‍රජාපති ගෝතමියගෙන් සිදු වූ සේවය කෙරෙහි අවධානය යොමු කිරීමට සිසුන් මෙහෙය වන්න.

**පාඩම් සංවර්ධනයඃ-**

- කෝලිය රට දෙව්දහ නුවර අංජන රජුට හා සුලක්ඛණා දේවියට මහාමායා හා මහා ප්‍රජාපති ගෝතමී නමින් දියණියන් දෙදෙනෙක් සිටි බව විස්තර කරන්න.
- මහාමායා දේවිය කලුරිය කිරීමෙන් පසු මහා ප්‍රජාපති ගෝතමිය සුද්ධෝදන රජතුමාගේ අගමෙහෙසිය වූ බව පැහැදිලි කරන්න.
- සිදුහත් කුමරුට උතුම් වූ මාතෘ ස්නේහයෙන් සැලකූ බව විස්තර කරන්න.
- සුද්ධෝදන රජුට හා මහා ප්‍රජාපති ගෝතමියට නන්ද නම් පුත් කුමරකු හා නන්දා නම් දූ කුමරියක සිටි බව පැහැදිලි කරන්න.
- මහා ප්‍රජාපති ගෝතමිය බුදුරජාණන් වහන්සේගේ කිඹුල්වත්පුර ගමනේදී බණ අසා සෝවාන් වූ බව විස්තර කරන්න.
- නන්ද හා රාහුල කුමාරවරුන්ගේ පැවිද්දත්, සුදොවුන් රජුගේ පරිනිර්වාණයත් සමග සංවේගයට පත් වූ ප්‍රජාපති ගෝතමිය පැවිදි දිවියට ඇතුළත් වීමේ අවශ්‍යතාව දැඩිව දැනෙන්නට වූ බව අවධාරණය කරන්න.
- තෙවරක්ම පැවිද්ද සඳහා අවසර අයැද සිටිය ද ස්ත්‍රීන් පැවිදි කිරීමට බුදුරජාණන් වහන්සේ කැමති නොවූ බව විස්තර කරන්න.
- අෂ්ට ගරු ධර්ම පිළිගැනීමෙන් අනතුරු ව මහා ප්‍රජාපති ගෝතමිය ඇතුලු 500ක් කුල කාන්තාවන්ට පැවිද්ද ලැබුණු බව විස්තර කරන්න.
- භික්ෂුණී සමාජයේ පැවිදි උපසම්පදාව ලත් ප්‍රථම භික්ෂුණිය ප්‍රජාපති ගෝතමී තෙරණිය බව පැහැදිලි කරන්න.
- පැවිද්දෙන් නොබෝ කලකින් රහත් භාවයට පත් වූ ඇය චිරරාත්‍රඥ භික්ෂුණීන් අතුරෙන් අගතනතුර ලැබූ බව පහදන්න.
- "බුද්ධ මාතා" යන ගෞරව නාමයෙන් පිදුම් ලද මහා ප්‍රජාපති ගෝතමී තෙරණිය ත්‍රිවිද්‍යා, සිවුපිළිසිඹියා ආදි සියලු ඥාණබල ලබා සිටි බව පැහැදිලි කරන්න.
- මහා ප්‍රජාපති ගෝතමී තෙරණිය පිරිනිවන් පෑමට යන අවස්ථාවේ දී බුදුරජාණන් වහන්සේ මහසඟන පිරිවරාගෙන ඇයට පසු ගමන් කොට ගරුබුහුමන් දක්වූ බව පැහැදිලි කරමින් මහා ප්‍රජාපතී ගෝතමී තෙරණිය ආදර්ශවත් චරිතයක් වන බව සාකච්ඡා කරන්න.
- අෂ්ටගරු ධර්ම කටපාඩම් ගන්න.
- මහා ප්‍රජාපති ගෝතමී තෙරණියගේ චරිතයෙන් ගත හැකි ආදර්ශ අභ්‍යාස පොතෙහි සටහන් කරගැනීමට උපදෙස් දෙන්න.
- තක්සේරුකරණ නිර්ණායක ගුරුවරයා විසින් කියවා මැනවින් අවබෝධ කරගෙන එම නිර්ණායකවලට අදාළව ශිෂ්‍යයන් තක්සේරුකරණය කරන්න.
- අපේක්ෂිත සාධන මට්ටම්වලට ළඟා නොවූ සිසුන් වේ නම් ඒ සඳහා සුදුසු ප්‍රතිපෝෂණ ක්‍රියාවලියක නිරත කරවන්න.

**මූලික වදන් හා සංකල්පඃ-**

- ත්‍රිවිද්‍යා -

01. පුබ්බේ නිවාසානුස්සති ඥානය -
පෙර විසූ ජාතීන්හි ස්කන්ධ පරම්පරාව සිහි කර දන ගන්නා නුවණ

02. චුතුපපාත ඥානය -
සත්ත්වයාගේ මරණය පිළිබඳ හා නැවත ඉපදීම පිළිබඳ දැනගත හැකි නුවණ. මෙම ඥානය දිබ්බචක්ඛු ඥානය ලෙස ද හැඳින්වේ.

03. ආසවක්ඛය ඥානය -

සියලු කෙලෙස් දුරු කිරීමෙන් ලබාගන්නා වූ ඥානය ආසවක්ඛය ඥානය ලෙස හැඳින්වේ. සිදුහත් බෝසතාණන් වහන්සේ බුද්ධත්වයට පත් වෙසක් පොහෝ දින පශ්චිම යාමයේ දී ආසවක්ඛය උපදවාගත් බව කියැවේ.

- සිවුපිළිසිඹියාපත් ඤාණ යනු-

චතුරාර්ය සත්‍ය, පටිච්චසමුප්පාද ධර්මය, ආර්ය අෂ්ටාංගික මාර්ගය ආදි දේශනාවන් අර්ථ, ධර්ම, නිරුක්ති, පටිභාන වශයෙන් විග්‍රහ කරමින් කෙලෙස් සහමුලින්ම උදුරා දැමීමට උපකාරවන අයුරින් බුදුරජාණන් වහන්සේ දේශනා කළ ආකාරයටම ධර්මය දේශනා කිරීමට ඇති හැකියාවයි.

## ගුණාත්මක යෙදවුම්:-

ඇමුණුම 01

- අෂ්ටගරු ධර්ම ලියන ලද පුවරුවක්
- ගුරුමාර්ගෝපදේශය
- පෙළ පොතේ දහවන පාඩම

## ඇගයීම් හා තක්සේරුකරණය සඳහා නිර්ණායක:-

- මහා ප්‍රජාපති ගෝතමී තෙරණියගේ චරිතයෙන් ගත හැකි ආදර්ශ ලැයිස්තු ගත කිරීම.
- අෂ්ටගරු ධර්ම කටපාඩමින් ඉදිරිපත් කිරීම.
- "භික්ෂුණී ශාසනයේ ආරම්භය උදෙසා මහා ප්‍රජාපති ගෝතමී තෙරණියගෙන් සිදු වූ මෙහෙය" යන මැයෙන් කතාවක් කිරීම.

## වැඩිදුර පරිශීලනයට:-

- මහා ප්‍රජාපති ගෝතමී අපදානය - ඛුද්දක නිකාය, අපදාන පාළිය
- ගයාන් චානුක විදානපතිරණ, 2004, මහා ශ්‍රාවිකා චරිත, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ ප්‍රකාශනයකි.

# 11 පාඩම
# අනාථ පිණ්ඩික සිටුතුමා

**නිපුණතාව:- 2.0**

- භික්ෂු ජීවන රටාව හැඩගසා ගැනීමට, බෞද්ධ ජාතක කතා හා සිව්වණක් පිරිසේ චරිතාදර්ශ උපයෝග කර ගනියි.

**නිපුණතා මට්ටම:- 2.2**

- බෞද්ධ උපාසක උපාසිකා චරිතවලින් මතුවන ගුණාංග චරිතායනය කරයි.

**කාලපරිච්ඡේද:-** 07 යි

**ඉගෙනුම් පල:-**

1. අනේපිඬු සිටුතුමා බුදුදහමේ උන්නතිය සඳහා කරන ලද මෙහෙවර ඉගෙන ගනියි.
2 අනේපිඬු සිටුතුමාගේ චරිතයෙන් ජීවිතාදර්ශ ලැබිය හැකි බව පිළිගනිමින් කටයුතු කරයි.
3. අනේපිඬු සිටුතුමාගේ චරිතය ඇසුරෙන් උපදේශ පාඨ ගොඩනඟයි.
4. පරාර්ථකාමීව කටයුතු කරයි
5. යහපත් ජීවිතයක් ගතකරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්:-**

I පෙර සූදානම,

- පෙළ පොතෙහි 10 වන පාඩම හොඳින් කියවා පැමිණෙන ලෙස පෙර දිනයේ ශිෂ්‍යයන්ව දැනුම්වත් කරන්න.

II ප්‍රවේශය

- බුදුරජාණන් වහන්සේ වැඩිම වාර ගණනක් වස් විසූ විහාරය කුමක් දැයි සිසුන්ගෙන් විමසමින් සාකච්ඡාව මෙහෙයවන්න.
- ජේතවනාරාම විහාරය අනේපිඬු සිටුතුමා විසින් ඉදිකළ බව පැහැදිලි කරමින් අනේපිඬු සිටුතුමාගේ ජීවිතයෙන් ගත හැකි පරමාදර්ශ කෙරෙහි සිසුන්ගේ අවධානය යොමු කරවන්න.

**පාඩම් සංවර්ධනය:-**

- සැවැත් නුවර සුදත්ත නමින් සිටුවරයකු වාසය කළ බව විස්තර කරන්න.
- අසරණ දුගී ජනතාවට ආහාරපානාදියෙන් සංග්‍රහ කළ බැවින් 'අනාථ පිණ්ඩික' යන විරුද නාමයෙන් හඳුන්වන ලද බව පැහැදිලි කරන්න.
- සුදත්ත සිටුවරයා රජගහ නුවර සිටුතුමා හමුවීමට යාම හා එහිදී බුදුරජාණන් වහන්සේ මුණ ගැසුණු බව විස්තර කරන්න.

- එහිදී සුදත්ත සිටුතුමා සෝවාන් වූ බව ප්‍රකාශ කරන්න.
- බුදුරජාණන් වහන්සේ කෙරෙහි පැහැදී ජේතවනාරාමය බුදුරජාණන් වහන්සේ ප්‍රමුඛ මහා සංඝරත්නයට පූජා කළ බව විස්තර කරන්න.
- අනේපිඬු සිටුතුමා දිනකට තෙවරක් බුදුරජාණන් වහන්සේ බැහැදකින්නට දෙව්රම් වෙහෙරට ගිය බව අගයන්න.
- අනේපිඬු සිටුතුමාගේ නිවසේ දිනපතා පන්සිය නමකට දානය පිළිගැන්වූ බව පැහැදිලි කරන්න.
- අනේපිඬු සිටුතුමාගේ පූර්ණ දායකත්වයෙන් ආනන්ද බෝධිය ජේතවනාරාමයේ රෝපණය කළ බව විස්තර කරන්න.
- බුද්ධ ශාසනයේ අග්‍ර දායකයා වූ බව අවධාරණය කරන්න.
- සිටුතුමාගේ ජීවිතයේ අවසන් මොහොතේ දී සැරියුත් තෙරණුවෝ අනාථ පිණ්ඩිකෝවාද සූත්‍රය දේශනා කළ බව පැහැදිලි කරන්න.
- එයින් පසු තුසිත දෙව්ලොව උපත ලැබූ බව විස්තර කරන්න.
- තක්සේරුකරණ නිර්ණායක ගුරුවරයා විසින් කියවා මැනවින් අවබෝධ කරගෙන එම නිර්ණායකවලට අදාළව ශිෂ්‍යයන් තක්සේරුකරණය කරන්න.
- අපේක්ෂිත සාධන මට්ටම්වලට ළඟා නොවූ සිසුන් වේ නම් ඒ සඳහා සුදුසු ප්‍රතිපෝෂණ ක්‍රියාවලියක නිරත කරවන්න.

**මූලික වදන් හා සංකල්පඃ-**

- පන්සාලිස් වස යනු අවුරුදු 45 ක් බව.
- චතුමධුර - ගිතෙල්, උක්, හකුරු, මී පැණි, වෙඬරු

**ගුණාත්මක යෙදවුම්ඃ-**

- පෙළ පොතේ එකොළොස්වන පාඩම
- ගුරු මාර්ගෝපදේශය

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා නිර්ණායකඃ-**

- අනේපිඬු සිටුතුමාගේ චරිතයෙන් ගත හැකි ආදර්ශ ලියා දැක්වීම.
- "අනේපිඬු සිටුතුමාගෙන් බුදුසසුනට සිදු වූ මෙහෙය" යන මැයෙන් බිත්ති පුවත්පතට ලිපියක් සකස් කිරීම.
- අනේපිඬු සිටුතුමන්ගේ චරිත කතාවේ සිත්ගත් අවස්ථාවක් සිතුවමට නැගීම.

**වැඩිදුර පරිශීලනයටඃ-**

- අනාථ පිණ්ඩික සූත්‍රය - සංයුක්ත නිකාය.
- අනාථ පිණ්ඩිකෝවාද සූත්‍රය - මජ්ඣිම නිකාය

# 12 පාඩම
## විශාඛා මහෝපාසිකාව

**නිපුණතාව:- 2.0**

- භික්ෂු ජීවන රටාව හැඩගසා ගැනීමට, බෞද්ධ ජාතක කතා හා සිව්වණක් පිරිසේ චරිතාදර්ශ උපයෝග කර ගනියි.

**නිපුණතා මට්ටම:- 2.2**

- බෞද්ධ උපාසක උපාසිකා චරිතවලින් මතුවන ගුණාංග චරිතායනය කරයි.

**කාලපරිච්ඡේද:-** 05 යි

**ඉගෙනුම් පල:-**

1. විශාඛා මහෝපාසිකාවගේ චරිතයෙන් පිළිබිඹුවන ශ්‍රද්ධාවන්ත ගුණාංග හඳුනාගනියි.
2. ධනංජය සිටුතුමා විසින් විශාඛා සිටුදියණියට ලබාදුන් උපදේශ දහය යහපත් ජීවිතයක් උදෙසා හේතු වන බව පිළිගනිමින් කටයුතු කරයි.
3. බුදු සසුනේ උන්නතිය උදෙසා විශාඛා මහෝපාසිකාව කැපවීමෙන් කටයුතු කළ ආකාරය පිළිබඳ විස්තර කරයි.
4. ජීවිතාවබෝධයෙන් කටයුතු කරයි.
5. දැහැමි ජීවිතයක් ගත කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්:-**

I පෙර සූදානම,

- පෙළපොතෙහි දොළොස්වන පාඩම හොඳින් කියවා පැමිණෙන ලෙස පෙර දිනයේ ශිෂ්‍යයන්ව දැනුම්වත් කරන්න.

II ප්‍රවේශය

- බුදුසසුනේ අග්‍ර දායිකාව කවුරුන් දැයි සිසුන්ගෙන් විමසන්න. විශාඛා මහෝපාසිකාව විසින් බුදුසසුනේ චිරස්ථිතිය උදෙසා සිදුකළ මෙහෙවර ඇගයීමට ලක් කරමින් සාකච්ඡාව මෙහෙයවන්න.

**පාඩම් සංවර්ධනය:-**

- විශාඛාව භද්දිය නුවර ධනංජය සිටුවරයාගේ සහ සුමනා සිටුදේවියගේ දියණිය බව පැහැදිලි කරන්න.
- බුදුරජාණන් වහන්සේගෙන් ධර්මය අසා විශාඛා සිටුදියණිය හත්හැවිරිදි වියේදීම සෝවාන් වූ බව විස්තර කරන්න.
- කුඩා කල සිටම බුදුදහමට ලැදිව විනය ගරුක ජීවිතයක් ගත කළ බව විස්තර කරන්න.

- සැවැත් නුවර මිගාර සිටුවරයාගේ පුත් පූර්ණවර්ධන සමග විවාහ වූ බව පැහැදිලි කරන්න.
- විවාහ දිනයේ විශාඛාවට ඇයගේ පියා විසින් වටිනා අවවාද දහයක් ලබා දුන් බව සාකච්ඡා කරන්න.
- විවාහයෙන් පසුව ද බුදුදහමට ලැදිව කටයුතු කළ බව විස්තර කරන්න.
- අන්‍යාගමිකයෙකු වූ මිගාර සිටුවරයා බුදුදහම වෙත නැඹුරු කරවූ බව අවධාරණය කරන්න.
- 'මිගාර මාතා' නමින් ඇය ප්‍රසිද්ධ වූ බව පහදන්න.
- විශාඛාවගේ නිවසේ දිනපතා පන්සිය නමකට දානය පිළියෙල කළ බව සාකච්ඡා කරන්න.
- මේළ පළඳනාව මිල කොට විසිහත් කෝටියක් වැයකරමින් පූර්වාරාමය ඉදිකරවූ බව විස්තර කරන්න.
- බුදුරජාණන් වහන්සේ සයවසක් එහි වස්විසූ බව විස්තර කරන්න.
- කුඩා සාමණේරයන් වහන්සේලා විෂයයෙහි මවකමෙන් ආදරය, කරුණාව දක්වමින් රැකබලාගත් බව පැහැදිලි කරන්න.
- විශාඛා මහෝපාසිකාව බුදුසසුනේ අග්‍රදායිකාව වූ බවත් පැහැදිලි කරන්න.
- විශාඛා මහෝපාසිකාවගේ චරිතයෙන් ගත හැකි ආදර්ශ අභ්‍යාස පොතේ සටහන්කර ගැනීමට උපදෙස් දෙන්න.
- තක්සේරුකරණ නිර්ණායක ගුරුවරයා විසින් කියවා මැනවින් අවබෝධ කරගෙන එම නිර්ණායකවලට අදාළව ශිෂ්‍යයන් තක්සේරුකරණය කරන්න.
- අපේක්ෂිත සාධන මට්ටම්වලට ළඟා නොවූ සිසුන් වේ නම් ඒ සඳහා සුදුසු ප්‍රතිපෝෂණ ක්‍රියාවලියක නිරත කරවන්න.

**මූලික වදන් හා සංකල්පඃ-**

- පූර්වාරාමය "මිගාරමාතු පාසාදය"යනුවෙන් ද හැඳින්වෙන බව.
- මේළ පළඳනාව යනු -
  කාන්තාවන්ටම පමණක් සකස් කරන ලද ආභරණයකි. මෙය "මහලිය පළඳනාව" යනුවෙන් ද හැඳින්වෙන බව.
- පඤ්ච කල්‍යාණි ලක්ෂණ -
  - කේශ කල්‍යාණය
  - දන්ත කල්‍යාණය
  - මාංශ කල්‍යාණය
  - ඡවි කල්‍යාණය
  - වයෝ කල්‍යාණය
- නිගණ්ඨ ආගම ශ්වේතාම්බර හා දිගම්බර යනුවෙන් කොටස් දෙකකින් යුක්ත බව.

**ගුණාත්මක යෙදවුම්:-**

- ගුරුමාර්ගෝපදේශ
- පෙළපොතේ දොළොස්වන පාඩම

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා නිර්ණායක:-**

- විශාඛා මහෝපාසිකාවගෙන් බුද්ධ ශාසනයට සිදුවූ සේවය පිළිබඳ කතාවක් කිරීම.
- විශාඛා මහෝපාසිකාවගේ චරිතය පිළිබඳ වාක්‍ය දහයක් ලිවීම.
- ධනංජය සිටුවරයා විසින් විශාඛා සිටුදියණියට ලබාදුන් අවවාද දහය කට පාඩමෙන් පවසමින් එක් එක් අවවාදයේ සරල අදහස ඉදිරිපත් කිරීම.

**වැඩිදුර පරිශීලනයට:-**

- විශාඛා සූත්‍රය - ඛුද්දක නිකාය, උදාන පාළිය, මුචලින්ද වර්ගය
- විශාඛා සූත්‍රය - ඛුද්දක නිකාය, උදාන පාළිය, පාටලිගාමිය වර්ගය
- විසාඛා මනාපකායික සූත්‍රය - අංගුත්තර නිකාය, අට්ඨක නිපාතය, උපොසථ වර්ගය

# 13 පාඩම
## හොඳට නරකට දෙකට ඇසුරය

**නිපුණතාව:- 2.0**

- භික්ෂු ජීවන රටාව හැඩගසා ගැනීමට, බෞද්ධ ජාතක කතා හා සිව්වණක් පිරිසේ චරිතාදර්ශ උපයෝගි කර ගනියි.

**නිපුණතා මට්ටම:- 2.3**

- බෞද්ධ ජාතක කතා අධ්‍යයනය කොට, උතුම් චරිතාංග ආදර්ශ ඇසුරෙන් කටයුතු කරයි.

**කාලපරිච්ඡේද:-** 05 යි

**ඉගෙනුම් පල:-**

1. සත්පුරුෂයන් හා අසත්පුරුෂයන්ගේ චරිත ලක්ෂණ වෙන් වෙන්ව හඳුනාගනියි.
2. සත්පුරුෂ ඇසුර යහපත් ජීවිතයක් ගත කිරීම සඳහා හේතුවන බව පිළිගනිමින් කටයුතු කරයි.
3. සත්පුරුෂ ලක්ෂණ ලැයිස්තු ගත කරයි.
4. ප්‍රියවචන කතා කරයි.
5. අවිහිංසාවාදී ජීවිතයක් ගත කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්:-**

**I** පෙර සූදානම,

- පෙළපොතෙහි දහතුන්වන පාඩම හොඳින් කියවා එහි සිත් ගත් අවස්ථාවක් සිතුවම් කරගෙන පැමිණෙන ලෙස පෙරදිනයේ ශිෂ්‍යයන්ව දැනුම්වත් කරන්න.

**II** ප්‍රවේශය

- ඇමුණුම 01හි සඳහන් " පූතිමච්ඡං කුසග්ගෙන යො නරො උපනය්හති " යන ගාථාව ලියන ලද පුවරුව ප්‍රදර්ශනය කරමින් එය නිවැරදිව සජ්ඣායනය කර එහි අර්ථය සිසුන්ට පැහැදිලි කරන්න.
- ඉන්පසු බාලයන් යනුවෙන් මෙහි අර්ථවත් වන්නේ කවරාකාරයේ පිරිසක් පිළිබඳව ද යන්න විමසමින් බාලයන් ඇසුරු කිරීම පිරිහීමට හේතු වනබව අදහස ඉස්මතු කරමින් සාකච්ඡාව මෙහෙයවන්න.

**පාඩම් සංවර්ධනය:-**

- ජාතක කතා යනු මහ බෝසතාණන් වහන්සේ පෙරුම් පුරන කාලයේ ගත කළ ජීවිත කතා බවත් ජාතක කතා පන්සිය පනහක් තිබෙන බවත් පැහැදිලි කරන්න.

- සත්ති ගුම්බ ජාතකය පන්සිය පනස් ජාතක පොතේ එන වැදගත් ජාතකයක් බවත් ඉන් සත්පුරුෂ ඇසුරේ වැදගත්කම දැක්වෙන බවත් සඳහන් කරන්න.
- එම ජාතක කතාව දේශනා කිරීම සඳහා හේතු වූ වත්මන් කතාව පැහැදිලි කරන්න.
- අනතුරුව ජාතක කතාව පැහැදිලි කරමින් සත්පුරුෂයාගේ හා අසත්පුරුෂයාගේ ලක්ෂණ වෙන් වෙන්ව අභ්‍යාස පොතේ වගුගත කර ගැනීමට උපදෙස් දෙන්න.
- තක්සේරුකරණ නිර්ණායක ගුරුවරයා විසින් කියවා මැනවින් අවබෝධ කරගෙන එම නිර්ණායකවලට අදාළව ශිෂ්‍යයන් තක්සේරුකරණය කරන්න.
- අපේක්ෂිත සාධන මට්ටම්වලට ළඟා නොවූ සිසුන් වේ නම් ඒ සඳහා සුදුසු ප්‍රතිපෝෂණ ක්‍රියාවලියක නිරත කරවන්න.

**මූලික වදන් හා සංකල්පඃ-**

- කල්‍යාණ මිත්‍රයන් සිව්දෙනෙක් සිටින බව,
  - උපකාරක මිත්‍රයා
  - අනුකම්පක මිත්‍රයා
  - සමානසුඛදුක්ඛ මිත්‍රයා
  - අත්ථක්ඛායී මිත්‍රයා
- පාප මිත්‍රයන් සිව්දෙනෙක් සිටින බව,
  - අඤ්ඤදත්ථුහර
  - වචීපරම
  - අනුප්පියභාණී
  - අපායසහාය
- සංයුක්ත නිකායේ දේවතා සංයුක්තයේ සබ්භි සූත්‍රයෙහි සත්පුරුෂයන් ඇසුරු කිරීම නිසා ප්‍රඥාව ලැබෙන බවත්, ශෝක කාරණයන් මැද ශෝක නොකරන බවත්, නෑයන් මැද බැබළෙන බවත්, සුගතියටම යන බවත්, සෑම කල්හිම සුව සේ වාසය කළ හැකිබවත්, සියලු දුකින් මිදෙන බවත් සඳහන් ව ඇත.

**ගුණාත්මක යෙදවුම්ඃ-**

- ඇමුණුම 01හි සඳහන් " පූතිමච්ඡං කුසග්ගෙන යො නරො උපනය්හති " යන ගාථාව ලියන ලද පුවරුව
- ගුරුමාර්ගෝපදේශය
- පෙළපොතේ දහතුන්වන පාඩම

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා නිර්ණායකඃ-**

- "සත්පුරුෂ ඇසුරෙහි වැදගත්කම"යන මැයෙන් බිත්ති පුවත්පතකට ලිපියක් සකස් කිරීම.
- පාඩමෙහි සඳහන් ගාථා පාඨ මතකයෙන් ඉදිරිපත් කර එහි අරුත් පැහැදිලි කිරීම.
- පුෂ්පක ගිරවා තුළ පැවැති යහපත් ගති ලක්ෂණ පන්තිය හමුවේ ඉදිරිපත් කිරීම.
- සත්ති ගුම්බ ජාතකය මතකයෙන් ඉදිරිපත් කිරීම.

**වැඩිදුර පරිශීලනයටඃ-**

- ජාතක පාළි - ඛුද්දක නිකාය
- සබ්භි සූත්‍රය - සංයුක්ත නිකාය
- සිඟාලෝවාද සූත්‍රය - දීඝ නිකාය

# 14 පාඩම
## දෙමව්පියන්ට සැලකීමත් මහණකමකි

**නිපුණතාව:- 2.0**

- භික්ෂු ජීවන රටාව හැඩගසා ගැනීමට, බෞද්ධ ජාතක කතා හා සිව්වණක් පිරිසේ චරිතාදර්ශ උපයෝග කර ගනියි.

**නිපුණතා මට්ටම:- 2.3**

- බෞද්ධ ජාතක කතා අධ්‍යයනය කොට, උතුම් චරිතාංග ආදර්ශ ඇසුරෙන් කටයුතු කරයි.

**කාලපරිච්ඡේද:-** 06 යි

**ඉගෙනුම් පල:-**

1. සාම කුමරුගේ චරිතය ආදර්ශයට ගෙන දෙමවුපියන්ට උදව් කළ හැකි ආකාරය ඉගෙන ගනියි.
2. පැවිදිව සිටිමින් වුවද දෙමවුපියන්ට සැලකිය හැකිබව පිළිගනියි.
3. සාම කුමරුගේ චරිතයේ ගුණාංග ඉස්මතු කරමින් මවුපිය උපස්ථානයේ වැදගත්කම පිළිබඳ කතාවක් ගොඩනගයි.
4. මව්පියන්ට සලකයි.
5. මෛත්‍රියෙන් කටයුතු කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්:-**

**I** පෙර සූදානම,

- පෙළපොතෙහි දහහතරවන පාඩම හොඳින් කියවා "දෙමව්පියන්ට සැලකීම "යන මැයෙන් වාක්‍ය 5ක් ලියාගෙන පැමිණෙන ලෙස පෙර දිනයේ ශිෂ්‍යයන්ව දැනුම්වත් කරන්න.

**II** ප්‍රවේශය

- ඇමුණුම 01 හි සඳහන් සාම කුමරු තම දෙමව්පියන්ට උපස්ථාන කරන ආකාරය දැක්වෙන රූප රාමුව සිසුන් වෙත ප්‍රදර්ශනය කරන්න.
  ඉන්පසු පහත සඳහන් ප්‍රශ්න අසමින් සාකච්ඡාවක් මෙහෙය වන්න.
  - මෙම පින්තූරයෙන් දැක්වෙන්නේ කුමන අවස්ථාවක් ද?
  - එහි සිටින්නේ කවුරුන් ද? යන වග අසමින් සාම කුමරුගේ චරිතය පැහැදිලි කර දෙමව්පියන්ට සැලකීමේ වැදගත්කම ඉස්මතු කරමින් සාකච්ඡාව මෙහෙය වන්න.

**පාඩම් සංවර්ධනය:-**

- සාම ජාතකය දේශනා කිරීමට හේතු වූ වත්මන් කතාව පැහැදිලි කරන්න.
- දෙමව්පියන්ට උපස්ථාන කිරීම.

- ගිහිව සිටිමින් කළහැකි දෙයක් පමණක්ම නොවන බවත් පැවිදිව සිටිමින් වුව ද මව්පිය උපස්ථානය කළහැකි බවත් විස්තර කරන්න.
- දෙමව්පියන්ට සැලකීමේ ආනිසංස පිළිබඳ දැක්වීමට බුදුරජාණන් වහන්සේ සාම ජාතකය දේශනා කළ බවත් පැහැදිලි කරමින් සාකච්ඡාව මෙහෙය වන්න.
- බරණැස් පුරට නුදුරු වැදි ගම්මාන දෙකක විසූ දුකුල නම් වැදි පුත්‍රයාත් පාරිකා නම් දියණියත් දෙමාපියන්ගේ ආශිර්වාදයෙන් විවාහ වූ බව පැහැදිලි කරන්න.
- කම්සැප විඳීමේ ආශාවක් නොමැති නිසා ගිහි ගෙය හැරගොස් තවුස් පැවිද්දෙන් පැවිදිව හිමාලයේ මිග සම්මත නම් ගඟ අසල තවුස්දම් පිරූ බව පැහැදිලි කරන්න.
- දෙදෙනාම බ්‍රහ්මලෝකයේදී මෙන්ම සිල්වත්ව, ගුණවත්ව කරුණා මෛත්‍රිය පෙරදැරිව කටයුතු කළ බව විස්තර කරන්න.
- මේ නිසාම ඔවුන් ඇසුරේ සිටි  තිරිසන් සතුන් අතරෙහි පවා නපුරුකම් අඩුවූ බව අවධානයට දෙන්න.
- කර්ම විපාකයක් නිසා දෙදෙනාගේම ඇස් අන්ධ වූ බව විස්තර කරන්න.
- මොවුන් රැකබලා ගැනීම සඳහා සක්දෙව් රජුගේ ඉල්ලීම මත දරුවෙක් ප්‍රසූත කළබව පැහැදිලි කරන්න.
- එම දරුවාට සාම යන නම තැබූ බව පැහැදිලි කරන්න.
- සාම කුමරු සිල්වත්, ගුණවත් කරුණා මෛත්‍රිය උතුරා ගිය අයෙක් බව පැහැදිලි කරන්න.
- තම අන්ධ මව්පියන් ආදරයෙන් පෝෂණය කළ බව විස්තර කරන්න.
- දඩයමේ පැමිණි බරණැස් රජු සාම කුමරුට ඊතලයක් විද්ද බව විස්තර කරන්න.
- සාම කුමරු සමග කතාබස් කිරීමෙන් තමන්ගෙන් වැරද්දක් සිදුව ඇතිබව බරණැස් රජුට අවබෝධ වූ බව විස්තර කරන්න.
- දෙමාපියන්ගේ සත්‍ය ක්‍රියා ආනුභාවයෙනුත්, පෙර මවක් වූ බහුසෝදරී නම් දෙව්දුවගේ සත්‍ය ක්‍රියා බලයෙනුත්, වනයේ දෙවියන්ගේ ආනුභාවයෙනුත් සාම කුමරුට සිහිය ලැබුණ බව පැහැදිලි කරන්න.
- මව්පියන්ගේ ඇස් පෙනෙන්නට වූ බවත් විස්තර කරන්න.
- අනතුරුව බරණැස් රජු පංචශීලයෙහි පිහිටුවා දසරාජ ධර්මයෙන් රාජ්‍ය කරන ලෙස දන්වා පිටත් කර යැවූ බව පැහැදිලි කරන්න.
- සාම කුමරු දෙමාපියන්ට උපස්ථාන කොට දසපින් කිරියවත් පුරමින් මෛත්‍රී වඩා බඹලොව උපන් බවත් දක්වමින් දෙමව්පියන්ට උපස්ථාන කිරීම දෙලොව යහපත ගෙනදෙන උතුම් ක්‍රියාවක් බව පැහැදිලි කරමින් සාකච්ඡාව මෙහෙයවන්න.
- තක්සේරුකරණ නිර්ණායක ගුරුවරයා විසින් කියවා මැනවින් අවබෝධ කරගෙන එම නිර්ණායකවලට අදාළව ශිෂ්‍යයන් තක්සේරුකරණය කරන්න.
- අපේක්ෂිත සාධන මට්ටම්වලට ළඟා නොවූ සිසුන් වේ නම් ඒ සඳහා සුදුසු ප්‍රතිපෝෂණ ක්‍රියාවලියක නිරත කරවන්න.

**මූලික වදන් හා සංකල්පඃ-**

- මව්පියන් විෂයයෙහි යුතුකම් ඉටුකළ යුතු ආකාරය පිළිබඳ ව දීඝනිකායේ සිඟාලෝවාද සූත්‍රයෙහි සදිසා නමස්කාරයෙහි දැක්වෙන අතර එහිදී පෙරදිග දිශාව වශයෙන් සලකන මව්පියන් කෙරෙහි කරුණු පහකින් සංග්‍රහ කළයුතු බව.
    - භතෝ නෙසං භරිස්සාමි - මැනවින් පෝෂණය කිරීම
    - කිච්චං නෙසං කරිස්සාමි  -  මව්පියන්ගේ කටයුතු මැනවින් ඉටුකර දීම

- කුල වංසං ඨපෙස්සාමි කුල - පරම්පරාව ආරක්ෂාකර ගැනීම
- දායජ්ජං පටිපජ්ජාමි - දායාද නිසිපරිදි භුක්ති විඳීම

- පේතානං කාල කතානං දක්ඛිණං අනුපදස්සාමි - දෙමාපියන් මියගිය පසු ඔවුන්ට පිං පැමිණ වීම
- මාතුපෝසක සූත්‍රය සංයුක්ත නිකායේ සගාථක වර්ගයේ බ්‍රාහ්මණ සංයුක්තයේ දැක්වෙන සූත්‍රයක් බව.

**ගුණාත්මක යෙදවුම්:-**

ඇමුණුම 01

- සාම කුමරු තම දෙමව්පියන්ට උපස්ථාන කරන ආකාරය දැක්වෙන රූප රාමුව.
- ගුරු මාර්ගෝපදේශය
- පෙළපොතේ දහහතරවන පාඩම

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා නිර්ණායක:-**

- සාම ජාතක කථාව ඇසුරින් භූමිකා රංගනයක් කිරීම.
- සාම ජාතක කථාවේ සිත් ගත් අවස්ථාවක් චිත්‍රයට නැගීම.
- සාම කුමරුගේ චරිතයෙන් ගත හැකි ආදර්ශ ලියා දැක්වීම.
- "මවුපිය උපස්ථානයේ වැදගත් කම" යන මැයෙන් කතාවක් කිරීම.

**වැඩිදුර පරිශීලනයට:-**

- ස්වණ්ණ සාම චරියාව - චරියා පිටකය
- සිඟාලෝවාද සූත්‍රය - දීඝනිකාය, පාථික වර්ගය
- මංගල සූත්‍රය - ඛුද්දක නිකාය, ඛුද්දක පාඨපාළි
- ජාතක පාළි - ඛුද්දක නිකාය

# 15 පාඩම
## අප වඩා සිටුවන වැඩිහිටියෝ

**නිපුණතාව:- 2.0**

- භික්ෂු ජීවන රටාව හැඩගසා ගැනීමට, බෞද්ධ ජාතක කතා හා සිව්වණක් පිරිසේ චරිතාදර්ශ උපයෝගි කර ගනියි.

**නිපුණතා මට්ටම:- 2.3**

- බෞද්ධ ජාතක කතා අධ්‍යයනය කොට, උතුම් චරිතාංග ආදර්ශ ඇසුරෙන් කටයුතු කරයි.

**කාලපරිච්ඡේද:-** 03 යි

**ඉගෙනුම් පල:-**

1. බාහිර ස්වරූපය මත පදනම්ව වැඩිහිටි බව නිර්ණය කළ නොහැකි බව හඳුනාගනියි.
2. වැඩිහිටියන්ගේ අවවාද අනුශාසනා ලබාගැනීමෙන් යහපත් ජීවිතයක් ගත කළහැකි බව දැන ගනියි.
3. වැඩිහිටියන්ට සැලකීමේ අගය පැහැදිළි කරමින් බිත්ති පුවත්පතකට ලිපියක් සකස් කරයි.
4. වැඩිහිටියන්ගේ අවවාද අනුශාසනා පිළිපදිමින් ඔවුන්ට වැඳුම් පිදුම් කරයි.
5. මනා හික්මීමෙන් යුතුව ජීවත් වෙයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්:-**

I පෙර සූදානම,

- පෙළපොතෙහි 15වන පාඩම හොඳින් කියවා "යෙවද්ධාමපචායන්ති - නරාධම්මස්ස කෝවිදා..." යන ගාථාව කට පාඩම් කරගෙන පැමිණෙන ලෙස පෙර දිනයේ ශිෂ්‍යයන්ව දැනුම්වත් කරන්න.

II ප්‍රවේශය

- ඇමුණුම 01 හි සඳහන් "යෙවද්ධාමපචායන්ති..."යන ගාථාව ලියන ලද පුවරුව සිසුන් වෙත ප්‍රදර්ශනය කරමින් ගාථාව ශබ්දනගා සිසුන් සමග සජ්ඣායනය කර එහි සරල අර්ථය පැහැදිලි කරන්න.
- අනතුරුව එහි සඳහන් වැඩිහිටියෝ යනු කවුරු දැයි සිසුන්ගෙන් විමසන්න. එයට සිසුන් ලබාදෙන පිළිතුරු මත පදනම්ව වැඩිහිටියන් පිළිබඳව හඳුන්වා දෙන්න.
- ඉන්පසු වැඩිහිටියන්ට අප සැලකිය යුත්තේ කුමක් නිසාදැයි විමසමින් වැඩිහිටියන්ට සැලකිය යුතු ආකාරය හා ගෞරව කළයුතු ආකාරය පිළිබඳ ව සිසුන්ට පැහැදිළි කරමින් සාකච්ඡාව මෙහෙයවන්න.

**පාඩම් සංවර්ධනය:-**

- තිත්තිර ජාතකය වැඩිහිටියන්ට සැලකීමේ වැදගත්කම පෙන්වා දෙන අගනා ජාතක කතාවක් බව හඳුන්වා දෙන්න.
- එම ජාතක කතාව දේශනා කිරීමට හේතු වූ ජබ්බග්ගිය තෙරුන් වහන්සේලාගේ නොහික්මුණු ක්‍රියාකලාපය විස්තර කරන්න.
- තථාගත සාසනයේ අග්‍රාසන, අග්‍රභෝජන, අභිවාදන, පච්චුට්ඨාන, අඤ්ජලිකම්ම, සාමීචිකම්ම යන සියල්ලට සුදුසුකම් ලබන්නේ වැඩිහිටි පිළිවෙල සැලකිල්ලට ගනිමින් බව පැහැදිලි කරන්න.
- මිනිසුන් අතර පමණක් නොව සතුන් අතර ද වැඩිහිටියන්ට ගරු කිරීමේ ගුණය පැවති බව තිත්තිර ජාතක කථාව ඇසුරින් පැහැදිලි කරන්න.
- ඒ සඳහා පහත කරුණු ද ඇතුළත් කර ගන්න.
  - හිමාලය වනයෙහි මැද මහා නුග ගසක් පිහිටි බව
  - එම නුග ගස යට සැම දිනක ම හමුවන තිත් වටුවෙක්, වඳුරෙක් හා ඇතෙක් මිතුරු ව විසූ බව
  - දිනක් වැඩිහිටියන් හට ගරු කළයුතු බව සිතූ ඔවුන් තමන් අතරින් වැඩිහිටියා කවරෙක්ද සෙවීමට තීරණය කළ බව
  - තමන් වාසය කළ නුග රුක පිළිබඳව වැඩිම කලක් දන්නා කෙනා වැඩිහිටියා ලෙස පිළිගැනීමට යෝජනා කරගත් බව
  - සතුන් තිදෙනා එකිනෙකා තම තමන් නුග ගස පිළිබඳ ව දන්නා දේ ප්‍රකාශ කළබව
  - ඒ අනුව තිත්වටුවා වැඩිහිටියා ලෙස තෝරා ගරු බුහුමන් දැක්වූ බව
  - වැඩිහිටියා ලෙස තෙරී පත්වූ තිත්වටුවා අනෙක් දෙදෙනාට අවවාද අනුශාසනා කරමින් කටයුතු කළබව
  - තිදෙනාම සිල්සමාදන් වෙමින් ඔවුනොවුන් කෙරෙහි ගරුකරමින් උපකාර කරමින් වාසය කළ බව
  - ඔවුන්ගේ මෙම ප්‍රතිපත්තිය තිත්තිර බ්‍රහ්මචර්යාව නමින් හැඳින්වූ බව
  - මරණින් මතු තිදෙනාම දෙව්ලොව උපන්බව දක්වමින් වැඩිහිටියන්ට ගෞරව දැක්වීමේ වැදගත්කම සිසුන්ට පහදා දෙන්න.
  - වැඩිහිටි භික්ෂූන් වහන්සේලා විෂයයෙහි සාමණේර භික්ෂූන් වහන්සේලා සැලකිය යුතු ආකාරය පිළිබඳ වාක්‍ය කිහිපයක් අභ්‍යාස පොතෙහි ලියන ලෙස උපදෙස් දෙන්න.

- තක්සේරුකරණ නිර්ණායක ගුරුවරයා විසින් කියවා මැනවින් අවබෝධ කරගෙන එම නිර්ණායකවලට අදාළව ශිෂ්‍යයන් තක්සේරුකරණය කරන්න.
- අපේක්ෂිත සාධන මට්ටම්වලට ළඟා නොවූ සිසුන් වේනම් ඒ සඳහා සුදුසු ප්‍රතිපෝෂණ ක්‍රියාවලියක නිරත කරවන්න.

**මූලික වදන් හා සංකල්ප:-**

- ආගත පටිපාටි යනු ආ පිළිවෙළ, පැමිණි ක්‍රමය, වැඩිමහලු පිළිවෙළ යන අරුත්ගෙන දේ.

**"ආගත පටිපාටි යාතිවච්ච කුටියං පස්සා වට්ඨානෙන භාන තිත්ථෙති තීසුපි ආගත පටිපාටි යෙව පමාණං... "**

- චුල්ල වග්ග අට්ඨ කතාව (විනය පිටකය)

වැසිකිළි, කැසිකිළි - නාන තොට යන තැන්හි වැඩිමහලු පිළිවෙළ නොව පැමිණි පිළිවෙළම ගනු ලැබේ.

- අග්‍රාසනය - මුල් අසුන
- අග්‍රපිණ්ඩය - ආහාරයේ මුල් කොටස

**ගුණාත්මක යෙදවුම්:-**

ඇමුණුම 01

- ඇමුණුම 01 හි සඳහන් "යෙවද්ධා ම පචායන්ති...." යන ගාථාව ලියන ලද පුවරුව.
- ගුරු මාර්ගෝපදේශය
- පෙළපොතේ පහළොස්වන පාඩම

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා නිර්ණායක:-**

- තිත්තිර ජාතක කතාව මතකයෙන් කියයි.
- වැඩිහිටියන්ට සැලකීමේ වැදගත්කම පිළිබඳ කතාවක් කරයි.
- දෛනික වශයෙන් වැඩිහිටියන්ට කරන උපස්ථාන පිළිබඳ සඳහන් කිරීමට පොත් පිංචක් සකස් කරයි.

**වැඩිදුර පරිශීලනයට:-**

- ජාතක පාළි - ඛුද්දක නිකාය
- විනය පිටකය - චුල්ල වග්ග පාළි වත්තන්ඛන්ධනය

# 16 පාඩම
## නමස්කාරය හා සරණාගමනය

**නිපුණතාව:- 5.0**

- බෞද්ධ ශික්ෂාපද හා වන්දනාමාන කිරීමේ ගාථා අධ්‍යයනය කර අරුත්බර ධම්මපද ගාථා චරිතායනයෙන් සාර්ථක ප්‍රතිබලසම්පන්න භික්ෂු චරිතයකට මග සලසා ගනියි.

**නිපුණතා මට්ටම:- 5.1**

- වන්දනාමාන කිරීමේ ගාථා හැඳින චරිතායනයෙන් කටයුතු කරයි.

**කාලපරිච්ඡේද:-** 05 යි

**ඉගෙනුම් පල:-**

1. සරණාගමනය යන වචනයේ අරුත පැහැදිලි කර ගනියි.
2. ඉෂ්ට දේවතා නමස්කාරය සෑම ආගමකටම පොදුබව පිළිගනිමින් කටයුතු කරයි.
3. වැඳීම හා ආචාර කිරීමේ වෙනස ප්‍රායෝගිකව කර දක්වයි.
4. දොහොත් මුදුන් තබා නිවැරදි ව නමස්කාර කරයි.
5. ආචාරශීලී ව කටයුතු කරයි.

### 05. පාඩම් සැලසුම සඳහා උපදෙස්:-

I පෙර සූදානම,

- පෙළ පොතෙහි 16 පාඩම කියවා, ආචාර කිරීම හා නමස්කාර කිරීමේ වෙනස හඳුනාගෙන එන ලෙස ශිෂ්‍යයන් දැනුවත් කිරීම.

II ප්‍රවේශය

- ආචාර කිරීම හා නමස්කාර කිරීමේ ඉරියව් දැක්වෙන පින්තූරයක්, ඇමුණුම 1 සිසුන්ට පෙන්වා ''බුද්ධං සරණේ සිරස දරාගෙන'' යන තුන්සරණය කවිය තාලයකට ගායනා කරමින් සිසුන් සමග ද ගායනා කර ඒ අදහස සාකච්ඡා කරන්න.

### 06. පාඩම් සංවර්ධනය:-

- ආචාර කිරීම හා නමස්කාර කිරීමේ ඉරියව් වෙන් වෙන්ව පැහැදිලි කරන්න.
- බුදුරජාණන් වහන්සේට නමස්කාර කිරීම බෞද්ධයාගේ සිරිත බව හඳුන්වා දෙන්න.
- බුදුරදුන්ට දොහොත් මුදුන් තබා දෙවිමිනිසුන් නමස්කාර කරන අයුරු විහාර සිතුවම් මගින් පෙන්වීමට අවස්ථාවක් යොදාගන්න.
- නමස්කාර පාඨය කියවා, නිවැරදි උච්චාරණය හඳුන්වා පුහුණු කරන්න.
- නමස්කාර පාඨයෙහි අර්ථය පැහැදිලි කර දෙන්න.
- වැඳීමේ ක්‍රම වෙන වෙනම හඳුන්වා දෙන්න.

උක්කුටිකයෙන් වැඳීම.
පසඟ පිහිටුවා වැඳීම.
දණ්ඩ නමස්කාරය.

- නිතර භාවිතයේ දී පසඟ පිහිටුවා වැඳීමට පුරුදු කරවන්න.
- නමස්කාර පාඨය විවිධ අවස්ථාවල දී උච්චාරණය වෙනස්ව කියන අයුරු පෙන්වා දෙන්න.
  - බුද්ධ වන්දනාව, පිරිත් දේශනාව ආදී අවස්ථා.
- නමස්කාරයෙන් පසු සරණාගමනය යන බව පැහැදිලි කරන්න.
- තෙරුවන් සරණ ගිය ගිහි බෞද්ධයා උපාසක යන විශේෂ නාමයෙන් හැඳින්වෙන බව විස්තර කරන්න.
- තෙරුවන් සරණ යන සතර ආකාරය පැහැදිලි කරදෙන්න.
  - ආත්ම සන්නිර්යතන සරණාගමනය.
  - තත්පරායණතා සරණාගමනය.
  - ශිෂ්‍ය භාවෝපගමන සරණාගමනය.
  - ප්‍රණිපාත සරණාගමනය.
- පෙළ පොතෙහි එන පුහුණුවට අදාළ කවි දෙක තාලයට අනුව ගායනා කොට, වනපොත් කිරීමට යොමුකරවන්න.
- බෞද්ධයා නිරතුරුව බුද්ධ නමස්කාර කළයුතු බව
- දොහොත් මුදුන් දී නමස්කාරය වැඳීමට පුරුදුවිය යුතු බව
- බෞද්ධයෙකු වීමට තෙරුවන් සරණ යායුතු බව

## මූලික වදන් හා සංකල්පඃ-

- ආචාර කිරීම හා නමස්කාර කිරීම දෙකක් බව
- නමස්කාරය උච්චාරණ විධි අවස්ථාව අනුව වෙනස්වන බව
- වැඳීමේ ක්‍රම තුනක් ඇති බව
  - උක්කුටිකයෙන් වැඳීම.
  - පසඟ පිහිටුවා වැඳීම.
  - දණ්ඩ නමස්කාරය.
- පසඟ පිහිටුවා වැඳීමට පුරුදුවිය යුතු බව
- තෙරුවන් සරණ යන ආකාර සතරක් ඇති බව
  - ආත්ම සන්නිර්යාත සරණාගමනය.
    ජීවිතය පුදමින් තෙරුවන් සරණ යාම
  - තත්පරායණතා සරණාගමනය.
    දරුවෙකු පියෙකුගෙන් පිහිට පතන්නාක් මෙන් තෙරුවන් සරණයාම
  - ශිෂ්‍යභාවෝපගමන සරණාගමනය.
    සිසුවෙකු ගුරුවරයෙකුගෙන් පිහිට පතන්නාක් මෙන් තෙරුවන් සරණයාම
  - ප්‍රණිපාත සරණාගමනය.
    තෙරුවනට ගරු කිරීමෙන් පමණක් තෙරුවන් සරණ යාම.

## ගුණාත්මක යෙදවුම්ඃ-

ඇමුණුම 01

- ආචාර කිරීම හා නමස්කාර කිරීමේ ඉරියව් දැක්වෙන පින්තූරයක්.
- ගුරුමාර්ගෝපදේශය
- පෙළපොතේ දහසයවන පාඩම

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා නිර්ණායක:-**

- නමස්කාරයෙහි අර්ථය ලිවීම.
- වැඳීමේ ක්‍රම තුන නම් කිරීම.
- තෙරුවන නම් කිරීම.
- තෙරුවන් සරණ යන ක්‍රම හතර නම් කිරීම.
- ආචාර කිරීම හා නමස්කාර කරන අයුරු චිත්‍රයට නැඟීම.

**වැඩිදුර පරිශීලනයට:-**

- ඇමුණුම 01 (ප්‍රවේශය සඳහා)
  තුන් සරණය කවි පොත.

| | |
|---|---|
| බුද්ධං සරණේ සිරස | දරාගෙන |
| ධම්මං සරණේ සිත | පහදාගෙන |
| සංඝං සරණේ සිවුරු | දරාගෙන |
| ඉක්දැයි තුන් සරණේ | අදහාගෙන |

- බුද්ධ ඇදහිල්ල.
- බෞද්ධයාගේ අත්පොත - රේරුකානේ චන්දවිමල නාහිමි.

# 17 පාඩම
## තෙරුවන් වැඳීම

**නිපුණතාව:- 5.0**

- බෞද්ධ ශික්ෂාපද හා වන්දනාමාන කිරීමේ ගාථා අධ්‍යයනය කර අරුත්බර ධම්මපද ගාථා චරිතායනයෙන් සාර්ථක ප්‍රතිබලසම්පන්න භික්ෂු චරිතයකට මග සලසා ගනියි.

**නිපුණතා මට්ටම:- 5.1**

- වන්දනාමාන කිරීමේ ගාථා හැඳින චරිතායනයෙන් කටයුතු කරයි.

**කාලපරිච්ඡේද:-** 09 යි

**ඉගෙනුම් පල:-**

1. තෙරුවන ගුණ පැහැදිලි කර ගනියි.
2. තෙරුවන වන්දනා කිරීමෙන් ශ්‍රද්ධාව ඇතිවන බව පිළිගනියි.
3. සූවිසි ගුණ වගුගත කරයි.
4. තුණුරුවන් වන්දනාවෙහි යෙදෙයි.
5. සැදැහැසිතින් කටයුතු කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්:-**

**I** පෙර සූදානම,

- පෙළ පොතෙහි 17 පාඩම කියවා පැමිණෙන ලෙස ශිෂ්‍යයන් දැනුවත් කිරීම.

**II** ප්‍රවේශය

- රුවන් යනු මොනවාදැයි ප්‍රශ්න කොට, මැණික් බව පවසා එහි වටිනාකම, දුර්ලභ බව දක්වා තෙරුවන පැහැදිලි කරන සාකච්ඡාව මගින්.
- \- මැණික් කැට දැක්වෙන පුවරුවක් පෙන්වා.

**පාඩම් සංවර්ධනය:-**

- තෙරුවනෙහි වටිනාකම පැහැදිලි කරදෙන්න.
- ඉතිපිසො...පාඨය හා ගාථා පෙළ ද එහි අර්ථය වනපොත් කරවන්න.
- ස්වාක්ඛාතො....පාඨය හා ගාථා පෙළ ද එහි අර්ථය වනපොත් කරවන්න.
- සුපටිපන්නො...පාඨය හා ගාථා පෙළ ද එහි අර්ථය වනපොත් කරවන්න.
- බුදුගුණ නවය වෙන්කොට දක්වන්න.
- දහම් ගුණ හය වෙන්කොට දක්වන්න.
- සඟගුණ නවය වෙන්කොට දක්වන්න.
- පුහුණුවට ඇති ගාථා වනපොත් කරවන්න.

### 7. මූලික වදන් හා සංකල්පඃ-

- ආරාමික ජීවිතයේ පුරුදු කළයුතු වත් පිළිවෙත් පද්ධතියක් ඇති බව.
- බෞද්ධයන්ට ඇති එකම පිහිට තිසරණය බව.
- බුදුගුණ පාඨයෙහි බුදුගුණ නවයක් ඇතුළත් බව.
- දහම්ගුණ පාඨයෙහි දහම්ගුණ හයක් ඇතුළත් බව.
- සඟගුණ පාඨයෙහි සඟගුණ නවයක් ඇතුළත් බව.
- තෙරුවන ගුණ පාඨයන්හි එක් එක් පද අරුත් දැනගෙන වන්දනා කළ යුතු බව.

### 08. ගුණාත්මක යෙදවුම්ඃ-

- මැණික් කැට දැක්වෙන පුවරුවක්
- ගුරු මාර්ගෝපදේශය
- පෙළපොතේ දහහත්වන පාඩම

### 09. ඇගයීම් හා තක්සේරු කරන නිර්ණායකඃ-

- තෙරුවන වැඳීමේ ගාථා පාඨ නිවැරදි උච්චාරණයෙන් සජ්ඣායනා කිරීම.
- වනපොත් කිරීම හා සරල අර්ථය දැක්වීම.

### 10. වැඩිදුර පරිශීලනයටඃ-

- ඇමුණුම 01 (ප්‍රවේශය සඳහා)
- තෙරුවන වැඳීමේ ගාථා පොත් පිංච කිහිපයක්

# 18 පාඩම
## පන්සිල්

**නිපුණතාව:- 5.0**

- බෞද්ධ ශික්ෂාපද හා වන්දනාමාන කිරීමේ ගාථා අධ්‍යයනය කර අරුත්බර ධම්මපද ගාථා චරිතායනයෙන් සාර්ථක ප්‍රතිබලසම්පන්න භික්ෂු චරිතයකට මග සලසා ගනියි.

**නිපුණතා මට්ටම:- 5.2**

- නිවැරදිව සීල සමාදානයෙහි යෙදෙමින්, සිල්වත් ජීවිතයක් ගත කරයි.

**කාලපරිච්ඡේද:-** 04 යි

**ඉගෙනුම් පල:-**

1. පන්සිල්හි අරුත් පැහැදිලි කර ගනියි.
2. ගිහියාගේ නිත්‍ය සීලය පන්සිල් බව පිළිගනියි.
3. පන්සිල්හි වටිනාකම යන මැයෙන් රචනාවක් ගොඩනගයි.
4. ශික්ෂාකාමී ජීවිතයක් ගත කරයි.
5. දැහැමි දිවියක් ගතකරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්:-**

**I** පෙර සූදානම,

- පන්සිල් යන 18 වන පාඩම හොඳින් කියවා එන ලෙස සිසුන් දැනුම්වත් කරන්න.

**II** ප්‍රවේශය

- ශිෂ්‍ය භික්ෂූන් වහන්සේ නමක් ලවා පන්සිල් දීමට අවස්ථාව දීමෙන් සහ ඒ පිළිබඳ සාකච්ඡා කර පන්සිල් ........ ඉස්මතු කරන්න.

**පාඩම් සංවර්ධනය:-**

- පන්සිල් පද වන පොත් කරවන්න.
- පන්සිල් පද තේරුම හඳුන්වාදෙන්න.
- ගිහියාගේ නිත්‍ය සීලය පන්සිල් බව පෙන්වා දෙන්න.
- පන්සිල් පිහිටුවීමේ සිල් පද නිවැරදිව කියවීම හා හඬනගා කීමට හුරුකරන්න.
- පන්සිල් හා එහි තේරුම් අභ්‍යාස පොතේ ලියවන්න.
- තමන්ගේ මෙන්ම අනුන්ගේ ප්‍රාණය දැන දැන විනාශ කිරීම පාණාතිපාතාව බව.
- තමන්ට අයත් නොවන හා තමන්ට නුදුන් දෙය අවසරයෙන් තොරව ගැනීම අදින්නාදානය බව.
- සිය අඹු, සිය සැමි ඉක්මවා පර අඹු, පර සැමි සමග කම්සුව විඳීම කාමෙසු මිච්ඡාචාරය බව.

- නැති දේ ඇති ලෙසත්, ඇති දේ නැති ලෙසත් වෙනස් කර කීම මුසාවාදය බව.

- සිහි විකල් වීමට හා සියලු කටයුතු ප්‍රමාද වීමට හේතුවන මත් දියර, මත්ද්‍රව්‍ය භාවිතය සුරාමේරය මජ්ජපමාදට්ඨානාව බව පැහැදිලි කරන්න.

**මූලික වදන් හා සංකල්පඃ-**

- පන්සිල් - ගේහක සීලය, නිත්‍ය සීලය යනුවෙන් හැඳින්වෙන බව
- සීලය යනු - කය වචනයේ සංවරය බව

**ගුණාත්මක යෙදවුම්ඃ-**

- පිරුවාණා පොත් වහන්සේ
- ගුරු මාර්ගෝපදේශය
- පෙළපොතේ දහඅටවන පාඩම

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා නිර්ණායකඃ-**

- නිවැරදි උච්චාරණයෙන් යුතුව පන්සිල් දීම.
- පන්සිල් පද අරුත් දැක්වීම.

**වැඩිදුර පරිශීලනයටඃ-**

- පන්සිල් පද විස්තර කෙරෙන කුඩා පොත් පිංච.

# 19 පාඩම
## අෂ්ටාංග සීලය හා දසසීලය

**නිපුණතාව:- 5.0**

- බෞද්ධ ශික්ෂාපද හා වන්දනාමාන කිරීමේ ගාථා අධ්‍යයනය කර අරුත්බර ධම්මපද ගාථා චරිතායනයෙන් සාර්ථක ප්‍රතිබලසම්පන්න භික්ෂු චරිතයකට මග සලසා ගනියි.

**නිපුණතා මට්ටම:- 5.2**

- නිවැරදිව සීල සමාදානයෙහි යෙදෙමින්, සිල්වත් ජීවිතයක් ගත කරයි.

**කාලපරිච්ඡේද:-** 05 යි

**ඉගෙනුම් පල:-**

1. අටසිල් හා දස සිල් අතර වෙනස හඳුනා ගනියි.
2. අටසිල් හා දසසිල් නිවන් පිණිස හේතුවන බව පිළිගෙන කටයුතු කරයි.
3. අටසිල් හා දසසිල් මතකයෙන් කියයි.
4. පෙහෙවස් සමාදන් කරවයි.
5. සිල්වත් ජීවිතයක් ගතකරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්:-**

I පෙර සූදානම,

- පෙළපොතෙහි 19 පාඩම කියවා පැමිණෙන ලෙස ශිෂ්‍යයන් දැනුවත් කිරීම.

II ප්‍රවේශය

- පන්සිල් පද හා අටසිල් පද, දස සිල් පද වෙනස්වන අයුරු විමසීමෙන් ඒ පිළිබඳ සාකච්ඡාවක් මෙහෙයවා අෂ්ටාංග හා දස සීලයට ඉස්මතු කරගන්න.

**පාඩම් සංවර්ධනය:-**

- අටසිල් පද වනපොත් කරවන්න.
- අටසිල් පදයන්හි තේරුම් සාකච්ඡා කරන්න.
- අටසිල් ඉල්ලීමේ වාක්‍ය වනපොත් කරවන්න.
- දසසිල් පද වනපොත් කරවන්න.
- දසසිල් පදයන්හි තේරුම් සාකච්ඡා කරන්න.
- දසසිල් ඉල්ලීමේ වාක්‍ය වනපොත් කරවන්න.
- පුහුණුවට ඇති ගාථා දෙක වනපොත් කරවන්න.
- පුහුණුවට ඇති ගාථා විස්තර කරන්න.
- අටසිල් හා දසසිල් සිල්පද වෙනස්වන අයුරු පෙන්වා දෙන්න.
- ගහට්ඨ දසසීලයට වඩා සාමණේර දසසීලය වෙනස්වන අයුරු පෙන්වා දෙන්න.
- පෙහෙවස් හෙවත් පොහොය දින අටසිල් හා දසසිල් ගන්නා බව

- අටසිල් දසසිල් නිවන් මගට ප්‍රවේශයක් බව
- ගහට්ඨ දසසීලයට වඩා සාමණේර දසසීලය වෙනස් වන අයුරු
- අටසිල් හා දසසිල් පද අරුත් දැක්වීම.

**මූලික වදන් හා සංකල්පඃ-**

- අබ්‍රහ්මචරියා
- අවේලාවේ ආහාර ගැනීමෙන් වැළකීම විකාලභෝජනා වෙරමණී ශික්ෂාපදය බව.
- නැටුම්, ගැයුම්, වැයුම් කිරීමෙන් වැළකීම, උසුළු විසුළු දසුන් නැරඹීමෙන් වැළකීම හා මල් ගඳ විලවුන් දැරීම, සැරසීම, අලංකාර වීම් ආදියෙන් වැළකීම නච්ච ගීත වාදිත විසූක දස්සන මාලා ගන්ධ විලෙපන ධාරණ මණ්ඩන විභූසනට්ඨානා වේරමණී ශික්ෂාපදය බව.
- උස අසුන්, මහ අසුන් ලෙස දැක්වෙන ඇඳ පුටු ආදි සුඛෝපභෝගී දේ පරිහරණයෙන් වැළකීම උච්චාසයන මහාසයනා වේරමණී ශික්ෂාපදය බව. රන් රිදී මසු කහවණු පිළිගැනීමෙන් වැළකීම ජාතරූප රජත පටිග්ගහණා වේරමණී ශික්ෂාපදය බව.

**ගුණාත්මක යෙදවුම්ඃ-**

- ගුරු මාර්ගෝපදේශය
- පෙළපොතේ දහනවවන පාඩම

  වත්තං න පරිපූරෙන්තො - න සීලං පරිපූරති
  අසුද්ධ සීලො දුප්පඤ්ඤො - දුක්ඛා න පරිමුච්චති.

  කිකීව අණ්ඩං චමරීව වාළධිං - පියං ව පුත්තං නයනං ව ඒකකං
  තථෙව සීලං අනුරක්ඛමානකා - සුපෙසලා හොථ සදා සගාරවා.
- ගාථා ලියන ලද පුවරුව

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා නිර්ණායකඃ-**

- සිල් පද නිවැරදිව සජ්ඣායනා කිරීම හා පාඩම් කීරීම.
- පන්සිල් වලට වඩා අටසිල් විශේෂ වන අයුරු දැක්වීම.
- අට සිල් දසසිල් හි වෙනස්කම පැහැදිළි කිරීම.
- සිල් පද අරුත් දැක්වීම.

**වැඩිදුර පරිශීලනයටඃ-**

- බෞද්ධයාගේ අත් පොත - රේරුකානේ චන්දවිමල නාහිමි.

# 20 පාඩම
## ආජීව අට්ඨමක සීලය

**නිපුණතාව:- 5.0**

- බෞද්ධ ශික්ෂාපද හා වන්දනාමාන කිරීමේ ගාථා අධ්‍යයනය කර අරුත්බර ධම්මපද ගාථා චරිතායනයෙන් සාර්ථක ප්‍රතිබලසම්පන්න භික්ෂු චරිතයකට මග සලසා ගනියි.

**නිපුණතා මට්ටම:- 5.2**

- නිවැරදිව සීල සමාදානයෙහි යෙදෙමින්, සිල්වත් ජීවිතයක් ගත කරයි.

**කාලපරිච්ඡේද:-** 04 යි

**ඉගෙනුම් පල:-**

- ආජීව අට්ඨමක සීලයෙහි අරුත් පැහැදිළි කරයි.
- පන්සිල්වලට වඩා ආජීව අට්ඨමක සීලය උසස් බව පිළිගනියි.
- ආජීව අට්ඨමක සීලයෙහි අරුත් වගුගත කරයි.
- යහපත්ව කටයුතු කරයි.
- ශාසනික චර්යාවෙහි යෙදෙයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්:-**

I පෙර සූදානම,
- පෙළපොතෙහි 20 පාඩම කියවා පැමිණෙන ලෙස ශිෂ්‍යයන් දැනුවත් කිරීම.

II ප්‍රවේශය
- වචනයෙන් කෙරෙන අකුසල මොනවාදැයි ප්‍රශ්න කිරීමෙන්.

**පාඩම් සංවර්ධනය:-**

- ආජීව අට්ඨමක සිල් පද වනපොත් කරවන්න.
- ආජීව අට්ඨමක සිල් පදයන්හි තේරුම් සාකච්ඡා කරන්න.
- ආජීව අට්ඨමක සිල් පන්සිල්වලට වඩා වෙනස්වන අයුරු පෙන්වා දෙන්න.
- ආජීව අට්ඨමක සිල් පදවල සුවිශේෂ බව හඳුන්වා දෙන්න.
- පුහුණුවට ඇති ගාථාව වනපොත් කරවන්න.
- කේලම් කීම පිසුණාවාචා බව.
- පරුෂ වචන කීම පරුෂාවාචා බව.
- නිෂ්ඵල වචන කතා කිරීම සම්ඵප්පලාපා බව.
- වචනයෙන් කෙරෙන අකුසල බොරුකීම, කේලාම්කීම, පරුෂ වචනකීම, හිස්වචන කීම යන සතර බව.
- වැරදි ජීවිකාවෙන් යුක්ත වීම මිච්ඡාජීවා බව.

**මූලික වදන් හා සංකල්පඃ-**

- ආජීව අට්ඨමක සීලයෙන් ආර්ය අෂ්ටාංගික මාර්ගයේ සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීවය අංග තුන සම්පූර්ණ වන බව.

**ගුණාත්මක යෙදවුම්ඃ-**

- ගුරු මාර්ගෝපදේශය
- පෙළපොතේ විසිවන පාඩම

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා නිර්ණායකඃ-**

- සිල් පද නිවැරදිව සජ්ඣායනා කිරීම හා පාඩම් කීම.
- ආජීව අට්ඨමක සීලය විශේෂ වන අයුරු දැක්වීම.
- වචනයෙන් කෙරෙන අකුසල් හතර හඳුන්වා දීම.
- සිල් පද අරුත් දැක්වීම.

**වැඩිදුර පරිශීලනයටඃ-**

- දීඝ නිකායේ මහා සතිපට්ඨාන සූත්‍රය

# 21 පාඩම
## වන්දනා ගාථා

**නිපුණතාව:- 5.0**

- බෞද්ධ ශික්ෂාපද හා වන්දනාමාන කිරීමේ ගාථා අධ්‍යයනය කර අරුත්බර ධම්මපද ගාථා චරිතායනයෙන් සාර්ථක ප්‍රතිබලසම්පන්න භික්ෂු චරිතයකට මග සලසා ගනියි.

**නිපුණතා මට්ටම:- 5.1**

- වන්දනාමාන කිරීමේ ගාථා හැඳින චරිතායනයෙන් කටයුතු කරයි.

**කාලපරිච්ඡේද:-** 10 යි

**ඉගෙනුම් පල:-**

1. වන්දනා ගාථා අනුපිළිවෙළ දැන ගනියි.
2. වන්දනා ගාථා නිවැරදි උච්චාරණයෙන් සජ්ඣායනා කළයුතු බව පිළිගනියි.
3. වන්දනා ගාථා නිවැරදිව අනුපිළිවෙළින් මතකයෙන් සජ්ඣායනා කරයි.
4. දෛනික බුද්ධ වන්දනාවේ යෙදෙයි.
5. අන්‍යයන්ව බුද්ධ වන්දනාවට යොමුකරවයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්:-**

I පෙර සූදානම,

- පෙළපොතෙහි 21 පාඩම කියවා පැමිණෙන ලෙස ශිෂ්‍යයන් දැනුම්වත් කිරීම.
- වන්දනා ගාථා පොත් සොයාගෙන එන ලෙස දැන්වීම.

II ප්‍රවේශය

- බුදුන් වැඳීමේදී ගාථා කියන අනුපිළිවෙළ කීමට යෝජනා කරමින් අදාළ ගාථා කිහිපයක් සජ්ඣායනා කර ඒ පිළිබඳ විමසමින් වන්දනා ගාථා යන්න ඉස්මතු කරගන්න.

**පාඩම් සංවර්ධනය:-**

- ත්‍රිවිධ චෛත්‍ය වන්දනාව අදාළ ගාථාව වණපොත් කරන්න.
- බෝධි වන්දනාවට අදාළ ගාථාව වණපොත් කරන්න.
- සත් සතිය වැඩහුන් තැන් වන්දනාවට අදාළ ගාථාව වණපොත් කරන්න.
- පහන් පූජාවට අදාළ ගාථාව වණපොත් කරන්න.
- සුවඳ දුම් පූජාවට අදාළ ගාථාව වණපොත් කරන්න.
- මල් පූජාවට අදාළ ගාථා වණපොත් කරන්න.
- පැන් පූජාවට අදාළ ගාථාව වණපොත් කරන්න.
- ආහාර පූජාවට අදාළ ගාථාව වණපොත් කරන්න.

- අවුළුපත් පූජාවට අදාළ ගාථාව වණපොත් කරන්න.
- දැහැත් පූජාවට අදාළ ගාථාව වණපොත් කරන්න.
- කමා කිරීමට අදාළ ගාථාව වණපොත් කරන්න.
- දෙවියන්ට පින්දීමට අදාළ ගාථාව වණපොත් කරන්න.
- ඥාතීන්ට පින්දීමට අදාළ ගාථාව වණපොත් කරන්න.
- ප්‍රාර්ථනා ගාථාව හා ගාථා පාඨය වණපොත් කරන්න.
- ආචාර්ය/උපාධ්‍යායන් වහන්සේලා කමා කරවා ගැනීමේ ගාථා පාඨය වණපොත් කරවන්න.

**මූලික වදන් හා සංකල්පඃ-**

- පන්සිල් සමාදන් වීම. තෙරුවන වැඳීම, ඉන්පසු වන්දනා ගාථා අනුපිළිවෙළ ඇති බව.
- විවිධ සම්ප්‍රදායයන්හි ගාථා අනුපිළිවෙළෙහි වෙනස්කම් ඇති බව.
- ගාථා හා සරල අදහස දැන වන්දනා ගාථා සජ්ඣායනා කළ යුතු බව.

**ගුණාත්මක යෙදවුම්ඃ-**

- වන්දනා ගාථා පොත්
- ගුරු මාර්ගෝපදේශය
- පෙළපොතේ විසිඑක්වන පාඩම

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා නිර්ණායකඃ-**

- වන්දනා ගාථා නිවැරදිව සජ්ඣායනා කිරීම වණපොත් කිරීම.
- වන්දනා ගාථා සරල අර්ථ දැක්වීම.
- බුද්ධ පූජා, බෝධි පූජා අවස්ථාවකට උචිත ලෙස ගාථා කියවීම.

**වැඩිදුර පරිශීලනයටඃ-**

- බුද්ධ ඇදහිල්ල.
  පුණ්‍යොපදේශය - රේරුකානේ චන්දවිමල නාහිමි.

# 22 පාඩම
## සිව්පස පරිභෝගය

**නිපුණතාව:- 3.0**

- බෞද්ධ විනය හා ශික්ෂණය පිළිබඳ දැනුම වර්ධනය කර, භික්ෂු ජීවිතය හැඩගස්වා ගනියි.

**නිපුණතා මට්ටම:- 3.2**

- මූලික ශික්ෂාපද ආරක්ෂා කරගැනීමට අදාළ බෞද්ධ ඉගැන්වීම් අනුගමනය කරයි.

**කාලපරිච්ඡේද:-** 08 යි

**ඉගෙනුම් පල:-**

1. සිව්පස යන්න පැහැදිලි කර ගනියි.
2. සිව්පසය පරිහරණය කිරීම වගකීමෙන් කළයුතු බව පිළිගනියි.
3. සිව්පසය ගැනීමේ දී සැලකිය යුතු කරුණු ශිෂ්‍ය සමිතියේ විස්තර කරයි.
4. ප්‍රත්‍යවේක්ෂාවෙන් කටයුතු කරයි.
5. සරල ජීවිතයක් ගතකරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්:-**

**I** පෙර සූදානම,

- පෙළපොතෙහි 22 පාඩම කියවා පැමිණෙන ලෙස ශිෂ්‍යයන් දැනුවත් කරන්න.

**II** ප්‍රවේශය

- ඇමුණුම අංක 1 පුවරුව ඉදිරිපත් කර මිනිසාගේ මූලික අවශ්‍යතා සතරක් ඇති බව පවසා සිව්පසය පිළිබඳ සාකච්ඡාවක් මෙහෙයවා සිව්පස යන්න ඉස්මතු කර ගන්න.

**පාඩම් සංවර්ධනය:-**

- පැවිද්දා ජීවත්විය යුතු ආකාරය සාකච්ඡා කරන්න.
- සිව්පසයට අදාළ ද්‍රව්‍ය හඳුන්වා දීමට තොරතුරු විමසන්න.
- සැදැහැවතුන් සිව්පසය සැපයීමේදී දක්වන කැපකිරීම සාකච්ඡා කරන්න.

- සිව්පස පරිභෝගය පිළිබඳ සතර ආකාරය විස්තර කරදෙන්න.
  - ථෙය්‍ය පරිභෝගය
  - ඉණ පරිභෝගය
  - දායජ්ජ පරිභෝගය
  - සාමි පරිභෝගය

- චීවර ප්‍රත්‍යවේක්ෂාව දැක්වෙන පාඨය වණපොත් කරවන්න.

- චීවර ප්‍රත්‍යවේක්ෂාවෙහි අර්ථය පැහැදිලි කරදෙන්න.
- පිණ්ඩපාත ප්‍රත්‍යවේක්ෂාව දැක්වෙන පාඨය වණපොත් කරවන්න.
- පිණ්ඩපාත ප්‍රත්‍යවේක්ෂාවෙහි අර්ථය පැහැදිලි කරදෙන්න.
- සේනාසන ප්‍රත්‍යවේක්ෂාව දැක්වෙන පාඨය වණපොත් කරවන්න.
- සේනාසන ප්‍රත්‍යවේක්ෂාවෙහි අර්ථය පැහැදිලි කරදෙන්න.
- ගිලානප්‍රත්‍ය ප්‍රත්‍යවේක්ෂාව දැක්වෙන පාඨය වණපොත් කරවන්න.
- ගිලානප්‍රත්‍ය ප්‍රත්‍යවේක්ෂාවෙහි අර්ථය පැහැදිලි කරදෙන්න.
- අතීත ප්‍රත්‍යවේක්ෂාව දැක්වෙන පාඨ වණපොත් කරවන්න.
- අතීත ප්‍රත්‍යවේක්ෂාවන්හි අර්ථය පැහැදිලි කරදෙන්න.

**මූලික වදන් හා සංකල්පඃ-**

- මිනිසාගේ මූලික අවශ්‍යතා සතරක් බව.

  ඇඳුම් පැළඳුම්, ආහාර පාන, ගේ දොර, බෙහෙත් හේත්.
- පැවිදි උතුමන් සිව්පසයෙන් යැපෙන බව.

  චීවර, පිණ්ඩපාත, සේනාසන, ගිලාන පච්චය.
- සිව්පස පරිභෝගයෙන් සරල පැවිදි දිවියක් ගත කළයුතු බව.
- සිව්පස පරිභෝගය සතර ආකාර බව.

  | | |
  |---|---|
  | ථෙය්‍ය පරිභෝගය | - සොරෙන් භුක්ති විඳීම |
  | ඉණ පරිභෝගය | - ණයට භුක්ති විඳීම |
  | දායජ්ජ පරිභෝගය | - උරුමය භුක්ති විඳීම |
  | සාමි පරිභෝගය | - අයිති දේ භුක්ති විඳීම |
- භික්ෂුව ථෙය්‍ය පරිභෝගයෙන්, ඉණ පරිභෝගයෙන් සිව්පසය පරිභෝග නොකළ යුතු බව.
- භික්ෂුව සිව්පසය පරිභෝග කළ යුත්තේ දායජ්ජ පරිභෝගයෙන්, සාමි පරිභොගයෙන් බව.

**ගුණාත්මක යෙදවුම්ඃ-**

ඇමුණුම 01

- මිනිසාගේ මූලික අවශ්‍යතා සතර දැක්වෙන පුවරුවක්.
- ගුරු මාර්ගෝපදේශය
- පෙළපොතේ විසිදෙවන පාඩම

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා නිර්ණායකඃ-**

- ප්‍රත්‍යවේක්ෂා නිවැරදිව සජ්ඣායනා කිරීම හා කටපාඩම් කීම.
- දෛනිකව වත් පිරිත් කීමට පුහුණු කිරීම.
- සිව්පස පරිභෝගය සතර ආකාරය පැහැදිලි කිරීම.
- සිව්පස පරිභෝගයෙහි වටිනාකම විස්තර කිරීම.

**වැඩිදුර පරිශීලනයටඃ-**

- සාමණේර බණ දහම් පොත.
- ශාසනාවතරණය - රේරුකානේ චන්දවිමල නාහිමි.

# 23 පාඩම
# කල්‍යාණ මිත්‍ර සම්පත්තිය හා පාපමිත්‍ර විපත්තිය

**නිපුණතාව:- 2.0**

- භික්ෂු ජීවන රටාව හැඩගසා ගැනීමට බෞද්ධ ජාතක කථා හා සිව්වණක් පිරිසෙහි චරිතාදර්ශ උපයෝගි කර ගනියි.

**නිපුණතා මට්ටම:- 2.3**

- බෞද්ධ ජාතක කතා අධ්‍යයනය කොට උතුම් චරිතාංග ආදර්ශ ඇසුරෙන් කටයුතු කරයි.

**කාලපරිච්ඡේද:-** 03 යි

**ඉගෙනුම් පල:-**

1. කල්‍යාණ මිත්‍ර සම්පත්තිය හා පාප මිත්‍ර විපත්තිය අතර වෙනස පැහැදිලිව හඳුනා ගනියි.
2. ජාතක කතා තුළින් යහපත් ආදර්ශ ගත හැකි බව පිළිගනියි.
3. ජාතක කතාවලින් ගත හැකි ආදර්ශ වගු ගත කරයි.
4. කල්‍යාණ මිත්‍රයන් ඇසුරු කරයි.
5. අන් අයට උපකාර කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්:-**

**I** පෙර සූදානම,

- කල්‍යාණ මිත්‍ර සම්පත්තිය හා පාප මිත්‍ර විපත්තිය දැක්වෙන පෙළ පොතෙහි 23 වන පාඩම හොඳින් කියවා පැමිණෙන ලෙස පෙර දිනයේ ශිෂ්‍යයන්ව දැනුම්වත් කරන්න. එහි සඳහන් "දියෙහි යන දණ්ඩට" යන කවිය කටපාඩම් කරගෙන එන ලෙස පවසන්න.

**II** ප්‍රවේශය

- ඇමුණුම 01 හි සඳහන් කල්‍යාණ මිත්‍ර සේවනය දැක්වෙන ඡායාරූප ප්‍රදර්ශනය කරමින් කල්‍යාණ මිත්‍රයන් සිව්දෙනා පිළිබඳ විස්තර කරන්න.
- මෙම ඡායාරූපවලින් පැහැදිලි වන්නේ අන් අයට උදව් කිරීම වැදගත් බව යන අදහස ඉස්මතු කරමින් කල්‍යාණ මිත්‍ර සේවනය පිළිබඳ දැන ගැනීමට සිසුන්ව මෙහෙයවන්න.

**පාඩම් සංවර්ධනය:-**

- බුදු රජාණන් වහන්සේ බුදු වීමට පෙර භව පන්සිය පනහක් ඉපිද ක්‍රියා කළ ආකාරය පන්සිය පනස් ජාතක පොත් වහන්සේ තුළ ඇති බව.
- පන්සිය පනස් ජාතක පොත් වහන්සේ තුළ ඇති බෝසත් චරිතයේ ඇති ආදර්ශ අප ජීවිතය සකස් කර ගැනීමට වැදගත් වන බව.

- කළණ මිතුරන් සිව්දෙනෙක් හා පාප මිතුරන් සිව් දෙනෙක් ඇති බව.
- කළණ මිතුරු ඇසුර යහපත් වන බව.
- පාප මිතුරු ඇසුර අයහපත් වන බව.
- වැරදි වැඩ හා නපුරු කම් කිරීමෙන් අනිටු විපාක ලැබෙන බව.
- තිරිසනුන් හා මිනිසුන් අතර වෙනසක් ඇති බව.
- කොතෙක් උත්සාහ කළත් සත්‍ය වසන් කළ නොහැකි බව.
- තිරිසනා වුව ද කෘතගුණ සලකන්නේ නම් මිනිසාට වඩා උතුම් බව.
- අසත් පුරුෂ, දුර්ජනයන් දුරින් ම දුරු කළ යුතු බව.
- දුරවබෝධ වචනවල අර්ථය අභ්‍යාස පොතෙහි සටහන් කර ගැනීමට උපදෙස් දෙන්න.
- දුරවබෝධ වචන එකතු කර පොත් පිංචක් සැකසීමට උපදෙස් දෙන්න.
- ජාතක කථාව පැහැදිලි කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
- "සච්චං කිරෙවමාහංසු" යන ගාථා පාදය ඇතුළත් ගාථාව කටපාඩම් කිරීමට උපදෙස් දෙන්න.
- තක්සේරුකරණ නිර්ණායක ගුරුවරයා විසින් කියවා මැනවින් අවබෝධ කර ගෙන එම නිර්ණායකවලට අදාළව ශිෂ්‍යයන් තක්සේරුකරණය කරන්න.
- අපේක්ෂිත සාධන මට්ටම්වලට ළඟා නොවූ සිසුන් වේ නම් ඒ සඳහා සුදුසු ප්‍රතිපෝෂණ ක්‍රියාවලියක නිරත කරවන්න.

**මූලික වදන් හා සංකල්පඃ-**

- "මිත්‍රයා" යනු මෛත්‍රියෙන් කටයුතු කරන්නා බව.
- "කල්‍යාණ" යනු යහපත්, හොඳ යන්න බව.
- "උපකාරක මිත්‍රයා" යනු මිතුරාට උපකාරයක් ම කරන මිතුරා බව.
- "සමාන සුඛ දුක්ඛ මිත්‍රයා" යනු මිතුරාට දුක සැප දෙකේදී ම උපකාර කරන මිතුරා බව.
- "අත්ථක්ඛායි මිත්‍රයා" යනු මිතුරාට යහපතක් ම කරන මිතුරා බව.
- "අනුකම්පක මිත්‍රයා" යනු මිතුරාට අනුකම්පා කරන මිතුරා බව පැහැදිලි කරන්න.
- "අඤ්ඤදත්ථුහර මිත්‍රයා" යනු මිතුරාගෙන් යමක් ගැනීමේ අදහසින් ඇසුරු කරන මිතුරා බව.
- "වචීපරම මිත්‍රයා" යනු මිතුරාට වචනයෙන් පමණක් උදව් කරන මිතුරා බව.
- "අනුපියභානි මිත්‍රයා" යනු මිතුරාගේ සෑම වචනයක් ම අනුමත කරන මිතුරා බව.
- "අපාය සහයක මිත්‍රයා" යනු මිතුරාගේ පරිහානියට උදව් කරන මිතුරා බව.

**ගුණාත්මක යෙදවුම්ඃ-**

ඇමුණුම 01

- කල්‍යාණ මිත්‍ර සේවනය දැක්වෙන ඡායාරූප ඇතුළත් පුවරුවක්
- ගුරු මාර්ගෝපදේශය
- පෙළපොතේ විසිතුන්වන පාඩම

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා නිර්ණායකඃ-**

පහත සඳහන් නිර්ණායක යොදා ගන්න.

- ගාථා නිවැරදිව සජ්ඣායනය කිරීම හා කටපාඩමින් කීම.
- ගාථාවේ අර්ථය සරල පැහැදිලි කිරීම.
- ජාතක කථාව පැහැදිලිව, සරලව මතකයෙන් ඉදිරිපත් කිරීම.
- මිතුරන් පිළිබඳව හැඳින්වීමක් හෝ කතාවක් ඉදිරිපත් කිරීම.

**වැඩිදුර පරිශීලනයටඃ-**

ඇමුණුම 01 (ප්‍රවේශය සඳහා)

- පන්සිය පනස් ජාතක පොත් වහන්සේ
- මිතුරන් කෙටවීම - පූජ්‍ය යක්කඩුවේ ප්‍රඥාරාම හිමි
- පඤ්චතන්ත්‍රය

# 24 පාඩම
## පැවිදි සුවය සොයා යමු.

**නිපුණතාව:- 4.0**

- බෞද්ධ සූත්‍ර අනුසාරයෙන් දැනුම වර්ධනයකර ගනියි.

**නිපුණතා මට්ටම:- 4.1**

- බෞද්ධ සූත්‍රවල ඇතුළත් දහම් කරුණු අවබෝධයෙන් තම ජීවිතය සාර්ථක කර ගනියි.

**කාලපරිච්ඡේද:-** 07 යි

**ඉගෙනුම් පල:-**

1. ගිහි පැවිදි වෙනස පැහැදිලි කර ගනියි.
2. දසධම්ම සූත්‍රය ඇසුරින් සුරක්ෂිත පැවිදි දිවියක් ගත කළ ගත හැකි බව පිළිගනියි.
3. දසධම්ම සූත්‍රයේ ඇතුළත් දහම් කරුණු වගු ගත කරයි.
4. ප්‍රත්‍යාවේක්ෂයෙන් කටයුතු කරයි.
5. කායික මානසික සුවයෙන් කටයුතු කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්:-**

**I** පෙර සූදානම,

- පැවිදි සුවය සොයායමු. (දසධම්මසූත්‍රය දැක්වෙන) පෙළපොතෙහි 24 වන පාඩම හොඳින් කියවා පැමිණෙන ලෙස පෙරදිනයේ ශිෂ්‍යයන්ට දැනුම්වත් කරන්න. එහි සඳහන් ප්‍රත්‍යාවේක්ෂ කළයුතු කරුණු කටපාඩම් කරගෙන එන ලෙස පවසන්න.

**II** ප්‍රවේශය

- ඇමුණුම 01 හි සඳහන් දසධම්මසූත්‍රයේ මුල් කොටස ඇතුළත් හඬපටයක් හෝ ගුරුවරයාගේ මුවින් සජ්ඣායනය කිරීම සිදුකරමින් දසධම්මසූත්‍රය පිළිබඳ විස්තර කරන්න.
- මෙම හඬපටය හෝ ගුරු මුවින් සජ්ඣායනය කළ සූත්‍ර පාඨය ඇතුළත් වන්නේ දසධම්මසූත්‍රයට බව පැහැදිලි කරමින් එහි ඇතුළත් ප්‍රත්‍යාවේක්ෂා කරුණු දහයේ ඇති වැදගත් බව ඉස්මතු කරමින් සිසුන්ව සාකච්ඡාවක මෙහෙය වන්න.
- "පච්චවෙක්ඛිතබ්බං" යනපදය කළු ලැල්ලේ ලියා එම පදය පිළිබඳව සිසුන්ගෙන් විමසා සාකච්ඡාව මෙහෙය වන්න.

**පාඩම් සංවර්ධනය:-**

- බුදුරජාණන් වහන්සේ වදාළ සියලුම ධර්මය ත්‍රිපිටකය තුළ ඇති බව.
- එම ත්‍රිපිටකය සූත්‍ර, විනය, අභිධර්ම යනුවෙන් කොටස් තුනකින් සමන්විත වන බව.
- බුදුරජාණන් වහන්සේ අනේපිඬු සිටුතුමා කරවූ ජේතවනාරාමයේ වැඩසිටියදී මෙම සූත්‍රය දේශනා කළබව.

- දසධම්මසූත්‍රය අංගුත්තර නිකායේ හයවෙනි (බුද්ධජයන්ති ත්‍රිපිටක මුද්‍රණය) ග්‍රන්ථයේ 156 පිටුවේ ඇති බව.
- පැවිදි උතුමන් විසින් ප්‍රත්‍යවේක්ෂණය කළයුතු කරුණු දහයක් ඇති බව.
- ගිහි ජීවිතය බාධක සහිත බවත් පැවිදි ජීවිතය අහස මෙන් නිදහස් හා සැහැල්ලුවන බව.
- මනා සිහි කල්පනාවෙන් පැවිදි දිවිය ගතකළ යුතු බව.
- පැවිදි දිවිය ආරක්ෂාකර ගැනීම පිණිස සැමදා මෙම කරුණු දහය සිහි කළයුතු බව.
- දසධම්මසූත්‍රය කටපාඩම් කර ගැනීමට සිසුන්ට උපදෙස් දෙන්න.
- ගිහියන් හා පැවිදි උතුමන් අතර වෙනසක් ඇතිබව.
- දුරවබෝධ වචනවල අර්ථය අභ්‍යාස පොතෙහි සටහන් කර ගැනීමට උපදෙස් දෙන්න.
- දුරවබෝධ වචන එකතු කර පොත් පිංචක් සැකසීමට උපදෙස් දෙන්න.
- දසධම්මසූත්‍රය පැහැදිලි කරමින් සාකච්ඡාවක් මෙහෙය වන්න.
- "සම්බොධායං සරාවාසො" යන පාඨය ඇතුළත් ගාථාවකට පාඩම් කිරීමට උපදෙස් දෙන්න.
- තක්සේරුකරණ නිර්ණායක ගුරුවරයා විසින් කියවා මැනවින් අවබෝධ කරගෙන එම නිර්ණායකවලට අදාළව ශිෂ්‍යයන් තක්සේරුකරණය කරන්න.
- අපේක්ෂිත සාධන මට්ටම්වලට ළගා නොවූ සිසුන් වේ නම් ඒ සඳහා සුදුසු ප්‍රතිපෝෂණ ක්‍රියාවලියක නිරත කරවන්න.

## මූලික වදන් හා සංකල්පඃ-

- "සීලය" යනු කය වචනයේ සංවර බව.
- "සබ්‍රහ්මචාරි" යනු තමන් සමග එකට කටයුතු කරන්නා බව.
- "කර්මය" යනු සචේතනික ක්‍රියාවක් බව.

## ගුණාත්මක යෙදවුම්ඃ-

ඇමුණුම 01

- දසධම්මසූත්‍රය ඇතුළත් හඬපටය
- ගුරුමාර්ගෝපදේශය
- පෙළපොතේ විසිහතරවන පාඩම

## ඇගයීම් හා තක්සේරුකරණය සඳහා නිර්ණායකඃ-

පහත සඳහන් නිර්ණායක යොදා ගන්න.

- සූත්‍ර පාඨ නිවැරදිව සජ්ඣායනය කිරීම හා කටපාඩමින් කීම.
- සූත්‍ර පාඨවල අර්ථය සරලව පැහැදිලි කිරීම.
- නිදාන කථාව පැහැදිලිව, සරලව මතකයෙන් ඉදිරිපත් කිරීම.
- ප්‍රත්‍යවේක්ෂ කරුණු පිළිබඳව හැඳින්වීමක් හෝ කතාවක් ඉදිරිපත් කිරීම.

## වැඩිදුර පරිශීලනයටඃ-

ඇමුණුම 01 (ප්‍රවේශය සඳහා)

- අංගුත්තර නිකායේ හයවෙනි (බුද්ධ ජයන්ති ත්‍රිපිටක මුද්‍රණය) ග්‍රන්ථය

# 25 පාඩම
## උතුම් පින් කෙතට බැඳෙන නියර

**නිපුණතාව:- 3.0**

- බෞද්ධ විනය හා ශික්ෂණය පිළිබඳ දැනුම වර්ධනය කර භික්ෂු ජීවිතය හැඩගස්වා ගනියි.

**නිපුණතා මට්ටම:- 3.1**

- භික්ෂු ජීවිතයට අදාළ මූලික ශික්ෂා පද ප්‍රගුණ කරයි.

**කාලපරිච්ඡේද:-** 10 යි

**ඉගෙනුම් පල:-**

1. සාමණේර සීලය දැන ගනියි.
2. සීලය නුවණට මූලික වන බව පිළිගනියි.
3. සාමණේර සීලය පනස් ආකාරයට බෙදෙන අයුරු වගු ගත කරයි.
4. ශික්ෂණයෙන් යුතුව කටයුතු කරයි.
5. ප්‍රඥාවන්ත ජීවිතයක් ගත කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්:-**

I පෙර සූදානම,

- උතුම් පින් කෙතට බැඳන නියර (හෙරණසිඛ) දැක්වෙන පෙළ පොතෙහි 25 වන පාඩම හොඳින් කියවා පැමිණෙන ලෙස පෙර දිනයේ ශිෂ්‍යයන්ව දැනුම්වත් කරන්න. එහි සඳහන් "සබ්බදා සීලසම්පන්නො" යන ගාථාව කටපාඩම් කරගෙන එන ලෙස පවසන්න.

II ප්‍රවේශය

- ඇමුණුම 01 හි සඳහන් සාමණේර ස්වාමීන් වහන්සේලා මනා සංවරව වතාවත්වල යෙදී සිටිනවා දැක්වෙන ඡායාරූප ප්‍රදර්ශනය කරමින් උන්වහන්සේලාගේ සංවරකම පිළිබඳ විස්තර කරන්න.
- මෙම ඡායාරූපවලින් පැහැදිලි වන්නේ සාමණේර ස්වාමීන් වහන්සේලා මනා සංවරව වතාවත්වල යෙදෙන බව යන අදහස ඉස්මතුකර කරමින් සාමණේර සීලය ගැන දැන ගැනීමට සිසුන්ව මෙහෙයවන්න.

**පාඩම් සංවර්ධනය:-**

- ත්‍රිපිටකය සූත්‍ර, විනය, අභිධර්ම යනුවෙන් කොටස් තුනක් ඇති බව.
- "හෙරණසිඛ" නම් ග්‍රන්ථය විනය පිටකය ඇසුරු කර ගෙන පොළොන්නරු යුගයේ ලියවුණු බව.
- එදා සිට වර්තමානය දක්වා සාමණේර **විනය ග්‍රන්ථයක් ලෙස** එය භාවිතයට ගෙන ඇති බව.

- හෙරණසිඛ විනිස යනුවෙන් මෙම ග්‍රන්ථයට විවරණ ග්‍රන්ථයක් ඇති බව.
- සාමණේර නමක් අනිවාර්යෙන් ම පුහුණු විය යුතු අංශ තුන දස සීලය, වත පිළිවෙත හා සේඛියා වන බව.
- විනය පිටකයට අයත් මහාවග්ග පාළියේ සාමණේරයන් හික්ම විය යුතු ශික්ෂා පද ඇතුළත් වන බව.
- සාමණේරයන් හික්ම විය යුතු ශික්ෂා පද පනස් ආකාරයක් ඇති බව.
- පනස් ආකාර සිඛ පද දස සිල්, දස සිඛ, දස පරිජි, දස නාසනා, දස දඬුවම් වන බව.
- භික්ෂුවක් වීමට නම් මෙම පනස් ආකාර ශික්ෂා හික්ම විය යුතු බව.
- දුරවබෝධ වචනවල අර්ථය අභ්‍යාස පොතෙහි සටහන් කර ගැනීමට උපදෙස් දෙන්න.
- දුරවබෝධ වචන එකතු කර පොත් පිංචක් සැකසීමට උපදෙස් දෙන්න.
- ජාතක කථාව පැහැදිලි කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
- තක්සේරුකරණ නිර්ණායක ගුරුවරයා විසින් කියවා මැනවින් අවබෝධ කර ගෙන එම නිර්ණායකවලට අදාළව ශිෂ්‍යයන් තක්සේරුකරණය කරන්න.
- අපේක්ෂිත සාධන මට්ටම්වලට ළඟා නොවූ සිසුන් වේ නම් ඒ සඳහා සුදුසු ප්‍රතිපෝෂණ ක්‍රියාවලියක නිරත කරවන්න.
- "සබ්බදා සීලසම්පන්නො" යන පාදය ඇතුළත් ගාථාව කටපාඩම් කිරීමට උපදෙස් දෙන්න.

**මූලික වදන් හා සංකල්පඃ-**

- "සාමණේර" යනු ශ්‍රමණ පුත්‍රයා වන බව.
- "සාමණේර අවධිය" යනු භික්ෂූන් වහන්සේ නමක් වීමට පුහුණු වන කාලය බව.
- "දස සිල්" යනු සාමණේර දස සීලය බව.
- "දස සිඛ" යනු දස සිල්ම හික්ම විය යුතු බව පැහැදිලි කරන්න.
- "දස පරිජි" යනු දස පාරාජිකා බවත් ඒවා බිඳීමෙන් සාමණේරභාවය අහෝසි වන බව.
- "දස නාසනා" යනු දස පරිජිම දස නාසනා වන බව.
- දස නාසනා කොටස් දෙකක් වන බව.
- පහක් ලිඞ්ගනාසනා වන බවත් පහක් සබ්බනාසනා වන බව.
- "දස දඬුවම්වත්" යනු දඬුවම් දසයක් බව.
- "ලිංග" යනු ශ්‍රමණ වේශය හෙවත් පැවිදි ස්වරූපය බව.
- "නාසානා" යනු අහෝසි වීම බවත් එවිට සිවුරු හැරවීම හෙවත් උපැවිදි වීම සිදු කළ යුතු බව.
- සාමණේරයන් වහන්සේලා සමග මෙම ශික්ෂාපද පිළිබඳ සාකච්ඡා කරන්න.

**ගුණාත්මක යෙදවුම්ඃ-**

ඇමුණුම 01

- සාමණේර ස්වාමීන් වහන්සේලා මනා සංවරව නිවැරදි වතාවත්වල යෙදී සිටිනවා දැක්වෙන පුවරුවක්
- ගුරුමාර්ගෝපදේශය
- පෙළපොතේ විසිපස්වන පාඩම

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා**

- පහත සඳහන් නිර්ණායක යොදා ගන්න.
- ශික්ෂා පද නිවැරදිව සජ්ඣායනය කිරීම හා කටපාඩමින් කීම
- ශික්ෂා පදවල අර්ථය සරලව පැහැදිලි කිරීම
- ශික්ෂා පද පැහැදිලිව, සරලව මතකයෙන් ඉදිරිපත් කිරීම.
- ශික්ෂා පද පිළිබඳව හැඳින්වීමක් හෝ කතාවක් ඉදිරිපත් කිරීම.

**වැඩිදුර පරිශීලනයට:-**

ඇමුණුම 01 (ප්‍රවේශය සඳහා)

- හෙරණසිඛ පොත
- හෙරණසිඛ විනිස - ප්‍රාචීන භාෂෝපකාර සමාගම
- විනය පිටකය - බුද්ධ ජයන්ති ත්‍රිපිටක මුද්‍රණය
- සාමණේර බණ දහම් පොත - බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, නැදිමාල, දෙහිවල

# 26 පාඩම
## වලාකුළෙන් මිදෙන හෙරණ සඳ - බාලසික්ඛා

**නිපුණතාව:- 3.0**

- බෞද්ධ විනය හා ශික්ෂණය පිළිබඳ දැනුම වර්ධනය කර භික්ෂු ජීවිතය හැඩගස්වා ගනියි.

**නිපුණතා මට්ටම:- 3.2**

- මූලික ශික්ෂා පද ආරක්ෂා කර ගැනීමට අදාළ බෞද්ධ ඉගැන්වීම් අනුගමනය කරයි.

**කාලපරිච්ඡේද:-** 11 යි

**ඉගෙනුම් පල:-**

1. භික්ෂුවකගේ වත් පිළිවෙත් මොනවාදැයි දැනගනියි.
2. භික්ෂූන් වහන්සේ නිති වත් පිළිවෙත්හි යෙදිය යුතු බව පිළිගනිමින් කටයුතු කරයි.
3. භික්ෂූන් වහන්සේගේ දෛනික වත පිළිවෙත යන මැයෙන් ධර්ම දේශනාවක් පවත්වයි. වතාවතෙහි යෙදෙයි.
4. සාර්ථක භික්ෂු ජීවිතයක් ගත කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්:-**

**I** පෙර සූදානම,

- වලාකුළෙන් මිදෙන හෙරණ සඳ (බාල සික්ඛා) දැක්වෙන පෙළ පොතෙහි 26 වන පාඩම හොඳින් කියවා පැමිණෙන ලෙස පෙර දිනයේ ශිෂ්‍යයන්ට දැනුවත් කරන්න. එහි සඳහන් "අත්තානං උපමං කත්වා" යන ගාථාව කටපාඩම් කරගෙන එන ලෙස පවසන්න.

**II** ප්‍රවේශය

- ඇමුණුම 01 හි සඳහන් සාමණේර ස්වාමීන් වහන්සේලා මනා සංවරව වතාවත්වල යෙදී සිටිනවා දැක්වෙන ඡායාරූපය ප්‍රදර්ශනය කරමින් උන්වහන්සේලාගේ හැදියාව පිළිබඳ සාකච්ඡාවක් මෙහෙය වන්න. සාකච්ඡාව තුළින් සංවරය ඇති වන බව ඉස්මතු කරන්න.

**පාඩම් සංවර්ධනය:-**

- "බාලසික්ඛා" නම් ග්‍රන්ථය සාමණේරයන් වහන්සේලා හික්මවීම සඳහා ම ලියවුණු ග්‍රන්ථයක් බව සාකච්ඡා කරන්න.
- "බාලසික්ඛා" නම් ග්‍රන්ථය විනය පිටකය ඇසුරු කර ගෙන ලියවුණු බව පැහැදිලි කරන්න.
- අතීතයේ සිට වර්තමානය දක්වා සාමණේර විනය ග්‍රන්ථයක් ලෙස එය භාවිතයට ගෙන ඇති බව අවධාරණය කරන්න.

- හෙරණසිඛ සීලය මෙම ග්‍රන්ථය තුළ විවරණය කර ඇති බව පැහැදිලි කරන්න.
- සාමණේර නමක් අනිවාර්යයෙන් ම පුහුණු විය යුතු අංශ තුන දස සීලය, වත පිළිවෙත හා සේඛියා වන බව සාකච්ඡා කරන්න.
- විනය පිටකයට අයත් මහාවග්ගපාළියේ සාමණේරයන් හික්ම විය යුතු ශික්‍ෂා පද ඇතුළත් වන බව පැහැදිලි කරන්න.
- සාමණේරයන් වහන්සේලා හික්මවිය යුතු ශික්‍ෂා පද පනස් ආකාරයක් ඇති බව තහවුරු කරන්න.
- සාමණේර බණ දහම් පොතට මෙහි කරුණු ඇතුලත් කර ඇති බව පෙන්වා දෙන්න.
- දුරවබෝධ වචනවල අර්ථය අභ්‍යාස පොතෙහි සටහන් කර ගැනීමට උපදෙස් දෙන්න.
- දුරවබෝධ වචන එකතු කර පොත් පිංචක් සැකසීමට උපදෙස් දෙන්න.
- බාල සික්ඛා ඇතුළත් ගාථා කටපාඩම් කිරීමට උපදෙස් දෙන්න.
- බාලසික්ඛා ගාථා පැහැදිලි කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
- තක්සේරුකරණ නිර්ණායක ගුරුවරයා විසින් කියවා මැනවින් අවබෝධ කර ගෙන එම නිර්ණායකවලට අදාළව ශිෂ්‍යයන් තක්සේරුකරණය කරන්න.
- අපේක්ෂිත සාධන මට්ටම්වලට ළඟා නොවූ සිසුන් වේ නම් ඒ සඳහා සුදුසු ප්‍රතිපෝෂණ ක්‍රියාවලියක නිරත කරවන්න.

### මූලික වදන් හා සංකල්පඃ-

- සාමණේර බණ දහම් පොත යනු සාමණේර භික්ෂූන් වහන්සේලාගේ ජීවන පැවැත්ම සඳහා උපදෙස් සපයන ග්‍රන්ථයක් බව.
- හෙරණසිඛ යනු පැවිදි උතුමන්ගේ සීලය බව.

### ගුණාත්මක යෙදවුම්ඃ-

ඇමුණුම 01

- සාමණේර ස්වාමීන් වහන්සේලා මනා සංවරව වතාවත්වල යෙදී සිටිනවා දැක්වෙන සිතුවම් පුවරුවක්
- පෙළ පොත හා ගුරුමාර්ගෝපදේශය

### ඇගයීම් හා තක්සේරුකරණය සඳහා නිර්ණායකඃ-

පහත සඳහන් නිර්ණායක යොදා ගන්න.

- ගාථා නිවැරදිව සජ්ඣායනය කිරීම හා කටපාඩමින් කීම.
- ගාථාවල අර්ථය සරලව පැහැදිලි කිරීම.
- ගාථාවල අර්ථ පැහැදිලිව, සරලව මතකයෙන් ඉදිරිපත් කිරීම.
- වතාවත් පිළිබඳව හැඳින්වීමක් හෝ කතාවක් ඉදිරිපත් කිරීම.

### වැඩිදුර පරිශීලනයටඃ-

ඇමුණුම 01 (ප්‍රවේශය සඳහා)

- හෙරණසිඛ පොත
- හෙරණසිඛ විනිස - ප්‍රාචීන භාෂෝපකාර සමාගම
- විනය පිටකය - බුද්ධ ජයන්ති ත්‍රිපිටක මුද්‍රණය
- සාමණේර බණ දහම් පොත - බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, නැදිමාල, දෙහිවල.

# 27 පාඩම
## සැලසුම්කරගෙන දවස ගෙවමු (දින චරියාව)

**නිපුණතාව:- 3.0**

- බෞද්ධ විනය හා ශික්ෂණය පිළිබඳ දැනුම වර්ධනය කර භික්ෂු ජීවිතය හැඩගස්වා ගනියි.

**නිපුණතා මට්ටම:- 3.0**

- මූලික ශික්ෂා පද ආරක්ෂා කර ගැනීමට අදාළ බෞද්ධ ඉගැන්වීම් අනුගමනය කරයි.

**කාලපරිච්ඡේද:-** 06 යි

**ඉගෙනුම් පල:-**

1. දින චරියාවෙහි අරුත පැහැදිලි කර ගනියි.
2. කාල කළමනාකරණයෙන් ක්‍රියා කළයුතු බව පිළිගෙන කටයුතු කරයි.
3. පැරණි පැවිදි උතුමන්ගේ දින චරියාව ලේඛන ගත කරයි.
4. අර්ථාන්විත දින චරියාවෙහි යෙදෙයි.
5. කාල කළමනාකරණයෙන් කටයුතු කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්:-**

**I** පෙර සූදානම,

- සැලසුම් කරගෙන දවස ගෙවමු ( දින චරියාව ) දැක්වෙන පෙළ පොතෙහි 27 වන පාඩම හොඳින් කියවා පැමිණෙන ලෙස පෙර දිනයේ ශිෂ්‍යයන්ව දැනුවත් කරන්න. එහි සඳහන් "තස්ස පාසාදිකං හොති" යන ගාථාව කටපාඩම් කරගෙන එන ලෙස පවසන්න.

**II** ප්‍රවේශය

- ඇමුණුම 01 හි සඳහන් "අරුණට පළමුව දැහැටි වළඳා" යන පාඨය ලියන ලද පුවරුව ප්‍රදර්ශනය කරමින් එහි අරුත ඉර උදාවට ප්‍රථම දත් මැද දවසේ චර්යාවන් (දින චර්යාව) ආරම්භ වන බව සිහිගන්වමින් සිසුන් සමඟ සාකච්ඡාව මෙහෙය වන්න.

**පාඩම් සංවර්ධනය:-**

- බුදු රජාණන් වහන්සේ කාල කළමනාකරණයෙන් කටයුතු කළ බව සාකච්ඡා කරන්න.
- බුදු රජාණන් වහන්සේ ද දින චරියාවට අනුව කටයුතු කළ බව පැහැදිලි කරන්න.
- අතීතයේ ද පැවිදි උතුමන් කාල කළමනාකරණයෙන් කටයුතු කළ බව සාකච්ඡා කරන්න.
- භික්ෂුව ද කාල කළමනාකරණයෙන් කටයුතු කළ යුතු බව අවධාරණය කරන්න.
- දින චරියාව කාල කළමනාකරණයට හොඳම නිදසුන බව පැහැදිලි කරන්න.
- වර්තමානයේ කාලසටහන යනුවෙන් ව්‍යවහාර කරන්නේ දින චරියාවට බව පහදා දෙන්න.

- දින චරියාවට අනුව කටයුතු කිරීමෙන් වැඩ අතපසු නොවී නියම වේලාවට කළ හැකි බව සාකච්ඡාවට බඳුන් කරන්න.
- වෙලාවට වැඩ කිරීම හැමදෙනාම අගය කරන බව පහදන්න.
- දුරවබෝධ වචනවල අර්ථය අභ්‍යාස පොතෙහි සටහන් කර ගැනීමට උපදෙස් දෙන්න.
- දුරවබෝධ වචන එකතු කර පොත් පිංචක් සැකසීමට උපදෙස් දෙන්න.
- දින චරියාව ඇතුළත් පාඨය කටපාඩම් කිරීමට උපදෙස් දෙන්න.
- දින චරියාව පැහැදිලි කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
- තක්සේරුකරණ නිර්ණායක ගුරුවරයා විසින් කියවා මැනවින් අවබෝධ කර ගෙන එම නිර්ණායකවලට අදාළව ශිෂ්‍යයන් තක්සේරුකරණය කරන්න.
- අපේක්ෂිත සාධන මට්ටම්වලට ළඟා නොවූ සිසුන් වේ නම් ඒ සඳහා සුදුසු ප්‍රතිපෝෂණ ක්‍රියාවලියක නිරත කරවන්න.

## මූලික වදන් හා සංකල්පඃ-

- "සඟල සිවුර" තුන් සිවුරට අයත් දෙපට සිවුර චීවරයකි.
- "පස් විකුම්" - ප්‍රත්‍යවේක්ෂාව
- "බොජුන් හළ" - දානශාලාව.
- "අරුණට පළමුව" - ඉර උදාවට ප්‍රථම.

## ගුණාත්මක යෙදවුම්ඃ-

ඇමුණුම 01

- "අරුණට පළමුව දැහැටි වළඳා" යන පාඨය ලියන ලද පුවරුව
- ගුරුමාර්ගෝපදේශය
- පෙළපොතේ විසිහත්වන පාඩම

## ඇගයීම් හා තක්සේරුකරණය සඳහා නිර්ණායකඃ-

පහත සඳහන් නිර්ණායක යොදා ගන්න.

- දින චරියාව නිවැරදිව සජ්ඣායනය කිරීම හා කටපාඩමින් කීම.
- දින චරියාවෙහි අර්ථය සරලව මතකයෙන් පැහැදිලි කිරීම.
- කාල කළමනාකරණය පැහැදිලි කිරීම.
- බුදුරජාණන් වහන්සේගේ දින චරියාව පැහැදිලි කිරීම.

## වැඩිදුර පරිශීලනයටඃ-

**ඇමුණුම 01 (ප්‍රවේශය සඳහා)**

- හෙරණසිඛ පොත
- හෙරණසිඛ විනිස - ප්‍රාචීන භාෂෝපකාර සමාගම
- විනය පිටකය - බුද්ධ ජයන්ති ත්‍රිපිටක මුද්‍රණය
- සාමණේර බණ දහම් පොත - බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, නැදිමාල, දෙහිවල.

# 28 පාඩම
# බුදුගුණ මෙනෙහි කොට ශ්‍රද්ධාව උපදවා ගනිමු

**නිපුණතාව:- 6.0**

- බෞද්ධ භාවනාවේ මූලිකාංග ප්‍රගුණ කරමින් කරමින් යථාවබෝධය පිණිස භාවනාවේ යෙදෙයි.

**නිපුණතා මට්ටම:- 6.1**

- බුද්ධානුස්සති භාවනාව හා මෙත්තානුස්සති භාවනාව ප්‍රගුණ කරයි.

**කාලපරිච්ඡේද:-** 09 යි

**ඉගෙනුම් පල:-**

1. බුද්ධානුස්සති භාවනාව හඳුනා ගනියි.
2. භාවනාව තුළින් සිත පිරිසිදු වන බව පිළිගනියි.
3. බුද්ධානුස්සති භාවනාව වඩයි.
4. සන්සුන් සිතින් කටයුතු කරයි.
5. බවුන් වඩයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්:-**

**I** පෙර සූදානම,

- බුදු ගුණ මෙනෙහි කොට ශ්‍රද්ධාව උපදවා ගනිමු යනුවෙන් දැක්වෙන පෙළ පොතෙහි 28 වන පාඩම හොඳින් කියවා පැමිණෙන ලෙස පෙර දිනයේ ශිෂ්‍යයන්ව දැනුම්වත් කරන්න. බුදු ගුණ දැක්වෙන "ඉතිපිසෝ භගවා අරහං"යන පාලි පාඨය කටපාඩම් කරගෙන එන ලෙස පවසන්න.

**II** ප්‍රවේශය

- ඇමුණුම 01 හි සඳහන් භික්ෂූන් වහන්සේ නමක් භාවනා කරන ආකාරය දැක්වෙන ඡායාරූපයක් ප්‍රදර්ශනය කරමින් භාවනාව පිළිබඳ විස්තර කරන්න.
- මෙම ඡායාරූපයෙන් පැහැදිලි වන්නේ භික්ෂූන් වහන්සේ නමක් භාවනා කරන බවත් අප ද භාවනා කළ යුතුය යන අදහස ඉස්මතුකර කරමින් භාවනා කිරීමේ ඇති වැදගත්කම දැන ගැනීමට සිසුන්ව මෙහෙයවන්න.

**පාඩම් සංවර්ධනය:-**

- බුදු රජාණන් වහන්සේට බුදු වීමට ද භාවනාව උපකාරි වූ බව.
- බෞද්ධ භාවනාව සමථ හා විදර්ශනා යනුවෙන් ක්‍රම දෙකක් ඇති බව.
- බුද්ධානුස්සති භාවනාව සමථ භාවනාවට අයත් වන බව.
- අපගේ සිත දියෙන් ගොඩ දමන ලද මාළුවකු සේ ස්වභාවයෙන්ම නොසන්සුන් ව පවතින බව.

- අපගේ සිත වඳුරන් සහ රිලවුන් මෙන් නිතරම එහෙමෙහෙ දුවන, පනින  බව.
- බුද්ධානුස්සති භාවනාව වැඩීමෙන් අපගේ සිත සන්සුන් වන බව.
- විශේෂයෙන් ගිහියන්ට වඩා වචනයෙන්, හැසිරීමෙන් පැවිදි උතුමෝ සංවර විය යුතු බව
- භික්ෂුව අන් අයට හිරිහැර වන ලෙස කටයුතු නොකළ යුතු බව.
- අපගේ සිත සන්සුන් කර ගැනීමට බුදුරජාණන් වහන්සේ භාවනා ක්‍රම හතළිහක් දේශනා කර ඇති බව.
- එම භාවනා ක්‍රම හතලිහ කමටහන් ලෙස නම් කර ඇති බව.
- බුද්ධානුස්සති භාවනාව තුළින් කරන්නේ බුදු ගුණ මෙනෙහි කරන බව.
- බුදුරජාණන් වහන්සේ පිළිබඳ දැන ගැනීම සඳහා බුද්ධානුස්සති භාවනාව වැඩිය යුතු බව.
- අපගේ ශාස්තෘවරයා, අනුශාසකයා, ගුරුවරයා බුදු රජාණන් වහන්සේ බව.
- බුදුරජාණන් වහන්සේ පිළිබඳ විශ්වාසය හා ගෞරවය (ශ්‍රද්ධාව) ඇති කර ගත යුතු බව.
- බුද්ධානුස්සති භාවනාව වඩන ආකාරය පියවරින් පියවර පැහැදිලි කරන්න.
- දුරවබෝධ වචනවල අර්ථය අභ්‍යාස පොතෙහි සටහන් කර ගැනීමට උපදෙස් දෙන්න.
- දුරවබෝධ වචන එකතු කර පොත් පිංචක් සැකසීමට උපදෙස් දෙන්න.
- බුද්ධානුස්සති භාවනාව පිළිබඳ පැහැදිලි කරමින් සිසුන් භාවනා කිරීම සඳහා මෙහෙයවන්න.
- තක්සේරුකරණ නිර්ණායක ගුරුවරයා විසින් කියවා මැනවින් අවබෝධ කර ගෙන එම නිර්ණායකවලට අදාළව ශිෂ්‍යයන් තක්සේරුකරණය කරන්න.
- අපේක්ෂිත සාධන මට්ටම්වලට ළඟා නොවූ සිසුන් වේ නම් ඒ සඳහා සුදුසු ප්‍රතිපෝෂණ ක්‍රියාවලියක නිරත කරවන්න.
- "ඉතිපිසෝ භගවා අරහං" යන බුදු ගුණ ඇතුළත් පාලි පාඨය කටපාඩම් කිරීමට උපදෙස් දෙන්න.

**මූලික වදන් හා සංකල්පඃ-**

- "භාවනා" යනු සිත කුසල් දහම් හි වැඩීම බව.
- "සමථ" යනු සිත සන්සුන් කිරීම බව.
- "කමටහන" යනු භාවනා කිරීම සඳහා දෙන උපදෙස් බව.
- "ශ්‍රද්ධාව" යනු තුණුරුවන් පිළිබඳ විශ්වාසය හා ගෞරවය බව.
- "බුදුධානුස්සති භාවනාව" යනු බුදු ගුණ මෙනෙහි කිරීම බව.
- "පසඟ පිහිටුවා වැඳීම" යනු නළල, දෙවැලමිට, දෙදණ බිම තියා වැඳීම බව.

**ගුණාත්මක යෙදවුම්ඃ-**

ඇමුණුම 01

- භික්ෂූන් වහන්සේ නමක් භාවනා කරන ආකාරය දැක්වෙන පුවරුවක්
- ගුරුමාර්ගෝපදේශය
- පෙළපොතේ විසිඅටවන පාඩම

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා නිර්ණායකඃ-**

පහත සඳහන් නිර්ණායක යොදා ගන්න.

- පාලි පාඨ නිවැරදිව සජ්ඣායනය කිරීම හා කටපාඩමින් කීම
- පාලි පාඨවල අර්ථය සරල පැහැදිලි කිරීම
- භාවනා කරන පියවර පැහැදිලිව, සරලව මතකයෙන් ඉදිරිපත් කිරීම.
- භාවනාව පිළිබඳව හැඳින්වීමක් හෝ කතාවක් ඉදිරිපත් කිරීම.

**වැඩිදුර පරිශීලනයටඃ-**

**ඇමුණුම 01 (ප්‍රවේශය සඳහා)**

- මහා විදර්ශනා භාවනාව - රේරුකානේ චන්දවිමල හිමි
- සතිපට්ඨාන භාවනා ක්‍රමය - රේරුකානේ චන්දවිමල හිමි
- විදර්ශනා භාවනා ක්‍රමය - රේරුකානේ චන්දවිමල හිමි

# 29 පාඩම
## මෙත් වඩා සිත් වඩමු

**නිපුණතාව:- 6.0**

- බෞද්ධ භාවනාවේ මූලිකාංග ප්‍රගුණ කරමින් කරමින් යථාබෝධය පිණිස භාවනාවේ යෙදෙයි.

**නිපුණතා මට්ටම:- 6.1**

- බුද්ධානුස්සති භාවනාව හා මෙත්තානුස්සති භාවනාව ප්‍රගුණ කරයි.

**කාලපරිච්ඡේද:-** 04 යි

**ඉගෙනුම් පල:-**

1. මෛත්‍රී භාවනාව පැහැදිලි කර ගනියි.
2. පළමුව මෙත් වැඩිය යුත්තේ තමාට බව පිළිගනියි.
3. මෛත්‍රී භාවනාවේ ආනිසංස ලැයිස්තු ගත කරයි.
4. මිතුරු සිතින් කටයුතු කරයි.
5. සැමට මෛත්‍රිය පතුරුවාලයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්:-**

**I** පෙර සූදානම,

- මෙත් වඩා සිත් වඩමු යනුවෙන් දැක්වෙන පෙළ පොතෙහි 29 වන පාඩම හොඳින් කියවා පැමිණෙන ලෙස පෙර දිනයේ ශිෂ්‍යයන්ට දැනුවත් කරන්න. බුදු ගුණ දැක්වෙන "මාතා යථා නියං පුත්තං"යන පාලි ගාථාව කටපාඩම් කරගෙන එන ලෙස පවසන්න.

**II** ප්‍රවේශය

- ඇමුණුම 01 හි සඳහන් භික්ෂූන් වහනසේ නමක් භාවනා කරන ආකාරය දැක්වෙන ඡායාරූපයක් ප්‍රදර්ශනය කරමින් හෝ පෙර දින රාත්‍රියේ දකින ලද සිහින පිළිබඳ විමසා දකින ලද නපුරු සිහිනවලට හේතුව මෛත්‍රියෙන් කටයුතු නොකරන ලද බව පවසමින් සුවසේ නිදාගැනීමට නම් මෛත්‍රී භාවනාව වැඩිය යුතු බව පිළිබඳ විස්තර කරන්න.
- මෙම ඡායාරූපයෙන් පැහැදිලි වන්නේ භික්ෂූන් වහනසේ නමක් භාවනා කරන බවත් අප ද භාවනා කළ යුතුය යන අදහස ඉස්මතුකර කරමින් භාවනා කිරීමේ ඇති වැදගත්කම දැන ගැනීමට සිසුන්ට මෙහෙයවන්න.

**පාඩම් සංවර්ධනය:-**

- බුදුරජාණන් වහන්සේට බුදු වීමට ද භාවනාව උපකාරි වූ බව.
- බෞද්ධ භාවනාව සමථ හා විදර්ශනා යනුවෙන් ක්‍රම දෙකක් ඇති බව.
- මෛත්‍රී භාවනාව සමථ භාවනාවට අයත් වන බව.

- අපගේ සිත දියෙන් ගොඩ දමන ලද මාළුවකු සේ ස්වභාවයෙන්ම නොසන්සුන් ව පවතින බව.
- අපගේ සිත වඳුරන් සහ රිලවුන් මෙන් නිතරම එහෙමෙහෙ දුවන, පනින  බව.
- මෛත්‍රී භාවනාව වැඩීමෙන් අපගේ සිත සන්සුන් වන බව.
- විශේෂයෙන් ගිහියන්ට වඩා වචනයෙන්, හැසිරීමෙන් පැවිදි උතුමන් සංවර විය යුතු බව.
- භික්ෂුව අන් අයට හිරිහැර වන ලෙස කටයුතු නොකළ යුතු බව.
- අපගේ සිත සන්සුන් කර ගැනීමට බුදුරජාණන් වහන්සේ භාවනා ක්‍රම හතළිහක් දේශනා කර ඇති බව.
- එම භාවනා ක්‍රම හතළිහ කමටහන් ලෙස නම් කර ඇති බව.
- මෛත්‍රී භාවනාව තුළින් කරන්නේ තමාට මෙන්ම අන් අයට මෛත්‍රිය කරන බව.
- අන් අයට යහපතක් කිරීම සඳහා මෛත්‍රී භාවනාව වැඩිය යුතු බව.
- අපගේ ශාස්තෘවරයා, අනුශාසකයා, ගුරුවරයා බුදු රජාණන් වහන්සේ බව.
- බුදු රජාණන් වහන්සේ පිළිබඳ විශ්වාසය හා ගෞරවය (ශ්‍රද්ධාව) ඇති කර ගත යුතු බව.
- මෛත්‍රී භාවනාව වඩන ආකාරය පියවරින් පියවර පැහැදිලි කරන්න.
- දුරවබෝධ වචනවල අර්ථය අභ්‍යාස පොතෙහි සටහන් කර ගැනීමට උපදෙස් දෙන්න.
- දුරවබෝධ වචන එකතු කර පොත් පිංචක් සැකසීමට උපදෙස් දෙන්න.
- මෛත්‍රී භාවනාව පිළිබඳ පැහැදිලි කරමින් සිසුන් භාවනා කිරීම සඳහා මෙහෙයවන්න.
- තක්සේරුකරණ නිර්ණායක ගුරුවරයා විසින් කියවා මැනවින් අවබෝධ කර ගෙන එම නිර්ණායකවලට අදාළව ශිෂ්‍යයන් තක්සේරුකරණය කරන්න.
- අපේක්ෂිත සාධන මට්ටම්වලට ළඟා නොවූ සිසුන් වේ නම් ඒ සඳහා සුදුසු ප්‍රතිපෝෂණ ක්‍රියාවලියක නිරත කරවන්න.
- මෛත්‍රී භාවනාවේ ආනිසංස පාලි පාඨය සමග කටපාඩම් කිරීමට උපදෙස් දෙන්න.

**මූලික වදන් හා සංකල්පඃ-**

- "භාවනා" යනු සිත කුසල් දහම් හි වැඩීම බව.
- "මෛත්‍රිය" යනු චෛතසික සිතුවිල්ලක් බව.
- අභිධර්මයට අනුව චෛතසික පනස් දෙකක් ඇති බව.
- "කමටහන" යනු භාවනා කිරීම සඳහා දෙන උපදෙස් බව.
- "ශ්‍රද්ධාව" යනු තුණුරුවන් පිළිබඳ විශ්වාසය හා ගෞරවය බව.
- "මෛත්‍රී භාවනාව" යනු මෙත් සිත වර්ධනය කිරීම බව.
- "පසඟ පිහිටුවා වැඳීම" යනු නළල, දෙවැලමිට, දෙදණ බිම තියා වැඳීම බව.

**ගුණාත්මක යෙදවුම්:-**

ඇමුණුම 01

- භික්ෂූන් වහන්සේ නමක් භාවනා කරන ආකාරය දැක්වෙන පුවරුවක්
- ගුරුමාර්ගෝපදේශය
- පෙළපොතේ විසිනවවන පාඩම

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා නිර්ණායක:-**

පහත සඳහන් නිර්ණායක යොදා ගන්න.

- පාලි පාඨ නිවැරදිව සජ්ඣායනය කිරීම හා කටපාඩමින් කීම
- පාලි පාඨවල අර්ථය සරල පැහැදිලි කිරීම
- භාවනා කරන පියවර පැහැදිලිව, සරලව මතකයෙන් ඉදිරිපත් කිරීම.
- භාවනාව පිළිබඳව හැදින්වීමක් හෝ කතාවක් ඉදිරිපත් කිරීම.

**වැඩිදුර පරිශීලනයට:-**

ඇමුණුම 01 (ප්‍රවේශය සඳහා)

- මහා විදර්ශනා භාවනාව - රේරුකානේ චන්ද විමල හිමි
- සතිපට්ඨාන භාවනා ක්‍රමය - රේරුකානේ චන්ද විමල හිමි
- විදර්ශනා භාවනා ක්‍රමය - රේරුකානේ චන්ද විමල හිමි

# ත්‍රිපිටක ධර්මය තක්සේරු කිරීමේ පත්‍රිකාව

පිරිවෙන්වල භාවිතය සඳහා සකස් කරන ලද මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය තුළින් නිපුණතා පාදක විෂය මාලාව හඳුන්වා දීමේ දී පාසල පදනම් කරගත් තක්සේරුකරණය පිළිබඳ මේ වන විට ඔබ මනා වැටහීමක් ලබා තිබිය යුතු ය. ඔබගේ පහසුව සඳහා මෙම ගුරු මාර්ගෝපදේශයේ ද එම විස්තර පහත දක්වා ඇත.

ඉගෙනුම, ඉගැන්වීම සහ ඇගයීම අධ්‍යාපන ක්‍රියාවලියේ වැදගත් සංරචක තුනක් බවත්, ඉගෙනුමෙහි සහ ඉගැන්වීමෙහි ප්‍රගතිය දැන ගැනීම පිණිස ඇගයීම යොදා ගත යුතු බවත්, සෑම ගුරුවරයකු විසින් ම දතයුතු පැහැදිලි කරුණකි. ඒවා අන්‍යොන්‍ය බලපෑමෙන් යුතු ව ක්‍රියා කරන බවත්, එසේම එකිනෙකෙහි සංවර්ධනය කෙරෙහි එම සංරචක බලපාන බවත්, ගුරුවරු දනිති. සන්තතික (නිරන්තරයෙන් සිදු වනඇගයීම් මූලධර්ම අනුව ඇගයීම සිදු විය යුත්තේ ඉගෙනීම හා ඉගැන්වීම කෙරෙන අතරතුර දී ය. මෙය ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය ආරම්භයේ දී හෝ මැද දී හෝ අග දී හෝ යන ඕනෑ ම අවස්ථාවක දී සිදු විය හැකි ය. එලෙස තම සිසුන්ගේ ඉගෙනුම් ප්‍රගතිය ඇගයීමට අපේක්ෂා කරන ගුරුවරයකු ඉගෙනුම් ඉගැන්වීම හා සහ ඇගයීම පිළිබඳ සංවිධානාත්මක සැලැස්මක් යොදා ගත යුතු වෙයි.

පාසල පදනම් කරගත් ඇගයීම් වැඩ පිළිවෙළ හුදු විභාග ක්‍රමයක් හෝ පරීක්ෂණ පැවැත්වීමක් නොවේ. එය හඳුන්වනු ලබන්නේ සිසුන් ගේ ඉගෙනීමත්, ගුරුවරුන් ගේ ඉගැන්වීමත්, වැඩි දියුණු කිරීම සඳහා යොදා ගනු ලබන මැදිහත් වීමක් වශයෙනි. මෙය සිසුන්ට සමීපව සිටිමින් ඔවුන්ගේ ප්‍රබලතා සහ දුබලතා හඳුනා ගෙන ඒවා දියුණු කරමින් හා පිළියම් යොදමින් සිසුන්ගේ උපරිම වර්ධනය ළඟාකර ගැනීමට යොදාගත හැකි වැඩපිළිවෙළකි.

ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාකාරකම් තුළින් අනාවරණ ක්‍රියාවලියට සිසුන් යොමු කෙරෙන අතර ගුරුවරයා සිසුන් අතර ගැවසෙමින් ඔවුන් ඉටු කරන කාර්යය නිරීක්ෂණය කරමින් මාර්ගෝපදේශකත්වය සපයමින් කටයුතු කිරීම පාසල පදනම් කර ගත් ඇගයීම් වැඩපිළිවෙළ ක්‍රියාත්මක කිරීමේ දී අපේක්ෂා කෙරේ. මෙහි දී ශිෂ්‍යයා නිරතුරු ව ඇගයීමට ලක් විය යුතු අතර ශිෂ්‍ය හැකියා සංවර්ධනය අපේක්ෂිත අන්දමින් සිදු වන්නේ දැ යි ගුරුවරයා විසින් තහවුරු කරනු ලැබිය යුතු වෙයි.

ඉගෙනීම සහ ඉගැන්වීම මගින් සිදුවිය යුත්තේ සිසුනට නිසි අත්දැකීම් ලබා දෙමින් ඒවා සිසුන් විසින් නිසි පරිදි අත්පත් කර ගෙන තිබේ දැයි තහවුරු කර ගැනීමය. ඒ සඳහා නිසි මාර්ගෝපදේශය සැපයීම ගුරුවරයාගේ කාර්යභාරයයි. ඇගයීමේ (තක්සේරු කිරීමේ) යෙදී සිටින ගුරුවරුන්ට තම සිසුන් සඳහා දෙයාකාරයක මාර්ගෝපදේශකත්වය ලබා දිය හැකිය. එම මාර්ගෝපදේශ පොදුවේ හඳුන්වන්නේ ප්‍රතිපෝෂණය (Feed Back) හා ඉදිරි පෝෂණය (feed forward) යනුවෙනි. සිසුන්ගේ දුබලතා අනාවරණය කොට ගෙන ඒවාට පිළියම් යෙදීම ප්‍රතිපෝෂණයෙන් සිදු කෙරෙන අතර, ප්‍රබලතා වැඩි දියුණු කිරීම සඳහා යම් යම් ක්‍රියාමාර්ග ගැනීම ඉදිරි පෝෂණයෙන් සිදු කෙරේ.

ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ සාර්ථකත්වය සඳහා පාඨමාලාවේ අරමුණු අතුරෙන් කවර අරමුණු කවර මට්ටමකින් සාක්ෂාත් වූයේ දැ යි අනාවරණය කර ගැනීම අවශ්‍ය වෙයි. ඇගයීම් වැඩ පිළිවෙළ ඔස්සේ සිසුන් ළඟා කරගත් ප්‍රවීණතා මට්ටම් නිශ්චය කිරීම මේ අනුව ගුරුවරුන්ගෙන් බලාපොරොත්තු වන අතර එම තත්ත්වය සිසුන්ට සන්නිවේදනය කිරීමට ගුරුවරුන් යොමු විය යුතුය. මේ සඳහා පවත්නා හොඳම ක්‍රමය වන්නේ පාසල පදනම් කර ගත් ඇගයීම් ක්‍රමයයි. යථෝක්ත අරමුණ සහිත ව ක්‍රියා කරන ගුරුවරුන් විසින් තම ඉගැන්වීම් කාර්යයත්, සිසුන්ගේ ඉගෙනුම් කාර්යයත්, කාර්යක්ෂම කිරීම පිණිස වඩාත් හොඳ කාර්යක්ෂමතාවෙන්

යුක්ත ඉගෙනුම් ඉගැන්වීම් සහ ඇගයීම් ක්‍රම යොදා ගත යුතු වෙයි. මේ සම්බන්ධයෙන් සිසුන්ට හා ගුරුවරුන්ට යොදා ගත හැකි ප්‍රවේශ පිළිබඳ ප්‍රභේද කිහිපයක් මතු දැක්වෙයි. මේවා බොහෝ කලක සිට ගුරුවරුන් වෙත විභාග දෙපාර්තමේන්තුව විසින් ද, ජාතික අධ්‍යාපන ආයතනය විසින් ද, යෝජනා කරන ලද ක්‍රමවේද වෙයි. එහෙයින් ඒවා සම්බන්ධයෙන් පාසල් පද්ධතියේ ගුරුවරුන් හොඳින් දැනුවත් වී ඇතැයි අපේක්ෂා කෙරේ.

1. පැවරුම්
2. ව්‍යාපෘති
3. සමීක්ෂණ
4. ගවේෂණ
5. නිරීක්ෂණ
6. ප්‍රදර්ශන / ඉදිරිපත් කිරීම
7. ක්ෂේත්‍ර චාරිකා
8. කෙටි ලිඛිත පරීක්ෂණ
9. ව්‍යුහගත රචනා
10. විවෘත ග්‍රන්ථ පරීක්ෂණ
11. නිර්මාණාත්මක ක්‍රියාකාරකම්
12. ශ්‍රවණ පරීක්ෂණ
13. ප්‍රායෝගික ක්‍රියාකාරකම්
14. කථනය
15. ස්ව නිර්මාණ
16. කණ්ඩායම් ක්‍රියාකාරකම්
17. සංකල්ප සිතියම
18. ද්විත්ව සටහන් ජර්නල
19. බිත්ති පුවත්පත්
20. ප්‍රශ්න විචාරාත්මක වැඩසටහන්
21. ප්‍රශ්න හා පිළිතුරු පොත්
22. විවාද
23. සාකච්ඡා මණ්ඩල
24. සම්මන්ත්‍රණ
25. ක්ෂණික කථා
26. භූමිකා රංගන

හඳුන්වා දී ඇති මෙම ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රම සෑම එකක්මත්, සෑම විෂයක් සම්බන්ධයෙන්මත්, සෑම විෂය ඒකකයකටමත්, යොදා ගත යුතු යැයි අපේක්ෂා නොකෙරේ. තම විෂයයට, විෂය ඒකකයට ගැළපෙන ප්‍රභේදයක් තෝරා ගැනීමට ගුරුවරුන් දැනුම් වත් විය යුතු ය. වග බලාගත යුතු ය. එහි දී උචිත නිර්ණායක පදනම් කරගෙන ඇගයීම් ආධාරක සකස් කොට ඇගයීම් කාර්යය සිදු කළ යුතු වේ.